# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# காணிச் சீர்திருத்த ஆணைக்குழு

# LAND REFORM COMMISSION

## *වාර්ෂික වාර්තාව*

## *ஆண்டறிக்கை*

## *ANNUAL REPORT*

## *2013*

**2013** ජනවාරි 01 සිට **2013** දෙසැම්බර් **31** දක්වා

2014 ஆம் ஆண்டு சனவரி 01 ஆந் திகதி
தொடக்கம் 2013 ஆம் ஆண்டு திசெம்பர் 31 ஆந்
திகதி வரை

From 1st of January-31 st of December 2013

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ තොරතුරු

| | |
|---|---|
| **ආයතනය** | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව |
| **අමාත්‍යාංශය** | ජනාධිපති කාර්යාලය |
| **ලිපිනය** | සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,<br>කොළඹ - 07 |
| **ඊමේල් ලිපිනය** | lrcadmin@sltnet.lk |
| **දුරකථන අංක** | 011-2694251/011-2672273 |
| **ෆැක්ස් අංක** | 011-2693438 /011-2698849 |
| **විගණකවරු** | විගණකාධිපති,<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>බත්තරමුල්ල |
| **බැංකුකරුවන්** | ලංකා බැංකුව<br>ආයතනික ශාඛාව<br>කොටුව<br><br>ජාතික ඉතිරි කිරීමේ බැංකුව<br>බොරැල්ල<br><br>රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව,<br>කොල්ලුපිටිය |



# සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික රාජ්‍ය සභාවේ අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවා දශක හතරකට වැඩි කාලයක් ගෙවී ඇති මේ මොහොතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2013 වසරේ ප්‍රගතිය ඉදිරිපත් කිරීමට ලැබීම විශාල සතුටකි.

කොමිෂන් සභාවේ නිර්මාතෘවර දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් අපේක්ෂා කළ පරිදි සුවිතරයක් අත වූ ලංකාවේ ඉඩම් වල අයිතිය එහි සැබෑ උරුමකරුවන් වූ මේ රටේ මහජනතාව අතර සාධාරණ හා ඵලදායී ලෙසත් මේ රටේ සංවර්ධන කාර්යයට දායක වන ලෙසත් ලබාදීම විවිධ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ඉතාමත් දුෂ්කර හා සංකීර්ණ කාර්යයක්ව තිබුණි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් යටතට කොමිෂන් සභාවේ අධීක්ෂණය පත්වීමෙන් පසු එම කටයුතු විධිමත් හා කඩිනම් ලෙස ඉටු කිරීමට කොමිෂමට හැකිවිය.

මහින්ද චින්තන ජාතික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ රටේ ජනතාවගේ වටිනාම සම්පත වූ ඉඩම් නිසි ලෙස පරිහරණය කිරීමට රටේ ජනතාවට ඉඩකඩ සැලසී ඇති අතර අද ජාතික සංවර්ධනය සඳහා ඍජු ලෙසම දායක වන්නට කොමිෂන් සභාව සමත්ව සිටී.

2013 වසර ඇතුලත කොමිසම අරමුණු කළ කාර්යයන්ගෙන් 80% කට ආසන්න ප්‍රමාණයක් නිම කළ හැකි වූ අතර රන්බිම ඔප්පු 3500 කට ආසන්න ප්‍රමාණයක් ජනතා අයිතියට පැවරීම, කොමිසමේ දිස්ත්‍රික් කාර්යාල හුදෙක් ඉටු කළ කාර්යයන්ගෙන් ඔබ්බට ගොස් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා යෙදවීමේ සැලසුම අනුව දිස්ත්‍රික් 4 ක ව්‍යාපෘති ඇරඹීම හා අනෙකුත් දිස්ත්‍රික්කයන්හි නව ව්‍යාපෘති අවස්ථා හඳුනා ගැනීම, සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය හා සුභ සාධනය නැංවීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම, කොමිෂන් සභාවේ ඉඩම් ලේඛනය ජනාධිපති ලේකම්තුමාගේ උපදෙස් පරිදි කොළඹ විශ්ව විද්‍යාල අධීක්ෂණය යටතේ පරිගණක ගත කිරීම ආරම්භ කිරීම වැනි වැදගත් කාර්යයන් රැසක් මේ වසර තුල ඉටු කළ හැකි විය.

කොමිෂන් සභාවේ 41 වෙනි සංවත්සරය හා දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමාගේ 30 වන ගුණසමරුවද එයට සමගාමීව රන්බිම ඔප්පු ප්‍රදානය කිරීමේ උළෙලක්ද මෙම වසරේ සංවිධානය විය.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් ප්‍රමුඛව ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමා, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා, සහ කොමිසම පිළිබඳ විමර්ශනාත්මක අවබෝධයකින් යුතු ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු ඩියු. ගුණසේකර මැතිතුමා විසින් කොමිසමේ කටයුතු කෙරේ දක්වන උනන්දුව හා සහයෝගයද කොමිසම මෙතෙක් අත්කර ගත් සාර්ථකත්වයට ඉඳුරාම හේතු වූ බව සඳහන් කරනු කැමැත්තෙමි. එම සහාය පිළිබඳ මාගේ කෘතවේදීත්වය දක්වන්නට ද කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමට මට සහාය වන විධායක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයට ස්තූතිය පුද කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

නීතිඥ නිමල් ජී. පුංචිහේවා
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව



# <u>විධායක අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය</u>

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2013 වසරේ ප්‍රගතිය සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විධායක අධ්‍යක්ෂවරයා හැටියට මම ඉමහත් සතුටට පත්වෙමි.

හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමන් සමග එක්ව 1972 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව දේශයට  දායාද කරන්නට දායක වූ යුග පුරුෂයන් අතර ද සිටි අතිගරු ජනාධිපති තුමා අද එහි අධීක්ෂණය හා මග පෙන්වීම සිදුකරන නියමුවානන් බවට පත්ව සිටී.

2013 වසර හා සළකා බලන විට පෙර වර්ෂයන්ට සාපේක්ෂව කොමිෂන් සභාව මෙරට ජාතික ආර්ථික දේහය තුල වඩ වඩාත් කැපී පෙනෙන ආයතනයක් බවට පත්ව තිබීම අප සැමගේ සතුටට හේතුවකි.

කොමිෂන් සභාව සතු ඉඩම් විවිධ සංවර්ධන කාර්යයන් සඳහා ද ව්‍යාපෘතීන් සඳහා ද යෙදවීමේදී ගරු සභාපතිතුමන්ට සෘජුවම මග පෙන්වමින් අතිගරු ජනාධිපතිතුමන් තම ඓතිහාසික කාර්යය භාරයේ වගකීම අතික්‍රමණය කරමින් සිටීම අප මෙතෙක් ලැබූ සාර්ථකත්වයේ පදනම බව කිව හැකිය.

මහින්ද චින්තනයේ පරමාර්ථය වූ මෙරට ආසියාවේ ආශ්චර්යය කරා ගෙන යන ගමනේදී කොමිෂන් සභාව සතු ඉඩම් විධිමත්ව හා ඵලදායී ලෙස එම අරමුණු සඳහා යොදවන්නට කොමිෂන් සභාව 2013 වසර තුල සිදුකළ කටයුතු බොහොමයක් සාර්ථක වූ බව කියනු කැමැත්තෙමි. අතිගරු ජනාධිපතිතුමන් ජනාධිපති ලේකම්තුමන් ඇතුළු පරමාදර්ශී දේශපාලන නායකත්වයද ගරු සභාපතිතුමන්ගේ අප්‍රතිහත කැපවීම හා ධෛර්ය ද නිසා කොමිෂන් සභාවේ කටයුතු ඉතාමත් ප්‍රශස්ත මට්ටමකට ගෙන එන්නට මේ වසර තුල හැකි වූයේ යැයි සිතමි.

කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියළු නිලධාරින් එම කාර්යයන්හි හිමිකරුවන් ලෙස මගේ ගෞරවයට ලක් වේ.

නිතිඥ හරිගුප්ත රෝහණධීර<br>
විධායක අධ්‍යක්ෂ<br>
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# bvï m;ixi lrK fldñIk iNdj

## jd¾Il jd¾;dj ) 2013

mgqk mgqwxl


| | | |
|---|---|---|
| 1' | ye|kùu | 01 |
| 2' | bvï m;ixi lrK fldñIk iNdfõ ld¾h uKav,h | 14 |
| 3' | ixúOdk ie,eiau | 16 |
| 4' | ld¾h idOkh | 47 |
| 5' | wjika .Kqï jd¾;dj | 50 |
| 6' | ú.Kldêm; jd¾;dj | 63 |
| 7' | ú.Kldêm; jd¾;djg m<;=r | 92 |
| 8' | ú.Kk ydl l<uKdlrK lñgq jd¾;dj | |

# හැඳින්වීම

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට 1972 දක්වා විහිදී යන ඉතිහාසයක් ඇත.

අවුරුදු 35 ක් පුරා කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙය වන ලදි. ඉඩම්හිමියන්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජනවලට යෙදවීම, කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම, සේවක මණ්ඩල පුහුණුව සහ සුභසාධනය ප්‍රධාන ප්‍රමුඛතාවයන් වේ.

2005 වර්ෂයේ පැවැත්වූ ජනාධිපතිවරණයෙන් පසුව අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්තිවලට අනුව ඉඩම් කැබලි ලක්ෂයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිෂන් සභාවේ කටයුතු මෙහෙයවන ලදී.

තවද, මෙම වසර තුළ ආයතනයේ සේවක සේවිකාවන්ගේ වැටුප් වැඩිවීමද සිදුවූ අතර, රැකියා සුරක්ෂිතභාවයක් ඇති කරමින් නව ජීවයක් ලබාදීමේ වැඩසටහනක් දියත් කිරීම අරඹන ලදී.

2013 වසර තුළ පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගනු ලැබිණ.

i. කොමිෂන් සභාව සතු හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.

ii. ඵලදායී නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම.

iii. 2002-2004 කාලය නීත්‍යානුකූල නොවන ලෙස ලබාදුන් ඉඩම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කර. එකී ඉඩම් ආපසු පවරා ගෙන ඵලදායී ආයෝජන සඳහා යෙදවීම.

iv. ඉඩම් කැබලි ලක්ෂයක් බෙදාදීමේ වැඩපිළිවෙළ යටතේ කොමිෂන් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා තිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කර තිබූ වැඩසටහනට නව මුහුණුවරක්දී ජාතික කර්තව්‍යයක් ලෙස රන්බිම ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම.

v. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන.

(අ) රණවිරු සේවා අධිකාරිය

(ආ) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම.

(ඇ) රාජ්‍ය ආයතනවලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම.

(ඇ) බදු පදනම මත පුද්ගලයින්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම.

(උ) කළුගල් බදුදීම හා ඊට අදාළ ආදායම් රැස්කිරීම.

(ඌ) මැණික් ඉඩම්වලට අදාළව නව රෙගුලාසි පනවා ආදායම් රැස්කිරීම.

(එ) සිලිකා, ඩොලමයිට් වැලි ආදි ඛනිජ ද්‍රව්‍ය ඇති ඉඩම්වලින් ආදායම් ලබා ගැනීම.

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්යමණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරීන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියලුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුළු පැවැත්වීමද ආරම්භ කරන ලදි. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනයට අනුව හා රජයේ ප්‍රතිපත්තිවලට අදාළව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය මෙහෙයවීමට හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම ඉතා කාලෝචිත පියවරක් ලෙස ජනාධිපති ලේකම්තුමා සමග නිරතුරුවම සාකච්ඡා පවත්වා අවශ්‍ය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීමෙන් පසු, පසු විපරම් කිරීමද සිදුවිය. තවද, මහජනයාගේ විවිධ ගැටලු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කළ කමිටු මගින් සෘජු සාකච්ඡාවන් පවත්වා කඩිනම් තීරණ ගැනීමද සිදුවිය.

මීට අමතරව ඵලදායි ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම ඇති උපදේශක කමිටුවේ නිර්දේශය මත ක්‍රියා කිරීම ආරම්භ කරන ලදී.

තවද, අතිගරු ජනාධිපතිතුමන්ගේ සහ ජනාධිපති ලේකම්තුමන්ගේ උපදෙස් සහ මගපෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් පවරා ගත් අක්කර දසලක්ෂයක් වූ ඉඩම් අතුරෙන් කොමිෂන් සභාව සතු ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.

මෙම වැඩපිළිවෙළ මගින් ආයතනයෙන් ගිලිහී ගිය සම්පත්වලින් ආයතනයේ ප්‍රගතිය පමණක් නොව රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම ද සිදු කරන ලදී.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරිමයට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායීතාවය ඉහළ නංවමින්ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින්ද ඉඩම් උපරිමය කාලානුරූපව බලාත්මක කරමින්ද නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතුවල ආයෝජනය කරමින්ද අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කළ හැකි ඉඩම් සංචිතයක් පවත්වාගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස දායකවීම.

# අරමුණු

01. ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම

   i. ප්‍රකාශිත එහෙත් හඳුනා නොගත් ඉඩම් හඳුනා ගැනීම.
   ii. මහජනතාව වෙතින් ලැබෙන තොරතුරු අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් හඳුනා ගැනීම.
   iii. පැවරීම් කළද එම කාර්යය ඉටු නොවන්නේ නම්, එම ඉඩම් කොමිෂන් සභාව සතු කර ගැනීම.

02. කොමිෂන් සභාව වෙත පැවරුණු ඉඩම් පිළිබඳ

   i. ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නිශ්චය හා නීතිමය බැඳීම් නිදහස් කිරීම.
   ii. උපරිමයට වැඩි ඉඩම් කොමිෂන් සභාව වෙත පවරා ගැනීම.
   iii. පවරාගත් ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවීම.
   iv. ප්‍රකාශ කරන ලද එහෙත් ප්‍රකාශ නොවන අයගේ ඉඩම් ආපසු ලබාදීම යන කාර්යයන් කිරීම

03. රටේ ආර්ථිකය-සමාජ සංවර්ධනය උදෙසා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ හා පනතේ ප්‍රතිපාදන අනුව පවරා ගනු ලැබූ ඉඩම් ඵලදායී ලෙස ආයෝජන කාර්යයන්හි යෙදවීම.

04. කොමිෂන් සභාව සතු ඉඩම්වලින් ලැබිය යුතු ආදායම් රැස් කිරීම හා එයින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය ලබාදීම.

# කාර්යයන්

- ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම.
- උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.
- පනත්වලින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.
- කොමිෂන් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.
- පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.
- ඉඩම් ලේඛන යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් පිළිබඳ තොරතුරු ඒකරාශී කිරීම.
    i. ප්‍රකාශ කර ඇති නමුත් හඳුනාගෙන නොමැති ඉඩම්
    ii. උපරිමයට වැඩි ප්‍රකාශ නොකරන ලද ඉඩම්
    iii. පවරාදි ඇති නමුත් ඵලදායී ආයෝජනයක් නොකරන ලද ඉඩම්
- රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.
    i. ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.
    ii. කෘෂිකාර්මික ව්‍යාපෘති සහ වගා කටයුතු සඳහා ඉඩම් ලබාදීම.
    iii. කර්මාන්ත සඳහා ඉඩම් ලබාදීම.
- රටේ සමාජ සංවර්ධනයට දායකත්වය ලබාදීම
    i. ඉඩම් නොමැති ජනතාවට නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම.
    ii. රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ගනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.
    iii. ආගමික සිද්ධස්ථාන සඳහා ඉඩම් ලබාදීම
    iv. ජනතාව වෙනුවෙන් පොදු කටයුතු සඳහා ඉඩම් ලබාදීම.
    v. රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉඩම් ලබාදීම.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

- ❖ ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
    - i හුමියේ ඇති සම්පත්වලින් ආදායම් රැස් කිරීම.
    - ii බදු පදනම මත ඉඩම් පැවරුම් කර බදු ආදායම් රැස් කිරීම.
    - iii රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන, හා පුද්ගලයින්ගේ ලැබිය යුතු මුදල් අය කර ගැනීම.
- ❖ ආයතනයේ සංවිධාන ව්‍යුහය ව්‍යුහගත කිරීම
    - i. පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම.
    - ii. විධිමත් රාජකාරි පැවරුමක් කිරීම.
    - iii. බලතල විමධ්‍යගත කරමින් රාජකාරි පැවරුමක් කිරීම.
    - iv. සාකච්ජා, වැඩමුළු, පුහුණුවීම් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීම.
- ❖ ආයතනයේ කාර්යක්ෂම ඵලදායිතාවයක් ඇති කරලීමට භෞතික සම්පත් සම්පාදනය හා අවශ්‍ය පහසුකම් සලසාදීම.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## කාර්යභාරය

පනතේ විධිවිධානයන්ට අනුව පැවරී ඇති කාර්යභාරයට අමතරව වරින්වර රජයන් මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිසා මෙම කාර්යභාරය පුළුල් විෂයයන් තුළ ක්‍රියාවට නැංවීමට සිදුව ඇත.

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

## නීතිමය බලය හා කාර්යයන්ද පිළිබඳ පනත්

1. **1972** අංක **1** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
2. **1975** අංක **39** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
3. **1981** අංක **14** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
4. **1981** අංක **39** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
5. **1986** අංක **14** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ ( විශේෂ විධිවිධාන ) පනත
6. **1986** අංක **18** දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත

අංක (1) හා (2) පනත් අනුව

| | | |
|---|---|---|
| I. | දේශීය ප්‍රකාශකයින්ගෙන් | - අක්කර **563"449** |
| II. | රත් පවුම් සමාගම්වලින් | - අක්කර **195"644** |
| III. | රුපියල් සමාගම්වලින් | - අක්කර **228"813** |

වශයෙන් අක්කර **987"906** ක් ඉඩම් ප්‍රතිසංසක්රණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක **1** හා **2** පනත් සම්බන්ධව

| | | |
|---|---|---|
| I. | සංශෝධනයන් | - අංක **3** හා **6** පනත් වලින්ද |
| II. | විධිවිධානයන් | - අංක 4, **5** හා **6** පනත් වලින්ද සලසා ඇත. |

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංයුතිය මෙසේය.**

1. ගරු විෂයභාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන -සභාපතිතුමා
2. ගරු විෂයභාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින් -05
3. නිල බලයෙන් පත්වන සාමාජිකයින් -03

**කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමේලා උපයෝගී කරගනු ලබනුයේ මෙම කොමිෂන් සභා මණ්ඩලය මගින් ගනු ලබන තීරණ හා අනුමැතියන් වන අතර, එක් එක් කාර්යයට කොමිෂන් සභා මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2013.12.31 දින දක්වා කොමිෂන් සභා මණ්ඩල රැස්වීම් 651 ක් පවත්වා ඇත.**

## පනතේ 45 (1) අ වගන්තිය යටතේ පත් කරන ලද සභාපති

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පත් වූ දිනය හා සාමාජිකත්වය දැරූ කාල සීමාව | කාර්යාලයීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 01 | නීතිඥ නිමල් පී. පුංචිහේවා මහතා | සභාපති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2008.03.12 සිට මේ දක්වා | සී 82, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 | 011- 2698798 |

## පනතේ 45 (1) ආ වගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයින්

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පත් වූ දිනය හා සාමාජිකත්වය දැරූ කාල සීමාව | කාර්යාලයීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 01 | නීතිඥ හරිගුප්ත රෝහණධීර මහතා | විධායක අධ්‍යක්ෂ | 2008.06.04 සිට මේ දක්වා | සී 82 හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 | 011-2693967 |
| 02 | එම්.අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ | 2012.11.23 දින සිට මේ දක්වා | ජාතික අයවැය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය, කොළඹ 01. | 011-2484500 |
| | එස්.ආර්.ඩබ්.එම්.පී සත්කුමාර මහතා | අධ්‍යක්ෂ | 2012.11.23 දින සිට මේ දක්වා | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 071-5320029 |
| 03 | පී.එල්.යූ. දිසානායක මහතා | අතිරේක ලේකම් | 2009.10.21 දින සිට 2013.04.30 දින දක්වා | වැවිලි කර්මාන්ත අමාත්‍යංශය, 55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02 | 011-2438707 |
| | යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා | අතිරේක ලේකම් | 2013.09.01 සිට මේ දක්වා | වැවිලි කර්මාන්ත අමාත්‍යංශය, 55/75, වොක්ස්හෝල් පටුමග, කොළඹ 02 | |
| 04 | පී.ඩබ්. සේනාරත්න මහතා | උපදේශක | 2007..01.01 දින සිට මේ දක්වා | මිලෝදා ආයතනය, ඕල්කට් මාවත, කොළඹ - 11 | 071-4450080 |

## පනතේ 45 (1) ඇ වගන්තිය යටතේ නිල බලයෙන් පත්වන සාමාජිකයින්

| අනු අංකය | නම | නිත්‍ය තනතුර | පත් වූ දිනය හා සාමාජිකත්වය දැරූ කාල සීමාව | කාර්යාලයීය ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|---|
| 01 | ආර්.පී.ආර්. රාජපක්ෂ මයා | ඉඩම් කොමසාරිස් ජනරාල් | 2010.08.19 දින සිට මේ දක්වා | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල | 011-2866172 |
| 02 | එම්.ජේ.එස්. වීරසිංහ මහතා | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | 2012.05.24 දින සිට මේ දක්වා | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 | 011 -2672712 |
| 03 | කේ.ජී. ශ්‍රියාපාල මහතා | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්. | 2012.06.25 දින සිට මේ දක්වා | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නොරුව, පේරාදෙණිය. | 081-2388331 |

# භෞතික සම්පත් කළමනාකරණය

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුළ සිදු වූ වෙනස්කම් | | | | වසර අවසානයේ පැවති තත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | විකිණීම් | මිලදී ගැනීම් | | | |
| 1. | කැබ් රථ | 13 | 02 | 01 | | | 12 |
| 2. | මෝටර් රථ | 01 | | 01 | | | 02 |
| 3. | මයික්‍රෝ කයිරන් ජීප් රථ | 02 | | | | | 02 |
| 4. | වෑන් | 01 | 01 | 01 | | | 01 |
| 5. | මෝටර් සයිකල් | 01 | 01 | | | | - |
| 6. | ඩුප්ලෝ යන්ත්‍ර | 01 | | | | | 01 |
| 7. | ඡායා පිටපත් යන්ත්‍ර | 06 | | | | | 06 |
| 8. | පරිගණක | 41 | | 06 | | | 47 |
| 9. | පරිගණක ප්‍රින්ටර්ස් | 31 | | | | | 31 |
| 10. | ලැප්ටොප් පරිගණක | 01 | | | | | 01 |
| 11. | ෆැක්ස් යන්ත්‍ර | 20 | | | | | 20 |
| 12. | යතුරු ලියන | 03 | | | | | 03 |
| 13. | සේප්පු | 10 | | | | | 10 |
| 14. | කැමරා | 01 | | | | | 01 |
| 15. | රූපවාහිනී යන්ත්‍ර | 01 | | | | | 01 |
| 16. | ශීතකරණ | 01 | | 01 | | | 02 |
| 17. | රෝනියෝ යන්ත්‍ර | 02 | | | | | 02 |
| 18. | ශබ්ද විකාශන යන්ත්‍ර | 01 | | | | | 01 |

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලය


ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම ඉදිරි දැක්ම ලෙස පෙරටු කරගනිමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සභාපති කටයුතු කරන අතර, සභාපතිගේ සහාය සඳහා විධායක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජනරාල් අංශභාර අධ්‍යක්ෂවරුන් සහ සහකාර අධ්‍යක්ෂවරුන් ඇතුළු සියලු කාර්යමණ්ඩලය **390** දෙනෙකුගෙන් සමන්විතව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටු කරනු ලබයි.

එකී කාර්යමණ්ඩලය ප්‍රධාන කාර්යාලයේ අංශ 14 ක් හා දිස්ත්‍රික් කාර්යාල **20** ක් වශයෙන්ද බෙදා වෙන් කර ඇත.

## 2013.12.31 දක්වා කාර්යමණ්ඩල සංයුතිය

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | |
| 2 | අධ්‍යක්ෂ පාලන/ලේකම් | 1 | | |
| 3 | අධ්‍යක්ෂ මුදල් | 1 | | 1 |
| 4 | අධ්‍යක්ෂ/නීති | 1 | | 1 |
| 5 | අධ්‍යක්ෂ/ඉඩම් | 1 | | 1 |
| 6 | අධ්‍යක්ෂ | | 1 | |
| 7 | ලේකම් | | 1 | |
| 8 | සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | | 1 |
| 9 | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 2 | | 2 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (නීති) | 3 | 1 | 2 |
| 11 | සහකාර අධ්‍යක්ෂ (විමර්ශන) | 1 | | 1 |
| 12 | සහකාර අධ්‍යක්ෂ (පළාත්) | 18 | 27 | |
| 13 | සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කෘෂි සංවර්ධන ) | 1 | | |
| 14 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් උපරිම සීමා ) | 1 | | |
| 15 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පැවරීම් ) | 1 | | |
| 16 | සහකාර අධ්‍යක්ෂ (තක්සේරු හා වන්දි ) | 1 | | |
| 17 | සහකාර අධ්‍යක්ෂ (මැණුම් ) | 1 | | |
| 18 | අභ්‍යන්තර විගණක | 1 | 1 | |
| 19 | අධ්‍යක්ෂ ii | | 3 | |
| 20 | ගණකාධිකාරි iii | | 1 | |
| 21 | පුද්ගලික සහකාර iv | | 1 | |
| 22 | නීති සහකාර v | | 2 | |
| 23 | ගිණුම් නිලධාරි | 1 | | 1 |
| 24 | පරිපාලන නිලධාරි | 1 | | 1 |
| 25 | තොරතුරු තාක්ෂණ නිලධාරි | 1 | | 1 |
| 26 | තක්සේරු නිලධාරි | 1 | 1 | |
| 27 | තක්සේරු පරීක්ෂක | 3 | | 3 |
| 28 | මාණ්ඩලික සහකාර v | | 30 | |
| 29 | ගිණුම් නිලධාරි v | | 5 | |
| 30 | සැලසුම් ශිල්පී | 2 | | 2 |
| 31 | ප්‍රවාහන සහකාර | 1 | | 1 |
| 32 | කළමණාකාර සහකාර | 200 | 252 | |
| 33 | රියදුරු | 17 | 17 | |
| 34 | කාර්යාල කම්කරු | 44 | 46 | |
| | | **307** | **390** | **18** |

# සංවිධාන සැලැස්ම



ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
සභාපති
විධායක අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ ජනරාල්
L-1
L-2
L-3
L-4
L-5
L-6
L-7
L-8
L-9
අධ්‍යක්ෂ පාලන/ලේකම්
අධ්‍යක්ෂ/මුදල්
අධ්‍යක්ෂ නීති
අධ්‍යක්ෂ ඉඩම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ පාලන
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ආදායම් මුදල්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ගිණුම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ නීති
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ විමර්ශන
සහකාර අධ්‍යක්ෂ කලාප
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ව්‍යාපෘති කෘෂි සංවර්ධන
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ඉඩම් උපරිම සීමා
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ ඉඩම් පැවරීම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ මැණුම්
නි. අධ්‍යක්ෂ ස. අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි
ගිණුම් නිලධාරි
තක්සේරු පරීක්ෂක
තක්සේරු නිලධාරි
කළමනාකරණ සහකාර
ප්‍රවාහන සහකාර
කළමනාකරණ සහකාර පොත් තබන්නා
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
සැලසුම් ශිල්පි
රියදුරු
කාර්යාල කාර්ය සහායක
සනීපාරක්ෂක

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ එක් එක් අංශයන් මගින් ඉටුකරනු ලබන කාර්යයන් හා **2013** ජනවාරි **01** වන දින සිට **2013** දෙසැම්බර් **31** දක්වා ඉටුකර ඇති කාර්යයන් සම්බන්ධයෙන් වූ ප්‍රගතිය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පහත සඳහන් වේ.

**1. සභාපති අංශය සහ විධායක අධ්‍යක්ෂ අංශය**
**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | සභාපති | 01 |
| 2. | විධායක අධ්‍යක්ෂ | 01 |
| 3. | අධ්‍යක්ෂ ජනරාල් | 01 |
| 4. | පුද්ගලික සහකාර | 01 |
| 5. | ලිපිකරු | 01 |
| 6. | යතුරු ලේඛිකා | 01 |
| 7. | කාර්යාල කාර්ය සහායක | 03 |
| එකතුව | | 09 |

**කාර්යයන් :-**

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලු කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැතීන් සහ උපදෙස් ලබාදීම.

ii. කාර්යාලයට පැමිණෙන මහජනයාගේ ගැටලු විසඳාලීමට අවශ්‍ය උපරිම කටයුතු කිරීම.

iii අමාත්‍යාංශය හා සහ සම්බන්ධවෙමින් ආයතනයේ කටයුතු විධිමත් කිරීම.

iv. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අමාත්‍යවරුන් සමග සම්බන්ධීකරණයවීම.

**2. ලේකම් අංශය**
**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ලේකම් | 01 |
| 2 | ලිපිකරු | 01 |
| 3 | යතුරු ලේඛිකා | 01 |
| එකතුව | | 03 |

**කාර්යයන් :-**

i ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශයන් මගින් ඉදිරිපත් කරනු ලබන කොම්පත් සහා පත්‍රිකාවන් පරීක්ෂා කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.

ii. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා ඒවා අදාළ අංශයන් වෙත යොමු කිරීම.

iii ව්‍යාපෘති කමිටු රැස්කිරීම හා ඊට අදාළ වාර්තා තබා ගැනීම.

**3. කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය**
**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 03 |
| 3 | ලිපිකරු | 08 |
| 4 | යතුරු ලේඛිකා | 01 |
| 5 | ක්ෂේත්‍ර නිලධාරි vii , vi | 02 |
| 6 | ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| 7 | රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | 01 |
| 8 | රියදුරු | 17 |
| 9 | කාර්යාල කාර්ය සහායක | 03 |
| එකතුව | | 37 |

**කාර්යයන්**

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලුම නිලධාරින්ට අදාළ වන සියලුම පරිපාලන කටයුතු.
ii. සේවක බඳවා ගැනීම්, උසස් කිරීම්, මාරු කිරීම් සහ වැටුප් වර්ධක ලබාදීම, සේවක පරිපාලනය සම්බන්ධ කටයුතු.
iii. දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණ කටයුතු.
iv. නිලධාරින්ට අදාළ සුභ සාධක කටයුතු ඉටු කිරීම.
v. කාර්යාල අවශ්‍යතා සපුරාලීම.
vi. එදිනෙදා කාර්යාල නඩත්තු කටයුතු පවත්වාගෙන යාම.
vii. ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යාම.
viii. මහජන දිනය පවත්වාගෙන යාම.
ix. ආයතනයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාත්මක සැලැස්ම, වාර්ෂික වාර්තා සහ අනෙකුත් වාර්තා පිළියෙල කිරීම.
x. චක්‍රලේඛ නිකුත් කිරීම.
xi. විශ්‍රාම ගැන්වූ සහ ඉල්ලා අස්වූ නිලධාරින් සඳහා පාරිතෝෂික දීමනා, සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් නිදහස් කිරීමට අදාළ කටයුතු කිරීම.
xii. පොදු උත්සව සංවිධානය කිරීම.
xiii. පොදු වාහන කළමනාකරණ පද්ධතිය පවත්වාගෙන යාම.
xiv. ආයතනයේ කාර්යමණ්ඩල විනය කටයුතු පවත්වාගෙන යාම.
xv. විගණන වාර්තා පවත්වාගෙන යාම සහ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධ ගිණුම් කාරක සභාව වෙත අවශ්‍ය තොරතුරු වාර්තා ඉදිරිපත් කිරීම.
xvi. වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත හා පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම.
xvii. දිස්ත්‍රික් කාර්යාල අධීක්ෂණ කටයුතු කිරීම.

**2013 .01.01 දින සිට 2013.12.31 දින දක්වා ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්**

i. ආයතනයේ සේවකමණ්ඩල කළමනාකරණය.
ii. දිස්ත්‍රික් කාර්යාල විධිමත් කිරීම.
iii. වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම.
iv. කාර්යාල අවශ්‍යතා සපුරා ගැනීම.
v. ඉඩම් නොමැති පවුල් සඳහා ජාතික මට්ටමේ රන්බිම ඔප්පු ප්‍රදානෝත්සව සංවිධානය කිරීම.
vi. නිදහස් සේවක සංගමය සහ සුභ සාධක සංගමය එක්ව සාමූහික වැඩසටහන්.

**i ආයතනයේ සේවකමණ්ඩල කළමනාකරණය**

- ❋ කොමිෂන් සභාවේ කාර්යයන් වඩාත් කාර්යක්ෂම කර ගැනීම උදෙසා අධ්‍යක්ෂ ජනරාල් තනතුරට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනියකු වන ආචාර්ය එච්. එම්. එස්. ජයතුංග මහත්මිය 2013 නොවැම්බර් 27 වන දින සිට ද්විතීයන පදනම මත සේවයට බඳවා ගන්නා ලදී.
- ❋ 1994 වර්ෂය දක්වාම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සමස්ත සේවක සංඛ්‍යාව ලෙස විධිමත් අනුමැතිය ලැබී තිබූයේ 190 ක් වූ සේවක සංඛ්‍යාවකට පමණි. සමස්ත සේවක සංඛ්‍යාවේ රැකියා සුරක්ෂිතභාවය ඇති කිරීම පිණිස වසර ගණනාවක් තුළ ගත් උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස සමස්ත සේවක සංඛ්‍යාව 307 ක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට හැකියාව ලැබුණි.
- ❋ 307 ක් වූ සමස්ත සේවක සංඛ්‍යාවෙන් බැහැරව සේවයේ යොදවාගෙන සිටිනු ලබන සේවක සංඛ්‍යාවේ අවශ්‍යතාවයද මේ වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත සාධාරණීයකරණය කරමින් කරුණු ඉදිරිපත් කර ඇති අතර එකී අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

**ii දිස්ත්‍රික් කාර්යාල විධිමත් කිරීම**

- ❋ කාර්යාල කටයුතු සඳහා අදියර දෙකක් තුළදී පරිගණක යන්ත්‍ර ලබාදීමට කටයුතු කරන ලදී. එදිනෙදා රාජකාරි සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ ලබා නොදුන් කාර්යාල කිහිපයක් සඳහා ද අවශ්‍ය කාර්යාල උපකරණ ලබාදීමට කටයුතු කර ඇත.
- ❋ දිස්ත්‍රික් රාජකාරි කටයුතු කඩිනම් කිරීම උදෙසා සහ ආදායම් වර්ධනය කිරීම උදෙසා දින 14 ක් බැගින් වන සේ රාජකාරි වාහන පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත.
- ❋ දිස්ත්‍රික් රාජකාරි කටයුතු කඩිනම් කිරීම උදෙසා සහ ආදායම් වර්ධනය කිරීම උදෙසා මහනුවර, කුරුණෑගල, පුත්තලම, ගාල්ල/මාතර යන දිස්ත්‍රික් කාර්යාල හතරට ස්ථිර පදනම මත රාජකාරි වාහන පහසුකම් ලබාදීමට කටයුතු කර ඇත. මෙමගින් ආදායම් තත්වය වැඩි කර ගැනීම ඉලක්ක කර ඇති අතර වාහනයේ මාසික කල්බදු මුදලද අදාළ දිස්ත්‍රික් කාර්යාලය විසින් ගෙවීම් කරනු ලැබේ.

**iii වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක කිරීම.**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අදාළ වන සේ සකස් කර ඇති ස්ථාන මාරුවීම් පරිපාටියට අනුව 2014 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරුවීම් අපේක්ෂිත නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා ඒ සඳහා පත් කරන ලද සුදුසු ස්ථාන මාරුවීම් මණ්ඩලයක් මගින් හැකිතාක් දුරට සාධාරණීයකරණයෙන් හා විනිවිදභාවයකින් යුක්තව ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කර ඇත.

**iv කාර්යාල අවශ්‍යතා සපුරා ගැනීම**

- ❋ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ආදායම් ඉලක්ක, සපුරාලීමට දායකත්වයක් ලබාදීම දිස්ත්‍රික් කාර්යාල වෙතින් සිදු කෙරෙනු ඇත. එකී ආදායම් තත්වය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සෑම දිස්ත්‍රික්කයකම කොමිෂන් සභාව මගින් පවත්වාගෙන යා හැකි වන ව්‍යාපෘතියක් ආරම්භ කරමින් පුත්තලම දවුල් කුරුඳුවත්ත පොල් වගා ව්‍යාපෘතියක් සහ නුවරඑළිය ලිඳුල බංගලාව සංචාරක නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන යාමටත් මේ වනවිටත් කටයුතු ආරම්භ කර ඇත.
- ❋ ඉහත ප්‍රධාන රාජකාරිවලට අමතරව සේවක බඳවා ගැනීම් මාරුකිරීම් සහ වැටුප් වර්ධක ලබාදීම වැනි එදිනෙදා ඉටුකළ යුතු කාර්යයන් සහ **2013** වර්ෂයේ මාර්තු **23** දින අම්පාර හාඩි විද්‍යාල පරිශ්‍රයේදී පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් සාර්ථක ප්‍රදර්ශන කුටියක් පවත්වාගෙන යාමටද කටයුතු කරන ලදී.

**v ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල පවත්වා ගෙන යාම**

1972 වර්ෂයේ ආරම්භ කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය මේ දක්වාම හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07 හි රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයට අයත් සී 81 හා සී 82 දරන ගොඩනැගිලිවල ස්ථාපිත කර ඇත. මෙම ගොඩනැගිලි බදුකුලී තක්සේරු මුදල් අතිනයට බලපාන සේ වැඩිකරලීම හේතුවෙන් කුලී මුදල් ගෙවීම් කිරීම පිළිබඳව ඇති වූ ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡා වාර කිහිපයක් අදාළ පාර්ශවයන් සමග පවත්වන ලදී.

එහෙත් මේ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් නොලද බැවින් නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමක් තිස් අවුරුදු බදු පදනම ලබා ගනිමින් කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කිරීමට යෝජනා වුවද අධික වියදමක් දැරීමට සිදුවීමත් බදු පදනම මත ලබා ගන්නා වූ ඉඩම් කොටසක ගොඩනැගිලි ඉදිකිරීම තුලින් කොමිෂන් සභාව මහත් අපහසුතාවයකට ලක් විය හැකි බව පෙනී ගියෙන් එම කාර්යය අතහැර දමන ලදී.

ඒ සඳහා කඩිනම් විසඳුමක් ලබා ගැනීම සාකච්ඡා වාර කීපයක් පවත්වා යෝජනා කීපයක් ඉදිරිපත් වී ඇති අතර කඩිනමින් සුදුසු යෝජනාවක් ක්‍රියාවට නැංවීමට නියමිතය..

**vi ඉඩම් නොමැති පවුල් සඳහා ජාතික මට්ටමේ රන්බිම ඔප්පු ප්‍රදානෝත්සව සංවිධානය කිරීම**

දිවයිනේ සියලුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි ඉඩම් නොමැති පවුල් සඳහා ඉඩම් ඔප්පු ලබාදීමේ රන්බිම ඔප්පු ප්‍රදානෝත්සවයක් 2013.06.10 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේදී සිදු කරන ලදී.

**vii නිදහස් සේවක සංගමය සහ සුභ සාධක සංගමය සමග එක්ව ක්‍රියාත්මක කරන ලද සාමූහික වැඩසටහන්**

- ජනවාරි මස 01 වන දින කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් නව අවුරුද්ද සැමරීම නිමිත්තෙන් කෙටි උත්සවයක් සංවිධානය කිරීම.
- සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තෙන් අප්‍රේල් 22 වන දින කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් අලුත් අවුරුදු උත්සවයක් පැවැත්වීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිර්මාතෘ දිවංගත ගරු හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතානන්ගේ 29 වන ගුණසමරු උත්සවය අළලා සංසගත දානමය පුණ්‍යකර්මයක් කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් ඔක්තෝම්බර් මස 04, 05, 06 යන දිනයන් තුළ පොළොන්නරුව සෝමාවති රජමහා විහාරයේදී පවත්වන ලදි.
- මානව සම්පත් පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු ඩියු ගුණසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් රත්බිම ඔප්පු ප්‍රදානෝත්සවයක් ඔක්තෝම්බර් මස 30 වන දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදි.
- කාර්යමණ්ඩලයේ කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීම සඳහා සියලුම දිස්ත්‍රික් කාර්යාල සහ ප්‍රධාන කාර්යාලයේ කාර්යමණ්ඩලය එක්ව මහනුවර ශ්‍රී දළදා මාළිගාව, මාතලේ අළුවිහාරය, ගෙඩිගේ, වටදාගෙය, සහ පොළොන්නරුව යන ස්ථානවල විනෝද චාරිකාවක් සංවිධානය කරන ලදි.
- එමෙන්ම කාර්යමණ්ඩලයේ සාමූහික හැගිම් වර්ධනය කිරීම උදෙසා දෙසැම්බර් මස 30 වන දින හොරණ සෙවින්රෝ උත්සව ශාලාවේ සුහද හමුවක් සහ කාර්ය මණ්ඩලය සඳහා දිවා භෝජන සංග්‍රහයක් උත්සවශ්‍රීයෙන් සංවිධානය කරන ලදි.
- සුභ සාධන සංගමය හා එක්ව කාර්යමණ්ඩලය සඳහා සහනදායි ගෙවීමේ පදනම මත වෙළඳ ආයතන සමග සම්බන්ධ වී සහන මිලට පොත් මිලදී ගැනීම අරමුණු කරගත් ප්‍රදර්ශනයක් සහ කාර්යමණ්ඩලයේ අවශ්‍යතා පරිදි සහනදායීව ගෙවීමේ පදනම මත විදුලි උපකරණ ලබාදීමේ වැඩ සටහනක්ද පවත්වන ලදි.

**viii සේවාලාභි සත්කාර - මහජන දිනය පවත්වාගෙන යාම**

සේවාලාභින්ගේ දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ ක්‍රමවේදය, ඉඩම් ගැටලු නිරවුල් කිරීම, ගැටලු හඳුනා ගැනීම, සාකච්ජා කිරීම, සහ පැමිණිලි විමර්ශනය කිරීම, සඳහා ප්‍රධාන කාර්යාලයේ සෑම බදාදා දිනයකම පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා මහජන දිනයක් පැවැත්වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි දිනකට 200 - 300 අතර සංඛ්‍යාවක සේවාලාභීන් සහභාගී වන අතර. සභාපති, විධායක අධ්‍යක්‍ෂ, අධ්‍යක්‍ෂ ජනරාල් ඇතුළු අංශභාර අධ්‍යක්‍ෂවරු හමුවේ තම ගැටලුව ඉදිරිපත්කර සහනයක් ලබා ගැනිමට මහජනතාවට ඉඩකඩ සලසා ඇත. දිස්ත්‍රික් කාර්යාලවල මහජන දින සඳුදා සහ බදාදා ලෙස දින දෙකක් පවත්වනු ලැබේ.

## දිස්ත්‍රික් කාර්යාල

**2013** දෙසැම්බර් මස වන විට දිස්ත්‍රික් කාර්යාල **20** ක් ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කර ගෙන ගිය අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලයද ආරම්භ කිරීමේ මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

සමස්ත ශ්‍රී ලංකාව තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර එකී ස්ථාපනය කරන ලද දිස්ත්‍රික් කාර්යාල ලිපිනයන් පහත සඳහන් පරිදි වේ.

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව- දිස්ත්‍රික් කාර්යාල ජාලය

| | | | |
|---|---|---|---|
| 01 | <u>කළුතර</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>220, පරණ පාර<br>කළුතර.<br>දූරකථනය: 034-2223611 | 11 | <u>කෑගල්ල</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>කෑගල්ල.<br>දූරකථනය: 035-2222664 |
| 02 | <u>ගාල්ල</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>මහ නගර ශාලා ගොඩනැගිල්ල<br>ගාල්ල.<br>දූරකථනය: 091 - 2243930 | 12 | <u>අම්පාර</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>අම්පාර.<br>දූරකථනය: 063 - 2224021 |
| 03 | <u>මාතලේ</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>මාතලේ.<br>දූරකථනය: 066-2232357 | 13 | <u>මඩකලපුව</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>මඩකලපුව.<br>දූරකථනය: 065-2222986 |
| 04 | <u>මාතර</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>24, සම්බෝධි මාවත<br>පල්ලේමුල්ල<br>මාතර.<br>දූරකථනය: 041-22220 | 14 | <u>රත්නපුරය</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල<br>නවනගරය<br>රත්නපුර.<br>දූරකථනය: 045-2222492 |
| 05 | <u>මොනරාගල</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>ජනසවි ගොඩනැගිල්ල<br>කච්චේරි හන්දිය<br>මොනරාගල.<br>දූරකථනය: 055-2277208 | 15 | <u>ඇඹිලිපිටිය</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>අංක 12 බී, තොග ගබඩාව පාර<br>නව නගරය<br>ඇඹිලිපිටිය.<br>දූරකථනය: 047-2261801 |
| 06 | <u>මහනුවර</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය<br>මහනුවර<br>දූරකථනය: 081-2222316 | 16 | <u>මාදම්පේ</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>සේනානායක ආරණ්‍ය ඉදිරිපිට<br>පැරණි නගරය මාදම්පේ<br>දූරකථනය: 032-2247183 |
| 07 | <u>ගම්පහ</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ගොඩනැගිල්ල<br>කච්චේරි සංකීර්ණය<br>ගම්පහ<br>දූරකථනය: 033-2230134 | 17 | <u>අනුරාධපුර</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>කච්චේරි සංකීර්ණය<br>අනුරාධපුරය<br>දූරකථනය: 025-2225890 |
| 08 | <u>කොළඹ</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>සෙන්ට්‍රල් ෆාමසි ගොඩනැගිල්ල<br>පාදුක්ක.<br>දූරකථනය: 011-3154787 | 18 | <u>කුරුණෑගල</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>16, උතුරු වැව පාර<br>කුරුණෑගල<br>දූරකථනය: 037-2222553 |
| 09 | <u>බදුල්ල</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>10/1 ඒ, උද්භිද උද්‍යාන පාර<br>බදුල්ල.<br>දූරකථනය: 055-2222308 | 19 | <u>නුවරඑළිය</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>අයි.ආර්.ඩී.බී ගොඩනැගිල්ල<br>උඩුපුස්සැල්ලාව පාර<br>නුවරඑළිය.<br>දූරකථනය: 052-2235385 |
| 10 | <u>හම්බන්තොට</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය<br>තංගල්ල<br>දූරකථනය: 047-2241766 | 20 | <u>යාපනය</u><br>අධ්‍යක්ෂ<br>දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය<br>දිසාපති කාර්යාලය<br>යාපනය<br>දූරකථනය: 021-2219326 |

# දිස්ත්‍රික් කාර්යාල කාර්යභාරය

- ❋ ක්ෂේත්‍ර කටයුතුවල නියැලීම.
- ❋ කට්ටිකරුවන් තෝරා ගැනීම් පරීක්ෂණවලට සහභාගිවීම සහ ඔවුන් දැනුවත් කිරීම.
- ❋ රජයේ අවශ්‍යතාවය මත ආයතනවලට සහ පුද්ගලික ආයතනවලට ඉඩම් ලබාදීමේදී මැදිහත්වීම.
- ❋ ප්‍රධාන කාර්යාලයේ අවසරය පරිදි බෙදාදීමට ඇති ඉඩම් රජයේ ආයතනවලින් නිදහස් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.
- ❋ කට්ටිකරුවන් වෙත ඉල්ලුම්පත් බෙදාදීම සඳහා ඒ/එල් පෝරමය පරීක්ෂාකර බලා නිර්දේශ කිරීම.
- ❋ සභාපති, විධායක අධ්‍යක්ෂ උපදෙස් මත අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂිත ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහභාගිවීම.
- ❋ කාර්යාලයේ සඳුදා /බදාදා මහජන දින පැවැත්වීම හා ඊට අදාළ රාජකාරි කටයුතු ඉටු කිරීම.
- ❋ ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමට, අවශ්‍ය තොරතුරු සම්පාදනය කරමින් ලිපිගොනු පවත්වාගෙන යාම.
- ❋ දිස්ත්‍රික්කයේ නඩුවලට අධ්‍යක්ෂවරුන් යායුතු අවස්ථාවලදී සහභාගිවීම
- ❋ ප්‍රතිපත්ති හා වැදගත් තීරණ ගැනීම සඳහා සභාපතිතුමාට වාර්තා කිරීම.
- ❋ රාජකාරි කටයුතු සඳහා පැමිණෙන මහජනතාවට සහ ප්‍රකාශකයින් වෙනුවෙන් සභාපති අධීක්ෂණය යටතේ ඔවුන්ගෙන් තොරතුරු ලබා ගැනීම අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ❋ දිස්ත්‍රික් කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය.
- ❋ ආදායම් රුස් කිරීම.
- ❋ ක්ෂේත්‍ර නිලධාරින්ගේ ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය සහ පුහුණු කිරීම.
- ❋ ප්‍රකාශිත එහෙත් ක්ෂේත්‍රයේ හඳුනා නොගත් ඉඩම් සහ ප්‍රකාශ නොකළ අක්කර 50 ට වැඩි ඉඩම් සම්බන්ධ තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.

- ❋ කොම්පත් සභාවේ ඉදිරි පැවැත්ම සඳහා ආදායම් තත්වය දියුණු කිරීමට කටයුතු කිරීම.

- ❋ ක්ෂේත්‍ර නිලධාරින් විසින් ඉදිරිපත් කරන පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්ෂේත්‍රයන් පරීක්ෂා කිරීම.

- ❋ කට්ටිකරුවන් දැනුවත් කිරීමේ සහ තෝරා ගැනීමේ පරීක්ෂණවලට සහභාගිවීම.

- ❋ ඉඩම් නිරවුල් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම.

- ❋ ඔප්පු උත්සව සංවිධාන කටයුතු කිරීම.

**04. අභ්‍යන්තර විගණන අංශය**
**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 01 |
| **3** | ලිපිකරු | **03** |
| 4 | යතුරු ලේඛිකා | 01 |
| එකතුව | | **06** |

**✸ හැඳින්වීම හා කාර්යයන්**

i 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත හා 1971 අංක 38 දරන මුදල් පනත අනුව සැකසුණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පත් සභා මුදල් සංග්‍රහයේ ii වන කොටසේ 2 වන වගන්තිය උපවගන්තිය 01-03 අනුව ලැබී ඇති බලය පරිදි රාජකාරී ඉටු කිරීම.

ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පත් සභාවට පැවරුණු කෘෂිකාර්මික ඉඩම් සඳහා වන්දි හා පොලී ගෙවීම් පූර්ව විගණනය.

iii ඔප්පු පිළියෙල කිරීමේදී ඊට අදාළ ලියවිලි පවතිද තක්සේරු වාර්තා මුදල් අයකර ගැනීම් පුද්ගල තත්වය ආදී කරුණු වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම.

iv විගණකාධිපතිගේ වාර්තා අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පත් සභාවේ අවසාන ගිණුම්වල දැක්වෙන අඩුපාඩු අවම කර ගනිමින් ඉදිරි කටයුතු කිරීමට සහායවීම.

v විගණකාධිපතිගෙන් යොමු වන විගණන විමසුම් සඳහා අදාළ අංශවලින් තොරතුරු කැඳවීම. ප්‍රමාණවත්භාවය පරීක්ෂා කිරීම හා යොමුවන පැමිණිලි අනුව පරීක්ෂණ කටයුතු සිදු කිරීම.

**2013.01.01 දින සිට 2013.12.31 දින දක්වා ඉටුකර ඇති ප්‍රධාන කාර්යයන්**

## 01. මුදල් අංශයේ කටයුතු විගණනය

i ලැබීම් හා ගෙවීම් පරීක්ෂාව

2013 වර්ෂයේ නියැදි පරීක්ෂණ ලෙස ජනවාරි, ජූලි, සැප්තැම්බර්, මාසයන්ට අදාළ ගිණුම් අංක 193393 හා ගිණුම් අංක 1443 ට අදාළ මුදල් පොත, මුදල් භාරදෙන වවුචර්, කුවිතාන්සි පොත්, මුදල් තැන්පත් කිරීමේ ලදුපත්, බැංකු ප්‍රකාශය, බැංකු සැසඳුම් විස්තර, මුදල් ඇණවුම් ලේඛන ගෙවීම් වවුචර්පත් හා ආදායම් වියදම් එම වැය ශීර්ෂ යටතේ සටහන් කිරීම නිවැරදිද යන්න. චෙක්පත් අවලංගු කිරීමේ ලේඛනය හා චෙක් උප පත්‍රිකා නිවැරදි දැයි යන්න විගණනය කිරීම.

ii ගිණුම් අංක 1415 ට අදාළ මාරු කිරීම් නිවැරදි ලෙස සටහන් වේද යන්න පරීක්ෂා කිරීම.

iii පාරිතෝෂික මුදල් ගෙවීම් වවුචර්පත් 15 ක් පූර්ව විගණනය කිරීම.

iv ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයින් අන්තර්ග්‍රහන ක්‍රියාවලියට ඇතුලත් වූ හෙයින් මූලික වැටුප් තලයන්හි පිහිටුවීම මත සියළුම සේවකයින්ගේ වැටුප් පත්‍රිකා විගණනය කිරීම.

v සරප් අංශයේ පොත්පත් හා මුදල් සත්‍යාපනය කිරීම අවස්ථා 02

vi ප්‍රධාන ගබඩාව පරීක්ෂාව අවස්ථා 01

vii ආපදා ණය, එක් මාසික ණය, පාසැල් පොත් ණය ලෙජර් නියැදි පරීක්ෂණයට ලක් කිරීම.

Viii 2013 වර්ෂයේ ප්‍රසාද දීමනා වවුචර්පත් විගණනය කිරීම
(නිවාඩු ලේඛන සමග)

## 02. තක්සේරු හා වන්දි අංශ කටයුතු පරීක්ෂාව

i. වන්දි ලිපිගොනු 10 ක් සහ පොලී ගෙවීමට අදාළ ලිපිගොනු 08 ක් පූර්ව විගණනයට ලක් කිරීම.

ii. වන්දි හා පොලී ගෙවීම් අවසන් කිරීමට නොහැකි අවස්ථා

- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම් තහවුරුකර නොමැතිකම නිසා වන්දි ගෙවීමට නොහැකිවීම.
- වන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටීම.
- බුක්තිය භාර ගැනීමේ සහතික නොමැතිවීම.

- ප්‍රකාශකයින් වෙත යවන ලද වන්දි ප්‍රදාන ලිපියට අනුමැතිය නොලැබීම හා වවුචර්පත් අත්සන් කර භාර නොදීම.

- ගැසට් නිවේදන පල කොට වන්දි තීරණය කිරීම.

වන්දි ගෙවීමට අදාළව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි සමග සාකච්ඡාකර එය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව කොමිෂන් සභාවට සුදුසු පියවරක් ගැනීමට යොමු කිරීම.

## 03. ඉඩම් පැවරීම් අංශය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පවතින චක්‍රලේඛ හා මාර්ගෝපදේශ අනුගමනය කරමින් ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන් යටතේ ඉඩම් පැවරීම් අංශයේ ඒ/එල් අයදුම්පත්‍ර හා අදාල ලේඛන පැවරීම් ලිපිගොනු සමග විගණනය කිරීම.

## 04. ආදායම් අංශයේ කටයුතු පරීක්ෂාව

i. ලෙජර් පවත්වාගෙනයාම පරික්ෂාව.
ii. හිඟ බදු මුදල් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග පරික්ෂාව.
iii. ඉලක්කගත ආදායම් සපුරා ගැනීම පිළිබඳව පරික්ෂාව.
iv. අධ්‍යක්ෂ/ආදායම් සමග සාකච්ඡා කරමින් බදු ලිපිගොනු වල අඩුපාඩු සකස්කර ගැනීම සඳහා සුදුසු පියවරක් ගැනීමට විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සහ ඒ පිළිබඳ පසු විපරම් කිරීම.

## 05. කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශයේ කටයුතු

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයින්ගේ පැමිණීමේ පිටවීමේ සටහන් පත්‍ර හා නිවාඩු ලේඛණ, වැටුප් රහිත නිවාඩු පරික්ෂාව.
ii. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වාහන අලුත්වැඩියාව, ධාවන සටහන් නියැදි පරික්ෂාවන් කිරීම.
iii. ටෙන්ඩර් මණ්ඩල කටයුතු පරික්ෂාව.
iv. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සමස්ත සේවකයින් නව බඳවා ගැනීමේ පරිපාටියට අනුව හා කළමනාකරණ සේවා අංක 30 ට අනුව සිදු කළ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය පරික්ෂා කිරීම.

## 06. නීති අංශය

නීති වියදම් අවම කිරීම සඳහා නීති අංශයේ නඩු ලිපිගොනු පරික්ෂා කිරීමෙන් පසු හා නීති නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් පසුව විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කළ අතර එමගින් ලත් තීරණ මත කඩිනම් යෝජනා මාලාවක් ඉදිරිපත් කිරීම.

## 06. විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කිරීම.

i. 2013 වර්ෂයට අදාළව ලත් විගණන විමසුම් 13 ක් සඳහා අංශවලින් තොරතුරු කැඳවීම් හා ඒ අනුව පිළිතුරු ලිපි සකස්කර ඉදිරිපත් කිරීම.
ii. 1971 අංක 58 දරන මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවන්ට පිළිතුරු සැපයීම.

## 07. කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් පැවැත්වීම

2013 වර්ෂය තුල කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ලබාගත් තීරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කර අදාළ අංශයන්ට වාර්තා කිරීම හා ඒවා සම්බන්ධයෙන් පසු විපරම් කිරීම.

## 08. දිස්ත්‍රික් කාර්යාල විගණන පරීක්ෂාව

නුවරඑළිය, කළුතර, කොළඹ, මාතර, ඇඹිලිපිටිය, හම්බන්තොට, බදුල්ල, මහනුවර, අම්පාර යන කාර්යාලවල පැමිණීමේ ලේඛනය, නිවාඩු ලේඛනය, ගිණුම් සම්බන්ධ පොත් හා ලේඛන ඉන්වෙන්ට්‍රි, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ වැඩ සටහන් විස්තර හා ක්ෂේත්‍ර පරීක්ෂාව, අදාළ ගොවි නාම ලේඛනය, ඉඩම් ලේඛන, බදු ලේඛන, කාර්යමණ්ඩලයේ රාජකාරි පැවරීම් ආදිය පරීක්ෂා කිරීම.

## 09. කොමිෂන් සභා තීරණ හා ව්‍යාපෘති තාක්ෂණික කමිටු තීරණ ක්‍රියාත්මකවීම පිළිබඳ පසු විපරම් කිරීම.

සභාපතිතුමා, විධායක අධ්‍යක්ෂතුමාගේ හදිසි කැඳවීම්, සාකච්ඡා හා රැස්වීම් සඳහා සහභාගිවීම.

### 05. ඉඩම් උපරිම සීමා අංශය

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 01 |
| 3 | ලිපිකරු | 12 |
| 4 | යතුරු ලේඛිකා | 01 |
| 5 | පොත් බඳින්නා | 01 |
| 6 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 17 |

**හැඳින්වීම හා කාර්යයන් :-**

i. උපරිමයට වැඩි එනම් අක්කර 50 ට වැඩි කෘෂිකාර්මික ඉඩම් අයිති පුද්ගලයින්ගෙන් ප්‍රකාශන ලබා ගැනීම.

ii. ප්‍රකාශන ඉදිරිපත් කළ පුද්ගලයින්ගෙන් එනම් ප්‍රකාශකයින්ගේ කැමැත්ත පරිදි ඔවුනගේ ඉඩම් වලින් අක්කර 50 ක් ව්‍යවස්ථාපිත නිශ්චය ලෙස වෙන්කර ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් පවරාදීම.

iii. ප්‍රකාශකගේ ඉල්ලීම පරිදි 1972.08.26 වන දිනට වයස අවු 18 ඉක්මවූ ඔහුගේ දරුවන්ට හෝ දෙමාපියන්ට එක් අයෙකුට අක්කර 50 ට උපරිමයට යටත්ව ඉඩම් ප්‍රතිංසස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම.

iv. ප්‍රකාශකගේ 1972.08.26 දින වන විට අවු 18 ට අඩු වූ නමුත් ඉඩම්වල අයිතිය තිබූ දරුවන්ට ප්‍රකාශකගේ ඉල්ලීම මත එක් අයෙකුට අක් 50 ක උපරිමයට යටත්ව පනතේ 22 ඊ වගන්තිය යටතේ ඉඩම් කොටස් ලබාදීම.

v. ඉහත නීතිමය බැඳීම් වෙනුවෙන් ඉඩම් ලබාදීමෙන් පසු කොම්පන් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය පිළිබඳ තොරතුරු වන්දි ගෙවීම් සඳහා තක්සේරු හා වන්දි අංශය වෙත යොමු කිරීම.

1. 2013 වර්ෂයේ 2013.01.01 දින සිට 2013.12.31 දක්වා අංශයේ ප්‍රගතිය.

| | | |
|---|---|---|
| i. | සභාපතිතුමා, විධායක අධ්‍යක්ෂතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමිය වෙත වාර්තා ඉදිරිපත් කිරීම. | - 288 |
| ii. | දිස්ත්‍රික් කාර්යාලයෙන් වාර්තා කැඳවීම්/ලැබීම් | - 213 |
| iii. | අංශ/දිස්ත්‍රික් කාර්යාල වෙත පිළිතුරු හා විස්තර ලබාදීම | - 495 |
| iv. | අමාත්‍යාංශ/ආයතන /පුද්ගලයින් වෙත ලිපි යැවීම | - 287 |
| v. | තක්සේරු වාර්තා කැඳවීම් /ලැබීම් | - 41 |
| vi. | ජනාධිපති විමසීම් සඳහා පිළිතුරු | - 17 |
| vii. | ගොනුකිරීම් | - 277 |
| viii. | කොම්පන් පත්‍රිකා සකස් කිරීම් | - 73 |
| ix. | නඩු වලට සහභාගිවීම් | - 164 |
| x. | නඩු සාකච්ජා වලට සහභාගිවීම් | - 37 |
| xi. | ක්‍රියා නිමි රාජකාරි | - 45 |

**1.i. ගැසට්පත්‍ර සැකසීම**

- ➢ කු/121 ව්‍යවස්ථාපිත නිශ්වය
- ➢ 6/1/ප්‍රත්‍යාදිෂ්ඨ (ගලහා වත්ත)
- ➢ ර/106 ව්‍යවස්ථාපිත නිශ්වය අවලංගු ගැසට් පත්‍ර
- ➢ කො/1374 ප්‍රත්‍යාදිෂ්ඨ
- ➢ කො/3436 ව්‍යවස්ථාපිත නිශ්වය ගැසට් පත්‍ර
- ➢ කො/2472 ව්‍යවස්ථාපිත නිශ්වය ගැසට් පත්‍ර
- ➢ කො/2365 ව්‍යවස්ථාපිත නිශ්වය සංශෝධිත ගැසට්
- ➢ කො/2386 ව්‍යවස්ථාපිත නිශ්වය සංශෝධිත ගැසට්

- කො/**2369** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**1725** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**2389** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**1646** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**2386** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**2362** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**2390** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**2364** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**2393** ව්‍යවස්ථාපිත නිශ්චය සංශෝධිත ගැසට්
- කො/**129** ව්‍යවස්ථාපිත නිශ්චය ගැසට් පත්‍ර
- කු **133** ව්‍යවස්ථාපිත නිශ්චය ගැසට් පත්‍ර

ii.**22(1) අ වගන්තිය යටතේ පැවරීම්**

| | | |
|---|---|---|
| ❖ මාලේ/59 | 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය විකල්ප) | |
| ❖ කො/3066 | 22(1) අ පවුල තුල පැවරීම් | |
| ❖ කො/1569 | 22(1) අ (ප්‍රකාශක නොවන) ඔප්පු | 02 |
| ❖ මහ/118 | 22(1)අ (ප්‍රකාශක නොවන) ඔප්පු | 01 |
| ❖ කො/3374 | 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය හුවමාරු) ඔප්පු | 01 |
| ❖ කො/1936 | 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය හුවමාරු) ඔප්පු | 01 |
| ❖ කො/472 | 22(1)අ (ප්‍රකාශක නොවන) ඔප්පු | 01 |
| ❖ මහ/324 | 22(1)අ (ව්‍යවස්ථාපිත නිශ්චය හුවමාරු) ඔප්පු | 01 |
| ❖ කො/1146 | 22 (1) ඊ පවුල තුල පැවරීම් ඔප්පු | 01 |
| ❖ ර/220 | 22(1)අ ව්‍යවස්ථාපිත නිශ්චය හුවමාරු ඔප්පු | 01 |
| ❖ ර/143 | 22(1)අ පවුල තුල පැවරීම් ඔප්පු | 01 |
| ❖ කෑ/28 | 22(1) අ ප්‍රකාශක නොවන ඔප්පු | 01 |

iii. **22(1) ඊ වගන්තිය යටතේ පැවරීම්**

| | | |
|---|---|---|
| • කො/3217 | 22(1)ඊ (පවුල තුල පැවරීම්) ඔප්පු | 03 |
| • කො/1176 | 22(1) ඊ (විකල්ප ඉඩම්) ඔප්පු | 01 |
| • කො/3217 | 22(1) ඊ (පවුල තුල පැවරීම) ඔප්පු | 01 |

**iv. 14 වන වගන්තිය**

- ගා/98 14 වන වගන්තිය (පවුල තුල පැවරීම්) ඔප්පු 01
- කො/2770 14 වන වගන්තිය ඔප්පු 01
- ර/43 14 වන වගන්තිය ඔප්පු 01
- ර/126 14 වන වගන්තිය ඔප්පු 01

**v. නව ඉඩම් කොටස් හඳුනා ගැනීම්**

යායින්න නින්දගම ප්‍රමාණය අක්කර 1414

15/6/අයිලි වත්ත ප්‍රමාණය අක්කර 1000 පමණ

**vi. ඉඩම් පවරා ගැනීම්**

කො/517 ගොනුවේ අක්කර 2106 රූඩ් 3 පර්චස් 15 (අවසන් තීරණයක් නැත)

**03. වෙනත්** 28

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරි ඇති ඉඩම් පිළිබඳවද කොමිෂන් සභාව විසින් නිදහස් කර ඇති ඉඩම් පිළිබඳවද කොමිෂන් සභාව සතුව දැනට ඇති ඉඩම් පිළිබඳ ලේඛන ඇතත් අවසානාත්මක නිවැරදි ලේඛනයක් ආයතනය සතුව නොමැතිවීම දීර්ඝ කාලයක සිට මුහුණදීමට සිදු වූ ගැටලුවකි.

එකී දීර්ඝ කාලීනව පැවැති ගැටලුවක් නිරාකරණය කර ගැනිමේ අටියෙන් ව්‍යවස්ථාපිත ප්‍රකාශක ආශ්‍රයෙන් මෙතෙක් ව්‍යවස්ථාපිත බැදීම සඳහා ලබාදීමට නොහැකි වූ ඉඩම් ප්‍රමාණය නිශ්චිතව ගණනය කිරීමටත් කොමිෂන් සභාව වෙත පැවරුණු සියලුම ඉඩම්වල බුක්තිය හා අයිතිය කොමිෂන් සභාව සතු වී ඇති බවට තහවුරු කර ගැනීම සඳහාත් කොමිෂන් සභාව සතු වූ ඉඩම්වලින් මෙතෙක් සිදු කල බැහැර කිරීම්ද ඇතුලත් කොට වෙනම සංචිතයක් මගින් ඉඩම් ලේඛනයේ රාජකාරී ඉටු කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර එකී කාර්යයෙන් 90% ක පමණ ප්‍රගතියක් මේ වන විට ළගා කර ගැනීමට හැකියාව ලැබී ඇත.

6 තක්සේරු හා වන්දි අංශය
සංයුතිය

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | තක්සේරු පරීක්ෂක ( වැඩ බලන අධ්‍යක්ෂ) | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 01 |
| 3 | ළඝු යතුරු ලේඛක | 01 |
| 4 | ලිපිකරු | 01 |
| 5 | උසාවි ලිපිකරු | 01 |
| 6 | යතුරු ලේඛක | 01 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 07 |

**හැඳින්වීම හා කාර්යයන්**

i. වන්දි සම්බන්ධ ඉඩම්වල අයිතියේ නිරවද්‍යතාව සහතික කරවා ගැනීම.
ii. උරුමයන් පිළිබඳව හා වන්දි බෙදී යාම බුදල් තබූ පිළිබඳව (වන්දි වලට අදාළ) පරීක්ෂා කිරීම.
iii. ප්‍රකාශකයින්ගෙන් අවසාන වශයෙන් කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් සඳහා වන්දි ගෙවීම.
iv. ඉඩම් පැවරීම්, විකිණීම් ආදිය සඳහා රජයේ තක්සේරු වාර්තා කැඳවීම.

<u>**අංශයේ කාර්ය භාරය.**</u>

මෙම අංශයේ කාර්යභාරය කොටස් 2 කින් යුක්තය.

01. කොමිෂන් සභාවට පැවරුණු ඉඩම් සඳහා වන්දි ගෙවීම (වන්දි අංශය)
02. කොමිෂන් සභාවට අයත් ඉඩම් විකිණීම්, බදුදීම් සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තා කැඳවීම.

**කාර්යභාරය 01**

01. i. ප්‍රකාශිත ඉඩම්වලින් කොමිෂන් සභාව වෙත සතු වූ ඉඩම් සම්බන්ධයෙන් වන්දි ගෙවීමට කටයුතු කිරීම.

මේ සඳහා 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 29 වන වගන්තියේ සිට පනතේ දක්වා ඇති 42 වන වගන්තිය මගින් සළසා ඇති නීතිමය ප්‍රතිපාදනයන් හා සංශෝධිත පනත් මගින් දක්වා ඇති මාර්ගෝපදේශ භාවිතයට ගැනේ.

**කාර්යභාරය 02**

02. i. කොම්පත් සභාව විසින් අනුමත කරනු ලබන ඉඩම් විකිණීම් බදුදීම් සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා කැඳවීම හා එම තක්සේරු වටිනාකම් ඉදිරි කටයුතු සඳහා ඉඩම් පැවරීම්, ඉඩම් උපරිම සීමා හා ව්‍යාපෘති අංශය වෙත වාර්තා කිරීම.

ii. උක්ත ක්‍රියාකාරකම් 2 ට අමතරව බදු සංශෝධනය කිරීම සඳහා ජනාධිපති ලේකම්ගේ SEI/A/4/34 දරණ චක්‍රලේඛය යටතේ දක්වා ඇති පරිදි බදු සංශෝධනය කිරීම සඳහා කටයුතු කිරීම. (ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව කැඳවීමට යටත්ව)

iii. දැව තක්සේරු කිරීම හා දළ තක්සේරු වාර්තා පිළියෙළ කිරීම.

## 2013 වර්ෂයේ කාර්යසාධනය

| අනු අංකය | ක්‍රියාකාරකම් | භෞතික | | | | මූල්‍ය<br>ඉඩම් විකිණීම | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉඩම් බදුදීම් | විකිණීම් | පවුල තුල පැවරීම් | වන්දි හා පොලී ගෙවීම් | බදුදීම් රු. | හුවමාරුව මත විකිණීම් රු. | විකිණීම් රු. | වෙනත් ඉපයීම් රු. | ගෙවීම් රු. |
| 01 | තක්සේරු කැඳවීම් | 58 | 209 | 22 | | | | | | |
| 02. | නිකුත් කල තක්සේරු වාර්තා | 38 | 154 | 33 | | 305,739,750.00<br>බදු ප්‍රතිශතය 4% හා 6% | 134,728,511.00 | 83,364,700.00 | | |
| 03 | බදු කුලී සංශෝධන | | | | | | | | 16,086,951.00 | |
| 04 | දැව තක්සේරු කිරීම | | 36 | | | | | | 996,663.91 | |
| 05 | කළුගල් හා වෙනත් | - | - | - | | | | | 8,480,000.00 | |
| 06 | සේවා ගාස්තු ඉපයීම් | - | - | - | | | | | 5,606,858.00 | |
| 07 | ප්‍රකාශකයින් සඳහා වන්දි ගෙවීම් | - | - | - | 17 | | | | | 6,536,713.59 |

## 07. ඉඩම් පැවරීම් අංශය

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ | 03 |
| 2 | මාණ්ඩලික සහකාර | 04 |
| 3 | ලිපිකරු | 18 |
| 4 | යතුරු ලේඛක | 03 |
| 5 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 29 |

**කාර්යයන් :-**

i. නිවාස අරමුණු සඳහා පුද්ගලයන්ට ඉඩම් පැවරීම.
ii. රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවලට ඉඩම් විකිණීම /බදුදීම.
iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් කොටස් විකිණීම.
iv. ඉඩම් කච්චේරි පැවැත්වීම හා අනවසර නියමානුකූල කටයුතු සම්බන්ධීකරණය කිරීම.
v. මැනුම් නියෝග පිළිබඳ කටයුතු.
vi. මැනුම් ගැටලු වලට උපදෙස් ලබාදීම.
vii. දිස්ත්‍රික් කාර්යාලවල ක්ෂේත්‍ර වාර්තා ලබා ගැනීම.
viii. මැනුම් සැලසුම්වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය.
ix. අනවසරකරුවන් පිළිබඳ ලේඛන යාවත්කාලීන කිරීම හා පසු විපරම.
x. අනවසරකරුවන් ඉවත්කිරීම හා ඒ පිළිබඳ පියවර ගැනීම හා පරීක්ෂණ පැවැත්වීම.
xi. ඉඩම් නියමානුකූල කිරීමේ ආකෘති පත්‍රය ලබා ගැනීම. අධීක්ෂණය හා පසු විපරම.
xii. අනුප්‍රාප්තිය පිළිබඳ කටයුතු.
xiii. ඉඩම් විකුණුම් අයදුම්පත් පිළිබඳ කටයුතු.
xiv. දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණ කටයුතු.

2013.01.01 දින සිට 2013.12.31 දින දක්වා ඉටුකර ඇති කාර්යයන්

**i. විකිණීම.**

| | පුද්ගලයින් ගණන | ප්‍රමාණය අක්. රූඩ්. පර්. |
|---|---|---|
| i. නිවාස අරමුණ සඳහා පුද්ගලයින්ට පැවරීමට අදාළ ඔප්පු සකස් කිරීමට යොමු කිරීම | 3800 | 1903 0 00 |
| ii. රාජ්‍ය සංස්ථා හා මණ්ඩලවල ඉඩම් විකිණීමට අදාළ ඔප්පු සකස් කිරීමට යොමු කිරීම | 20 | 500 0 00 |
| iii පුද්ගලයින්ට විකිණීමට (කුඹුරු) අදාළ ඔප්පු සකස් කිරීමට යොමු කිරීම | 35 | 61 0 00 |

**8. ව්‍යාපෘති අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 01 |
| 3 | ලිපිකරු | 04 |
| 4 | ක්ෂේත්‍ර නිලධාරි | 01 |
| 5 | යතුරු ලේඛක | 01 |
| 6 | අභ්‍යාසලාභී | 02 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 11 |

**හැඳින්වීම හා කාර්යයන්**

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් බදුදීමේදී (ව්‍යාපෘති සඳහා) අනුගමනය කරනු ලබන නියමිත ක්‍රමවේදය මත ඉඩම් බදුදීම.

ii. ව්‍යාපෘතිය සඳහා ඉඩම් බදුදීමට ප්‍රථම ව්‍යාපෘති කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iii. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ වාර්තා සකස් කිරීම.

iv. විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම.

v. තක්සේරු වාර්තා කැඳවීම.

vi. බදු මුදල් අයකර විධිමත් බදු ගිවිසුමක් ලබාදීම.

## 2013.01.01 දින සිට 2013.12.31 දක්වා ප්‍රගතිය

1. විවිධ ව්‍යාපෘති සඳහා අක්කර **378** රූඩ් **0** පර්චස් **06.4** වෙනුවෙන් මැනුම් නියෝග **70** ක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

2. බදු ගිවිසුම් ලබා දී ඇති

| | | | |
|---|---|---|---|
| i. | කර්මාන්ත කටයුතු සඳහා | - | **09** |
| ii. | කෘෂිකාර්මික කටයුතු සඳහා | - | **02** |

3. බදු ගිවිසුම් ලබාදීමට කටයුතු කරමින් පවතී.

| | | | |
|---|---|---|---|
| i. | කර්මාන්ත කටයුතු සඳහා | - | **37** |
| ii. | කෘෂිකාර්මික කටයුතු සඳහා | - | **46** |
| iii. | ඛනිජ සම්පත් | - | **10** |
| **iv.** | වෙනත් කාර්යන් | - | **18** |

**09. ඔප්පු අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නීති සහකාර | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 01 |
| 3 | ලිපිකරු | 08 |
| 4 | යතුරු ලේඛක | 01 |
| 5 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 12 |

**1. හැඳින්වීම හා කාර්යයන්**

**i. අරමුණු :-**

කෘෂිකාර්මික කටයුතු, නිවාස අරමුණු සහ කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා බදු පදනම මත සහ විකිණිමේ පදනම මත තෝරාගත් පුද්ගලයන් සහ ආයතන සඳහා ඉඩම් බැහැර කිරීම සිදු කරනු ලබන අතර එසේ කරන බැහැර කිරීම ඔප්පු සකස් කිරීම තුළින් සිදු කරනු ලබයි.

**ii. කාර්යභාරය :-**

දිවයිනේ සියලුම දිස්ත්‍රික් අවරණය වන ආකාරයට 2013 වසර තුළ ප්‍රතිලාභින් 3500 කට ආසන්න සංඛ්‍යාවකට ඔප්පු නිකුත් කර ඇත. මේ අනුව මෙම අංශය මගින් ප්‍රතිලාභ පවුල් දළ වශයෙන් 55000 කට පමණ ඉඩම් අයිතිය ලබාදී ඇත.

## 2. i. 2013 වර්ෂයේදී ලබාදුන් ඔප්පු සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | ඔප්පු සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 122 |
| ගම්පහ | 341 |
| කෑගල්ල | 365 |
| කළුතර | 185 |
| මාතලේ | 85 |
| බදුල්ල | 251 |
| කුරුණෑගල | 220 |
| පුත්තලම | 385 |
| මහනුවර | 385 |
| නුවරඑළිය | 218 |
| අනුරාධපුර | 60 |
| මඩකලපුව | 103 |
| අම්පාර | 102 |
| ත්‍රිකුණාමලය | 15 |
| මාතර | 110 |
| හම්බන්තොට | 45 |
| ගාල්ල | 218 |
| රත්නපුර | 111 |
| මොනරාගල | 98 |
| ඇඹිලිපිටිය | 81 |
| **එකතුව** | **3500** |

## ii.2013 වර්ෂයේදී ඔප්පු ලබාදීමෙන් පසු බැංකු ලිපි හා පැවැරුම් ලිපි නිකුත් කරමින් ලත් ආදායම

| මාසය | ආදායම |
|---|---|
| ජනවාරි | රු. 98,500.00 |
| පෙබරවාරි | රු. 99,000.00 |
| මාර්තු | රු. 82,000.00 |
| අප්‍රේල් | රු. 66,000.00 |
| මැයි | රු. 110,500.00 |
| ජූනි | රු. 97,000.00 |
| ජූලි | රු. 93,000.00 |
| අගෝස්තු | රු. 102,000.00 |
| සැප්තැම්බර් | රු. 99,500.00 |
| ඔක්තෝම්බර් | රු. 91,000.00 |
| නොවැම්බර් | රු. 93,500.00 |
| දෙසැම්බර් | රු. 82,000.00 |
| **එකතුව** | **රු. 1,114,000.00** |

## 10. මැනුම් හා වෙන්කිරීම් අංශය

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | මැනුම් උපදේශක | 01 |
| 2 | මාණ්ඩලික සහකාර | 01 |
| 3 | ලිපිකරු | 02 |
| 4 | යතුරු ලේඛක | 01 |
| එකතුව | | 05 |

**කාර්යයන් :-**

නිවාස අරමුණු සඳහා ඉඩම් ලබාදීම, වාණිජ හා කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් බදුදීම හා ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ලබාදිය යුතු ඉඩම් මැනීම සහ ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධීකරණය වේ. දිස්ත්‍රික් වශයෙන් තෝරා ගත් මිනින්දෝරුවරුන්ගේ ලැයිස්තුවක් වාර්ෂිකව යාවත්කාලීන කොට ඔවුන්ගේ සේවය ලබා ගනු ලබයි. මේ හැර රජයේ මිනින්දෝරු දෙපාර්තුමේන්තුව සහ බිම්සවිය ඇතුළු අනෙකුත් රාජ්‍ය අංශයේ ඉඩම් මැනුම් කිරීමේ කටයුතු අධීක්ෂණය මෙම අංශය මගින් සිදු කරනු ලබයි. එසේම මෙම අංශය මගින් 2013 වර්ෂය තුළ දළ වශයෙන් අක්කර 3384 ක් පමණ විකිණීම් මගින් බැහැර කර ඇත.

i. සියලුම දිස්ත්‍රික්කයන්හි මැනුම් කටයුතු සඳහා උපදෙස් ලබා දී අධීක්ෂණය හා එක් එක් ඉඩම් සඳහා පිඹුරුපත් පරීක්ෂාකර අනුමත කිරීම.

ii. බදුදීම විකිණීම ව්‍යවස්ථාපිත නිශ්චය හා පවුල තුළ පැවරීම් සඳහා අනුමත කරන ලද පිඹුරුපත් අදාළ ආයතන වෙත නිකුත් කිරීම.

iii අවශ්‍යතාවය අනුව ක්ෂේත්‍රයේ මායිම් කටයුතු හා ඉඩම් හඳුනා ගැනීම සඳහා ක්ෂේත්‍ර රාජකාරිවල නියුක්තවීම.

iv ඉඩම් උපරිමය යටතේ ඔප්පු සකස් කිරීම.

## 2013 වර්ෂයේ මැනුම් හා වෙන්කිරීම් අංශයේ ප්‍රගතිය

| මාසය | අනුමත පිඹුරු | කැබලි | ප්‍රමාණය | | | | සංශෝධන | නිකුත් කරන ලද පිටපත් | ඒ සඳහා අය කරන ලද මුදල(රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | අක්කර | රූඩ් | පර්චස් | හෙක්ටයාර් | | | |
| ජනවාරි | 41 | 541 | 209 | 0 | 30 | 84.6583 | 10 | 50 | 62,000.00 |
| පෙබරවාරි | 53 | 353 | 309 | 0 | 30 | 125.1214 | 03 | 29 | 40,000.00 |
| මාර්තු | 49 | 426 | 189 | 2 | 13 | 76.7195 | 07 | 45 | 60,000.00 |
| අප්‍රේල් | 29 | 371 | 144 | 1 | 22 | 59.4298 | - | 21 | 25,000.00 |
| මැයි | 34 | 190 | 121 | 0 | 01 | 48.8664 | 12 | 23 | 30,000.00 |
| ජූනි | 29 | 200 | 56 | 2 | 04 | 22.8778 | 18 | 27 | 29,000.00 |
| ජූලි | 47 | 357 | 202 | 0 | 33 | 81.8282 | 06 | 83 | 91,000.00 |
| අගෝස්තු | 39 | 167 | 714 | 0 | 20 | 288.9902 | 07 | 65 | 97,000.00 |
| සැප්තැම්බර් | 55 | 451 | 431 | 1 | 37 | 174.6128 | 08 | 54 | 56,000.00 |
| ඔක්තෝම්බර් | 35 | 415 | 216 | 0 | 02 | 87.4154 | 07 | 26 | 35,000.00 |
| නොවැම්බර් | 49 | 655 | 430 | 1 | 01 | 174.1196 | 13 | 39 | 45,000.00 |
| දෙසැම්බර් | 32 | 956 | 360 | 1 | 22 | 145.8418 | 04 | 32 | 44,000.00 |
| **එකතුව** | **492** | **5082** | **3384** | **1** | **15** | **1370.4812** | **95** | **494** | **614,000.00** |

## 11. නීති අංශය
සංයුතිය

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ | 01 |
| 2 | නීති නිලධාරි | 01 |
| 3 | නීති සහකාර | 01 |
| 4 | මාණ්ඩලික සහකාර | 01 |
| 5 | උසාවි ලිපිකරු | 01 |
| 6 | ලිපිකරු | 04 |
| 7 | යතුරු ලේඛක | 02 |
| 8 | ක්ෂේත්‍ර නිලධාරි | 01 |
| 9 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 13 |

### I. හැඳින්වීම :-

ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, සිවිල් අභියාචනාධිකරණය, කම්කරු විනිශ්චය සභාව, කම්කරු ආරවුල්, මානව හිමිකම් කොමිෂන් සභාව සහ ඔම්බුඩ්ස්මන් යන ආයතන මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට විරුද්ධව සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් පුද්ගලයින්ට සහ ආයතනවලට විරුද්ධව වශයෙන් සම්පූර්ණ නීතිමය කාර්යයන් **535** ක් සඳහා ලිපිගොනු සැකසීම වාර්තා ඉදිරිපත් කිරීම, පෙරකලාසි සම්බන්ධ කටයුතු, පෙනී සිටීම, නීති උපදෙස් විවිධ පැවරුම් සඳහා ලබාදීම ආදි කටයුතු කොමිසමට එරෙහිව පවතින නඩු සම්බන්ධව ක්‍රියාකිරීම සහ කොමිසම විසින් පවරනු ලබන නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම නීති අංශයේ ප්‍රධාන කාර්යය වේ.

### II. කාර්යයන් :-

- ❋ නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- ❋ දිස්ත්‍රික් කාර්යාලවලට අදාළ නඩු පිළිබඳව අදාළ නීතිඥයින් සම්බන්ධීකරණය කර ගැනීම.
- ❋ ආයතනයේ නීති පිළිබඳ උපදේශන සේවා සැපයීම.

## III. නඩු අවම කිරීමට ගත් ක්‍රියාමාර්ග

- ❋ මැනුම් සිතියම් කිරීමේදී නිවැරදි ක්‍රමවේද අනුගමනය කිරීම.
- ❋ ක්ෂේත්‍ර නිලධාරී පුහුණු කිරීම.
- ❋ නීතිමය අත්දැකීම් අංශ අතර හුවමාරු කර ගැනීම.
- ❋ දිස්ත්‍රික් කාර්යාල සමග නඩු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

## IV. පවතින නඩු සංඛ්‍යාව

| | 2013.01.01 දිනට පැවති නඩු සංඛ්‍යාව | 2013 වර්ෂය තුළ නිම කල සහ සමථයට පත් වූ නඩු සංඛ්‍යාව | 2013 වර්ෂය තුළ පවරන ලද නඩු සංඛ්‍යාව | 2013.12.31 දිනට පැවැති නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 17 | 06 | 08 | 19 |
| අභියාචනාධිකරණය | 32 | 07 | 11 | 36 |
| මහාධිකරණය | 11 | - | - | 11 |
| වාණිජ මහාධිකරණය | 02 | – | - | 02 |
| දිසා අධිකරණය | 417 | 01 | 08 | 424 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 05 | - | - | 05 |
| සිවිල් අභියාචනාධිකරණය | 16 | 03 | 10 | 23 |
| ප්‍රාථමික අධිකරණය | 01 | - | - | 01 |
| කම්කරු විනිශ්චය සභාව | 09 | - | 01 | 10 |
| මානව හිමිකම් කොමිෂන් සභාව | 03 | 03 | 02 | 02 |
| ඔම්බුඩ්ස්මන් | 01 | 01 | 01 | 01 |
| කම්කරු දෙපාර්තමේන්තුව | 01 | 01 | 01 | 01 |
| **එකතුව** | **515** | **21** | **42** | **535** |

**12. විමර්ශන අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 2 | ලිපිකරු | 01 |
| 3 | යතුරු ලේඛක | 01 |
| 4 | ක්ෂේත්‍ර නිලධාරි | 02 |
| 5 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 06 |

**1. කාර්යයන්**

i පුද්ගලයින්ගෙන් සහ ආයතනවලින් ලැබෙන්නා වූ ඉඩම් පැමිණිලි සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරීම.

ii ඊට අදාල පාර්ශ්වයන් කැඳවා පරීක්ෂණයන් පැවැත්වීම හා ගැටලුව විසඳීමට අවශ්‍ය සුදුසුම ක්‍රියාමාර්ගයන් යෝජනා කිරීම.

iii ගැටලු සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ, ස්ථාන පරීක්ෂණ හා විමර්ශන කටයුතු සිදුකිරීම.

**2. 2013 වර්ෂයේදී ඉටු කර ඇති කාර්යයන්**

i. සිදු කරන ලද සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාව - **53**

ii.. ඉදිරි කටයුතු කිරීමට දිස්ත්‍රික් කාර්යාල වලට යොමු කිරීම් සංඛ්‍යාව - **13**

iii. වාහන අනතුරු සම්බන්ධව සිදු කළ මූලික විමර්ශන සංඛ්‍යාව - **03**

**13. මුදල් අංශය**

**සංයුතිය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ගණකාධිකාරී | 01 |
| 2 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 3 | මාණ්ඩලික සහකාර | 02 |
| 4 | ලිපිකරු | 05 |
| 5 | ගිණුම් නිලධාරී | 04 |
| 6 | යතුරු ලේඛක | 01 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 15 |

**කාර්යයන්**

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ මාසික වැටුප් හා දීමනා ගෙවීම් කිරීම.

ii නිලධාරීන්ට අයත් සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල් නියමිත දිනයන්හිදී තැන්පත් කිරීම.

iii මාසික ගිණුම් වාර්තා සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.

iv මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන නියමිත දිනට සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

v. මාසික හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන විගණකාධිපති හා අමාත්‍යාංශය වෙත යොමු කිරීම.

vi ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ලැබෙන්නා වූ ආදායම් අත්‍යාවශ්‍ය රාජකාරී වලට පමණක් වියදම් කර ඉතිරි මුදල් වඩාත් ඵලදායී ලෙස ආයෝජන කාර්යයේ යෙදවීම. දිස්ත්‍රික් කාර්යාල 20 තුළ මුදල් පාලනය, අධීක්ෂණය හා උපදෙස් ලබාදීම, තොග සටහන් පොත් පවත්වා ගෙන යාම.

vii අවසාන ගිණුම් වාර්තාව සැකසීම.

viii ලංකා බැංකුව, මහා භාණ්ඩාගාරය, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන මූල්‍ය ආයතන සමග සම්බන්ධීකරණය

ix මිලදී ගැනීම් කටයුතු

## 14. ආදායම් අංශය

### සංයුතිය

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ | 01 |
| 2 | සහකාර අධ්‍යක්ෂ | 01 |
| 3 | මාණ්ඩලික සහකාර | 01 |
| 4 | ලිපිකරු | 03 |
| 5 | යතුරු ලේඛිකා | 01 |
| 6 | කාර්යාල කාර්ය සහායක | 01 |
| එකතුව | | 08 |

**1.**

i. ඉඩම් බදුදීම්, විකිණීම්වලින් ලැබෙන්නා වූ ආදායම් රුස් කිරීම, හිග බදු මුදල් අයකර ගැනීමට සුදුසු පියවර ගැනීම.

ii බනිජ සම්පත් සහ වෙනත් ආදායම් මාර්ගවලින් ලැබෙන්නා වූ ආදායම් එකතු කිරීම

iii ඉඩම් අත්පත් පරීක්ෂණ සඳහා සහභාගිවීම සහ එයින් ලැබෙන්නා වූ ආදායම රුස් කිරීම.

iv සැගවුණු ඉඩම් සොයා ගැනීමෙන් පසුව එයින් ලැබෙන්නා වූ ආදායම් එක්රුස් කිරීම.

**2. 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය**

| විස්තරය | 2012 වර්ෂය (රු.) | 2013 වර්ෂය (රු) |
|---|---|---|
| ඉඩම් බදුදීම් | 71,782,105.00 | 61,624,696.00 |
| මැණික් ඉඩම් බදුදීම | 1,402,000.00 | 2,042,000.00 |
| ඉඩම් විකිණීම හා අත්පත් වන්දි | 157,535,344.00 | 88,985,633.00 |
| වෙනත් ආදායම් | 22,115,571.00 | 66,010,294.00 |

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් වියදම් ප්‍රකාශය

| | විස්තරය | 2013 රුපියල් | 2012 රුපියල් |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ඉපයීම් | 1 | 218,662,622.17 | 252,835,020.58 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 2 | 99,576,554.08 | 64,502,778.11 |
| **මුළු ආදායම** | | **318,239,176.25** | **317,337,798.69** |
| | | | |
| **වියදම්** | | | |
| පරිපාලන වියදම් | 3 | 190,546,334.52 | 170,365,243.30 |
| සැපයුම් හා අවශ්‍ය දෑ | 4 | 11,798,272.18 | 8,478,882.85 |
| අනෙකුත් ක්‍රියාකාරී වියදම් | 5 | 9,633,455.50 | 4,119,569.62 |
| මූල්‍ය වියදම් | 6 | 5,313,742.73 | 4,642,921.18 |
| **මුළු වියදම** | | **217,291,804.93** | **187,606,616.95** |
| | | | |
| **අතිරික්තය** | | 100,947,371.32 | **129,731,181.74** |
| | | | |
| **කාල පරිච්ඡේදයට අදාල ශුද්ධ අතිරික්තය** | | 100,947,371.32 | **129,731,181.74** |
| | | | |
| 2013.01.01 දිනට ආරම්භක ශුද්ධ අතිරික්තය | | 628,993,676.78 | 461,253,640.69 |
| | | | |
| **2013.12.31 දිනට සංචිත අතිරික්තය** | | **729,941,048.10** | **590,984,822.43** |
| | | | |

# 2013.12.31 දිනට ශේෂ පත්‍රය

| | විස්තරය | 2013<br>රුපියල් | 2012<br>රුපියල් |
|---|---|---|---|
| **වත්කම්** | | - | - |
| ***ජංගම වත්කම්*** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 7 | 76,403,934.92 | 36,058,628.09 |
| ලැබිය යුතු පොලිය | 8 | 21,611,809.68 | 19,162,821.25 |
| ලැබිය යුතු ආදායම් | | 15,386,290.94 | 29,731,610.01 |
| වෙළඳ අනෙකුත් ලැබිය යුතු දෑ | 9 | 2,218,340,803.23 | 2,165,434,692.52 |
| ජංගම ගිණුම් | | - | 3,912,615.00 |
| තැන්පතු හා අත්තිකාරම් | 10 | 53,778,155.89 | 49546252.75 |
| තොග - ලිපිද්‍රව්‍ය | 11 | 1,439,845.04 | 1,722,525.48 |
| | | | |
| | | | |
| ***ජංගම නොවන වත්කම්*** | - | | |
| ආයෝජන | 12 | 881,288,212.63 | 773,092,619.54 |
| දේපල හා යන්ත්‍රෝපකරන | 13 | 59,045,340.66 | 36,084,138.62 |
| ඉඩම් | | 676,169,345.33 | 676,169,345.33 |
| - | - | | |
| | | | |
| **මුළු වත්කම්** | | **4,003,463,738.32** | **3,790,915,248.59** |
| | | | |
| **වගකීම්** | - | | |
| | | | |
| ***ජංගම වගකීම්*** | - | - | - |
| වාණිජ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 14 | 95,361,624.55 | 90,600,701.66 |
| කල්බදු ණයහිමියන් | 15 | 9,051,847.79 | 4,367,565.12 |
| | | | |

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| ***<u>ජංගම නොවන වගකීම්</u>*** | - | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 16 | 37,749,580.00 | 31,950,322.50 |
| කල්බදු ණයහිමියන් | 17 | 10,095,929.37 | 3,649,907.51 |
| වන්දි අවිනිශ්චිත ගිණුම අදියර 1 | | 119,139,914.66 | 126,561,890.82 |
| පාරිතෝෂිත ගෙවීම් අදියර 11 (වන්දි අවිනිශ්චිත ගිණුම අදියර 11) | | 109,959,492.95 | 109,959,492.95 |
| | | | |
| | - | | |
| | | | |
| **ශුද්ධ වටිනාකම** | | | |
| රජයේ දායකත්ව හා භාණ්ඩාගාර ප්‍රදාන | 18 | 1,964,075,000.00 | 1,964,075,000.00 |
| සංචිත | 19 | 928,089,300.90 | 868,765,545.60 |
| සමස්ත අතිරික්තය | | 729,941,048.10 | 590,984,822.43 |
| | | | |
| | | | |
| **ශුද්ධ වත්කම් හා ස්කන්ධය** | | **4,003,463,738.32** | **3,790,915,248.59** |

……………………..
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

……………………..
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

මගේ අංකය / எனது இல. / My No. LP/F/LRC/1/FA/13/07 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 පෙබරවාරි 16 දින

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 56 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2014 සැප්තැම්බර් 26 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 25(ආ) ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ, අස්පෘශ්‍යයන් හා අනෙකුත් දිගුකාලීන වත්කම් විකිණීමෙන් වන මුදල් ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද සභාවේ වාහන විකිණීමෙන් ලද රු. 2,974,443 ක වටිනාකම එසේ දක්වා නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ ඉඩම් විකිණීමේදී ලැබෙන සම්පූර්ණ මුදල සභාවේ ආදායමක් ලෙස ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය දිගින් දිගටම අනුගමනය කර තිබුණි. ඒ අනුව විකුණා තිබුණු ඉඩම්වල පිරිවැය සඳහා ගැලපීම් නොකිරීම තුළින් මූල්‍ය තත්ත්වය හා මූල්‍ය ප්‍රතිඵල නිවැරදි තත්ත්වයක් පෙන්නුම් කර නොතිබුණි. 2006 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා රු. 904,437,579 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. 148,309,388 ක් විකුණුම් ආදායම ලෙස ලැබී තිබුණු අතර සභාවේ අනෙකුත් වත්කම්ද එලෙසම ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ එසේ විකුණා තිබුණු වත්කම්වලින් ලැබී තිබුණු ආදායම රු.2,974,445 ක් විය.

(ආ) උපචිත පදනම අනුගමනය කරගත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම් සටහන් මගින් දක්වා තිබූ නමුත් එයට අනුකූලව කටයුතු නොකළ අවස්ථා ගණනාවක් නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය. එසේ වූ අනාවරණය කර ගැනීම් කිහිපයක් පහත දැක්වේ.

(i) ගිණුම් පිළියෙල කිරීමේදී ලැබිය යුතු බදු ආදායම් හා කලින් ලැබූ බදු ආදායම නිවැරදිව හඳුනාගෙන නොතිබුණි.

(ii) ලැබිය යුතු අධිභාර කිසිවක් ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි දෙක සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුළිය රු.28,480,750 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දිස්ත්‍රික් කාර්යාලවල උපචිත ගොඩනැගිලි කුළිය වූ රු. 113,250 ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි.

### 2.2.4 අසම්භාව්‍ය බැරකම්

---

ඉඩමක අයිතිය ලබාගැනීම සඳහා සභාවට එරෙහිව පවරන ලද නඩුවක පැමිණිලිකරුවන්ට රු.148,715,363 ක් ගෙවීමට 2009 වර්ෂයේදී අභියාචනාධිකරණය තීන්දුවක් ලබා දී තිබුණි. අදාළ පොළියද සමඟ ගෙවිය යුතු මුදල 2014 අගෝස්තු 31 දින වන විට රු.මිලියන 200 ඉක්මවා තිබුණද මෙම වගකීම සඳහා ගිණුම්වල වෙන්කිරීමක් කර නොතිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව වන්දි අවිනිශ්චිත අදියර I හා II යටතේ සමස්ත වගකීම රු.229,099,408 ක් වුවද තක්සේරු හා වන්දි අංශයේ වාර්තා අනුව සභාව විසින් ප්‍රකාශකයින් වෙත ගෙවීමට තිබූ වන්දි මුදල පොළී මුදල සහිතව රු. 590,000,000 ක් විය. ඒ අනුව රු.360,900,592 ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් මෙහි නිවැරදිතාවය තහවුරු කරගැනීමට විගණනයේදී නොහැකි විය.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගණුදෙනුවල නිවැරදිතාව සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂය | ශේෂය (රු.) | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| <u>ස්ථාවර වත්කම්</u> | | |
| ඉඩම් | 676,169,345 | සම්පූර්ණ ඉඩම් පිළිබඳ විස්තර ඇතුළත් උපලේඛන |
| ගොඩනැගිලි | 4,586,223 | වත්කම් ලේඛනය හා සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| පරිගණක හා උපාංග | 6,771,162 | |
| ලී බඩු හා සවිකිරීම් | 857,543 | |
| මෝටර් රථ | 75,443,715 | |
| කාර්යාල උපකරණ | 19,436,340 | |
| සුභසාධන උපකරණ | 954,146 | |
| <u>ණය හා අත්තිකාරම්</u> | | |
| ලෝහෝර් ආර්යා අරමුදල | 300,000 | ශේෂ සනාථ කිරීම් |
| ඉන්ධන අත්තිකාරම් | 185,000 | |
| බොල්ණය ප්‍රතිපාදන | 8,270,356 | වෙන් කිරීම් සඳහා වූ පදනම |
| ලැබියයුතු ආදායම් | 29,731,610 | විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථ කිරීම් |
| වන්දි අවිනිශ්චිත ගිණුම | 229,099,408 | විස්තරාත්මක උපලේඛන |
| ඉඩම් අත්පත් කරගැනීම් | 55,147,644 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ වර්ෂ 11 කට වැඩි රු. 2,158,312,885 ක් වූ වෙළඳ ණයගැති ශේෂ සහ වර්ෂ 14 කට වැඩි රු. 2,921,575 ක් වූ විවිධ ණයගැති ශේෂ සඳහා අඩමාණ ණය වශයෙන් රු.8,270,356 ක් වෙන්කර තිබුණද එම ණය අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද සභාව ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණු අතර, මෙම ණය අයකර ගැනීමට ඇති හැකියාව අවම තත්ත්වයක පැවතුණි.

(ආ) සභාවේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,135,598,154 ක් රාජ්‍ය ආයතන 06 කින් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවල සභාවට නිරවුල් කළ යුතු ශේෂයන් නොපැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) සභා සේවකයන් 49 දෙනෙකුගෙන් 2010 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති එකතුව රු.732,056 ක් වූ ණය ශේෂයන්ගෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අයකර ගෙන නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නිති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත** | |
| (i) 45 (i) (අ) (iii) වගන්ති | කොමිෂන් සභාවට අදාළ විෂය භාර ජනාධිපති කාර්යාලය නියෝජනය කරන සාමාජිකයකු පත් කර නොතිබුණි. |
| (ii)33 වගන්තිය | හිමිකම් තහවුරු නොවූ ලිපිගොනු 71 ක් සඳහා වන්දි හා පොළී මුදල් සිවිල් අධිකරණයේ තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) 1971 අංක 38 දරන මුදල් පනත** | |
| 11 වගන්තිය | ස්ථාවර තැන්පතු වශයෙන් ආයෝජනය කර තිබුණු රු. 85,000,000 ක් සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | සභාව එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වී නොතිබීම හේතුවෙන් ඒ මත සමාලෝචිත වර්ෂයේදී අයවිය යුතු බදු ආදායම වන රු. 26,239,515 ක් රජයට අහිමි වී තිබුණි. |

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

| | |
|---|---|
| II පරිච්ඡේදය 13.3 වගන්තිය | අධ්‍යක්ෂ මුදල් තනතුර වර්ෂ 06 කට වැඩි කාලයක් පුරප්පාඩුව පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි. |

**(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | |
|---|---|
| (i) මුදල් රෙගුලාසි 502(2) | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 134 (3) | අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත එවා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | සභාවේ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා එවා නොතිබුණු අතර 2012, 2013 වර්ෂයන්හි සිදුව තිබුණු අනතුරු 2 ක් සම්බන්ධයෙන් මූලික විමර්ශන සිදුකිරීම සඳහා මාස 6 කට ආසන්න කාලයක් ගත කර තිබුණු අතර අවසන් වාර්තාවන් 2014 ජනවාරි 31 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඊ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.1 හා 7.11.1 වගන්ති** | සභාවේ වාහනයක් රු. 535,405 ක් වියදම් කර අළුත්වැඩියා කර තිබුණු අතර ලංසු ඇගයීමේ කාර්යයන් ඇගයීමේ කමිටුවකින් සිදු කරනු වෙනුවට තාක්ෂණික නිලධාරියෙකු විසින් පමණක් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. |

**(උ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

| | |
|---|---|
| (i) 4.2.6 ඡේදය | කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යය සාධන වාර්තා පිළියෙල කර අදාල අමාත්‍යාංශය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ii)6.5.1 වගන්තිය

මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපත් අදාළ අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සභාව එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 97,096,038 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.129,731,182 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,635,144 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සැසඳීමේදී ඉඩම් අත්පත් වන්දි ආදායම රු.105,896,914 කින් සහ ඉඩම් බදු ආදායම රු.11,084,170 කින් පහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ජංගම අනුපාතය 1 : 22.98 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයට වූ ජංගම වත්කම් වලින් අයිතම 24 කට අදාළ රු.2,158,312,885 ක් හෙවත් සියයට 90 ක් වර්ෂ 12 ඉක්මවූ හා අයකර ගැනීම අවිනිශ්චිත තත්වයක පවතින ලැබිය යුතු ණය ශේෂයන්ගෙන් යුක්ත වූ අතර එය මුළු වත්කම්වලින් සියයට 54 ක් විය. ඒ අනුව සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළින් ආයතනයේ වත්කම් හා බැරකම් සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ තථ්‍ය තත්ත්වයක් පිළිබිඹු කරන බවට නිශ්චය කළ නොහැකි විය.

(ආ) සභාව සමාලෝචිත වර්ෂය සඳහා රැස් කර තිබූ ඉඩම් බදු ආදායම රු. 60,697,934 ක් වූ අතර ඉඩම් විකිණීමෙන් ලැබී තිබුණු ආදායම රු. 93,054,187 ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව බදු ආදායම සහ ඉඩම් විකිණීමෙන් ලැබී තිබුණු ආදායම පිළිවෙලින් රු. 11,084,170 කින් හෙවත් සියයට 15 කින් හා රු. 8,334,076 කින් හෙවත් සියයට 8 කින් පහළ ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන තිබුණු ඉඩම් වෙනුවෙන් ඉඩම් අත්පත් වන්දි ආදායම ලෙස රු. 55,147,644 ක් ලැබී තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව එම ආදායම රු.105,896,914 කින් හෙවත් සියයට 65.8 කින් පහළ ගොස් තිබුණි.

3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මූලා‍ය ප්‍රකාශනවල සභාවට එරෙහිව හා සභාව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව 626 ක් ලෙස දක්වා තිබුණද රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කිරීම සඳහා කැඳවන ලද තොරතුරු අනුව නඩු සංඛ්‍යාව 435 ක් විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාව විසින් ප්‍රකාශකයින් සඳහා ගෙවිය යුතු වන්දි පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වර්ෂ කිහිපයක දී වන්දි අවිනිශ්චිත I ගිණුමෙන් වන්දි ගෙවා ඇති ආකාරය පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | වන්දි අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය රු. | වන්දි අවිනිශ්චිත ගිණුමේ අවසාන ශේෂය රු. | ගෙවා ඇති මුදල රු. | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 2009 | 142,437,351 | 140,769,719 | 1,667,632 | 1.17 |
| 2010 | 140,769,719 | 138,136,888 | 2,632,831 | 1.87 |
| 2011 | 138,136,888 | 131,287,683 | 6,849,205 | 4.96 |
| 2012 | 126,561,890 | 126,561,890 | 4,725,793 | 3.6 |
| 2013 | 119,139,915 | 119,139,915 | 7,421,976 | 5.86 |

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 28 වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරුණු ඉඩම් සඳහා සභාව විසින් වන්දි ගෙවිය යුතු වුවද සභාවේ පසුගිය වර්ෂ 5 ක කාර්ය සාධනය සලකා බැලීමේදි වන්දි හා අවිනිශ්චිත I ගිණුමෙන් වර්ෂ 5 ක් තුළ වන්දි මුදල් නිරවුල් කිරීම සියයට 1.17 ත් සියයට 5.86 ත් දක්වා වූ අඩු පරාසයක පැවති බව නිරීක්ෂණය විය. තවද වන්දි අවිනිශ්චිත II ගිණුමෙන් වන්දි නිරවුල් කිරීමක් සිදුවී නොතිබුණු අතර රු. 109,959,493 ක් වූ එහි ශේෂය වර්ෂ ගණනාවක් පුරා නොවෙනස්ව පැවතුනි.

(ආ) සභාවට පැවරී ඇති ඉඩම් සම්බන්ධයෙන් තවදුරටත් ලිපිගොනු 600 කට ආසන්න ප්‍රමාණයකට තොරතුරු ලබාගත යුතුව තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) හිමිකම් තහවුරු කර නොමැති "ප්‍රකාශන ලිපිගොනු" 104 කින් ප්‍රකාශන ලිපිගොනු 49 කට අදාළ අක්කර 66,161 රූඩ් 01 පර්චස් 28 ක බිම් ප්‍රමාණයක් සඳහා වන්දි මුදල, රු.3,136,963 ක් ලෙස නිශ්චය කර තිබූ නමුත් ඉතිරි ලිපිගොනු 55 ට අදාළ වන්දි මුදල නිශ්චය කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ ඉඩම් විකුණුම් ආදායමින් සියයට 60 ක් මෙහෙයුම් වියදම් ලෙසද සියයට 40 ක් සංචිත ලෙසද වෙන් කිරීම සඳහා වූ කොමිෂන් සභා අනුමැතියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) යතුරු පැදියක් විකිණීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන තිබුණද එම අනුමැතිය උපයෝගීකර ගෙන තවත් වාහන තුනක් විකුණා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී අනතුරකට ලක්ව තිබුණු වාහනයක් රු.1,434,302 ක් වැයකර අළුත්වැඩියා කර තිබූ අතර එහි අවසාන ඇස්තමේන්තුව සඳහා ජනාධිපති කාර්යාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද රක්ෂණ වන්දියෙන් ආවරණය නොවූ රු. 82,219 ක මුදල පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව අදාළ සිද්ධියට සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවේ ඉඩම් බදු දීම සහ විකිණීම පිළිබඳව සිදු කළ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) හුඹහපිටිය වත්ත ඉඩමේ කොටසක 2010 වර්ෂයේ සිට අනවසරකරුවන් පදිංචි වී සිටින ඉඩම නිරවුල්කර ගැනීමට පියවර ගෙන නොතිබුණු අතර 2009 වර්ෂයේදී බදු පදනම මත පුද්ගලයෙකුට ලබා දී තිබුණු අක්කර 03 රූඩ් 01 පර්චස් 18.90 ක් වූ ඉඩමේ තවත් කොටසක් සඳහා 2014 ජනවාරි 31 දක්වා බදු ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ii) මොණරකැලේ වත්තෙන් අක්කර 280 ක් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව 2011 පෙබරවාරි මාසයේදී පෞද්ගලික සමාගමකට තිස් අවුරුදු කාලයකට බදු දී තිබුණු අතර සමාගම බදු අත්තිකාරම් ලෙස රු. 1,000,000 ක් 2011 ඔක්තෝබර් මාසයේදී ගෙවා ඉඩම භුක්ති විඳිමින් සිටියද භුක්තිය භාරදීමේ සහතිකයක් නිකුත් කිරීමට හෝ බදු ගිවිසුමකට එළඹීමට 2014 අගෝස්තු 13 දින දක්වාම සභාව කටයුතු කර නොතිබුණි. තවද 2013 මාර්තු මාසයේ ලබාගෙන තිබුණු 2011 සිට 2016 දක්වා කාලයට අදාළ තක්සේරු වාර්තාව අනුව අයකර ගතයුතු රු.10,764,622 ක බදු මුදල 2014 අගෝස්තු 14 දින දක්වාම අයකර ගෙන නොතිබුණි.

(iii) ලේලන්ඩ් වත්ත ඉඩමෙන් රූඩ් 01 පර්චස් 10 ක ප්‍රමාණයක් රු. 80,000 ක මුදලකට පෞද්ගලික ආයතනයකට 2006 ඔක්තෝම්බර් 20 දින සිට බදු දී තිබුණු නමුත් බදු ගිවිසුමකට එළඹීමට 2014 ජනවාරි 30 දින දක්වාම සභාව කටයුතු කර නොතිබුණි.

(iv) කැටන්දොළ වත්ත ඉඩමෙන් පර්චස් 25.6 ක් 2003 වර්ෂයේදී විකිණීමෙන් පවරා දී තිබුණද එම ඉඩමෙහි සභාවට අයත් රු.260,000 කට තක්සේරු කරන ලද ගොඩනැගිල්ලෙහි වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

තවද, ඉඩමේ ඉතිරි කොටසෙහි අනවසර පදිංචි කරුවන් සිටින බවත්, ඔවුන් කිසිදු මුදලක් නොගෙවා ඉඩම භුක්ති විඳිනු ලබන බවත් විගණන පරීක්ෂාවලදී අනාවරණය වුවද සභාව අංක 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ සංශෝධන පනතේ 42(ඇ) හි 1,2,3,4 වගන්ති අනුව අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි .

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි පිටකන්ද වත්ත නැමති ඉඩමෙන් අක්කර 06 ක ප්‍රමාණයක් 1979 සැප්තැම්බර් 19 දින පේෂකර්ම දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණද එම පවරාදීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුවී නොමැති බැවින් කොමිෂන් සභාවට කිසිදු මුදලක් ලැබී නොමැති බව සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි. තවද, පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් අදාල කාලය තුළ 99 අවුරුදු බදු පදනම මත ඉඩම රු. 5,400,000 කට පුද්ගලික සමාගමකටද එම සමාගම විසින් 2005 වර්ෂයේදී රු.400,000 කට තවත් සමාගමක් වෙතද බදු දී තිබුණු බව නිරීක්ෂණය වූ අතර වර්තමානයේ ඉඩම භුක්ති විඳින සමාගම සමඟ බදු ගිවිසුමකට එළඹීමට සභාව 2014 නොවැම්බර් 30 දක්වාම කටයුතු කර නොතිබූ අතර රු. 4,444,622 ක බදු මුදලක් තව දුරටත් පේෂකර්ම දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතුව තිබුණි.

(vii) මොණරාගල දිස්ත්‍රික්කයේ යාල්බෝව වත්තෙන් අක්කර 196 රූඩ් 0 පර්චස් 04 ක ප්‍රමාණයක් 1975 සිට 1982 දක්වා සීනි සංයුක්ත මණ්ඩලයට භාරදී තිබුණද එම කාලය තුළ සභාව වෙත කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(viii) සභාව විසින්1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පවරා ගෙන තිබුණු කුඹල්ගොඩ වතු යායෙන් හෙක්ටයාර 2.02 ක් 1986 සැප්තැම්බර් 02 දිනැති අංක 417/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් ජනතා වතුසංවර්ධන මණ්ඩලය වෙත පවරා තිබුණු අතර 1986 වර්ෂයේදී මණ්ඩලය විසින් මෙම ඉඩම තිස් අවුරුදු පදනම මත පුද්ගලයෙකුට බදු දී තිබුණි. රත්නපුර දිස්ත්‍රික් අධ්‍යක්ෂගේ 2005 සැප්තැම්බර් 30 දිනැති ලිපියකින් අක්කර 12 ක් වූ කුඹල්ගොඩ වත්ත ඉඩමෙන් අක්කර 06 ක ප්‍රමාණයක් ක්ෂේත්‍රයේ නිදහස්ව පවතින බවට වාර්තා කර තිබුණු අතර එම කරුණු දැක්වීම පදනම් කරගෙන අපනයන බෝග ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා නීත්‍යානුකූල නොවන ලෙස වෙනත් අයෙකුට එම ඉඩම බදු දීමට සභාව විසින් කටයුතු කර තිබුණි. ඔහු විසින් අනවසරයෙන් ඉඩමේ මැණික් ගැරීමට කටයුතු කර තිබුණු අතර නීත්‍යානුකූල බදුකරුට ඉඩම පරිහරණය කිරීම අවුරා තිබුණි.

(ix) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි තණහේන වත්ත ඉඩමෙන් අක්කර 01 රූඩ් 02 පර්චස් 09 ක් තිස් අවුරුදු බදු පදනම මත පුද්ගලික ආයතනයක් වෙත බදු දී තිබූ අතර ඔවුන් එම ඉඩම වෙනත් ආයතනයක් වෙත අතුරු බදු දී තිබුණි. සභාව ඉඩම නව කර්මාන්තායතනයක් වෙත බදු දීමට තීරණය කර තිබූ අතර පෙර ආයතනය වෙත බදු දීමේදී එවකට සිට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය පාදක කරගෙන බදු දීමෙන් පවරා තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර පාර්ශවයන් සහ සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 402 දෙනෙකු විසින් ඉඩම් ලබාගැනීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 08 දක්වා කාලයක් තුළ තැන්පත් වශයෙන් රු.11,772,992 ක් ගෙවා තිබුණද ඔවුන්ට ඉඩම් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 වර්ෂයේදි රු. 6,770,644 කට මිලදී ගෙන තිබුණු වාහනයක් අනතුරුවලට ලක්වීම නිසා 2012 හා 2013 වර්ෂවල පිළිවෙලින් රු. 682,681 ක් හා රු. 620,050 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු අතර 2013 දී රු. 517,363 කට අළුත්වැඩියාවක් කිරීමට තිබුණද එම අළුත්වැඩියාව කිරීමට කටයුතු නොකර රු. 22,61,900 කට 2014 ඔක්තෝබර් 02 දින වෙන්දේසියේ විකුණා තිබුණි. අවුරුදු 04 ක් වැනි කෙටිකාලයක් තුළ රු. 6,770,644 ක් වටිනා වාහනයක් ධාවනයෙන් ඉවත් කිරීම විගණනයේදී මතභේදයට තුඩු දෙන්නකි.

## 4.4 දූෂ්‍ය අක්‍රමිකතා

අම්පාර දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයාගේ කාර්යාල නිල කාමරයේ ලිපිගොනු හා පාවිච්චි කළ මුදල් කුවිතාන්සි පොත් 2011 දෙසැම්බර් 20 දින සොරා ගෙන තිබුණු අතර 2014 වර්ෂයේදි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා ප්‍රධාන කාර්යාලයට මාරු කර තිබුණි. 2011 වර්ෂයේ මුල් මාස 03 ට අදාල බැංකු ගත කර නොතිබුණු මුදල රු.1,299,750 ක් වූ අතර එම මුදල 2014 වර්ෂයේ අවස්ථා 06 දී සභාපතිවරයාගේ නියෝගය මත දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයාගෙන් සභාව අයකරගෙන තිබුණි. 2013 වර්ෂයේ මාස 3කට අදාල ආදායම ලෙස ගිණුම්ගත වී තිබුණේ රු. 14,480 ක් පමණක් වන අතර එම කාලයට අදාලව සභාවට නිශ්චිතව ලැබිය යුතුව තිබුණු ආදායම කොපමණද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි. තවද මෙම දිස්ත්‍රික් අධ්‍යක්ෂකවරයා සම්බන්ධයෙන් සභාව විනයානුකූලව කටයුතු කර ද නොතිබුණි.

**4.5** හඳුනාගන්නා ලද පාඩු

පරිගණක මෘදුකාංග පැකේජයක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයකට 2002 වර්ෂයේදී ගෙවා තිබුණු රු. 1,700,000 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයක් පැවැත්වෙන බවත් මෙවැනි ආයතනයක් නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි.

**4.6** කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2012 ඔක්තෝබර් 03 දිනැති අංක DMS/E2/01/7/008/2 දරන ලිපිය ප්‍රකාරව සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 307 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවයේ යොදවා තිබූ සංඛ්‍යාව 107 ක් විය. අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 24 ක් පුරප්පාඩුව පැවති අතර මින් තනතුරු 13 ක් මාණ්ඩලික තනතුරු විය.

**5.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**5.1** ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් 07 ක් සඳහා වැය ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණු අතර සමහර ක්‍රියාකාරකම් සඳහා වගකිවයුතු නිලධාරීන් සඳහන් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකම් 08 ක් සඳහා ඉදිරිපත් කර තිබූ ඉලක්කයන් කාල වකවානුවලට බෙදී යන ආකාරය දක්වා නොතිබුණු අවස්ථාවන්ද ඇතැම් ක්‍රියාකාරකම්වල සමස්ථ ඉලක්කය කාල වකවානුවලට බෙදී ගොස් ඇති ඉලක්කයන්හි එකතුව සමඟ නොගැලපුණු අවස්ථාවන්ද නිරීක්ෂණය විය.

(ඇ) නීතිමය ගැටළු සඳහා වැය ඇස්තමේන්තු සැලසුම් කර ඉලක්කයන් ලබා දී එය ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තාව අනුව ක්‍රියාකාරකම් 10 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාවට නංවා නොතිබුණු අතර ක්‍රියාකාරකම් 14 ක ප්‍රගතිය සියයට 2 සිට සියයට 48 දක්වා අඩු පරාසයක පැවතුණි. තවද ක්‍රියාකාරී සැලැස්ම අනුව කරන ලද කාර්යයන්හි ප්‍රගතිය දැක්වෙන වාර්තාවෙහි ක්‍රියාකාරකම් 03 ක් ක්‍රියාත්මක නොකර ඒ සඳහා වියදම් දරා තිබුණු අවස්ථාවන්ද විගණනයේ දී නිරීක්ෂණය විය.

**5.2 අභ්‍යන්තර විගණනය**

2013 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලසුමට ඇතුළත් ක්ෂේත්‍ර 04 ක් ආවරණය කිරීමට අපොහොසත් වී තිබුණි.

**5.3 විගණන කමිටු**

සභාව ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පවතින නමුත් එහි නියෝජිතයෙකු විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් සාමාජිකයෙකු ලෙස සහභාගී කර ගෙන නොතිබුණි.

**5.4 අයවැය ලේඛනමය පාලනය**

2013 වර්ෂයේ අයවැයගත ආදායම් වියදම් හා තථ්‍ය ආදායම් වියදම් පරික්ෂාවේදී ආදායමෙහි සියයට 1 සිට සියයට 4,405 දක්වා විචලනයන් හා වියදමෙහි සියයට 7 සිට සියයට 348 දක්වාද සැලකිය යුතු විචලනයන් අනාවරණය වූ අතර අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලනකාරකයක් ලෙස යොදාගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2014 අගෝස්තු 13 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

(අ) ආදායම් පාලනය
(ආ) මුදල් පාලනය
(ඇ) වාහන පාලනය
(ඈ) ලේඛන පවත්වා ගැනීම

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

lp IA/G/406 LP/F/LRC/1/FA/13/07 2014.11.

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**<u>ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

ශීර්ෂගත කරුණට අදාළව ඔබ විසින් මා වෙත යොමු කරන ලද 2014.11.12 දිනැති විගණකාධිපති වාර්තා කෙටුම්පත හා බැඳේ.

එකී විගණකාධිපති වාර්තා කෙටුම්පතින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ සවිස්තර පිළිතුරු වාර්තාව පහත සඳහන් පරිදි වේ.

2.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

2.2.1. **<u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>**

(අ) වර්ෂය තුල විකුණන ලද වත්කම් ඉතා පැරණි ඒවා බැවින්, ඒවාට අදාල පිරිවැය පිළිබඳ තොරතුරු අප වෙත නොමැති බැවින්, එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගලපා ලාභය හෝ අලාභය ගණනය කිරීමට නොහැකි වී ඇත. 2013 වසර තුල විකුණන ලද වාහන 1990 ගණන්වල අප වෙත ලැබිය යුතු මුදල් වෙනුවෙන් පටක හා සේද ආයතනය පාවිච්චි කර අප වෙත ලද වාහන වේ. එහි ගැණුම් මිළ කොපමණ ද යන්න සඳහන් කර නොමැති අතර, සොයා ගැනීමේ හැකියාවක් ද නොපවතී.

(ආ) ඉඩම් බදු මුදල් වාර්ෂිකව අප වෙත ගෙවිය යුතු වුවත් එය දීර්ඝ කාලයක සිට අප වෙත නොලැබෙන අවස්ථාවලදී එම හිග මුදල් සඳහා 10% ක අධිභාර මුදලක් ද ඇතුලත්ව බදු මුදල් ගණනය කර අයකර ගන්නා ලෙස දුන් දැනුම් දීමකට අනුව මෙසේ අධිභාර මුදල් අයකර ගනු ලබන අවස්ථා දැකිය හැක.

අප විසින් අයකරනු ලබන වාර්ෂික බදු මුදල ද ආයෝජකයින්ට දැරීමට නොහැකි අවස්ථාවක අනෙකුත් පොදු කාර්ය වියදම් ද ඉහල ගොස් පවතින මෙවැනි යුගයක 10% අධිභාර මුදලක් ද ගෙවීමට අපහසු බවට බදුකරුවන් අප දැනුවත් කර ඇත. මෙම මුදල හුදෙක්ම බදු කලට වේලාවට ගෙවීම සඳහා බදුකරුවන් පෙළඹවීම සඳහා කොම්පන් සභාව විසින් ගනු ලැබූ තීරණයකි. මෙම මුදල ස්ථිරවම අය කරගත හැකි ද යන්න පිළිබඳව නිශ්චිතවම තීරණය කල නොහැකි බැවින්, මෙය ලැබියයුතු බදු ආදායම ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත. ආයෝජකයින් දිරිමත් කිරීම රටේ ආර්ථිකයට ඉතා වැදගත් කාර්යයක් ලෙස සලකා කොම්පන් සභාව විසින් වරින් වර ගනු ලබන තීරණයන් මත මෙම අධිභාර මුදල අයකරනවාද නැද්ද, පවතින සාධක මත අඩු කරනවාද යන්න තීරණය කරනු ලැබේ. ඒ අනුව අධිභාර මුදල ලැබෙන අවස්ථාවේදී ආදායමක් ලෙස හඳුනා ගැනීම ප්‍රතිපත්තිය වේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශණවල ඇතුලත් කිරීම හා ප්‍රායෝගික තත්වයන් අනුව සුදුසු වැඩ පිළිවෙලක් පිළිබඳව ඉදිරියේදී කොම්පන් සභාවේ අවධානයට ලක් කිරීමට කටයුතු කරමි.

(ඈ) ගිණුම් තැබීම සඳහා උපචිත පදනම අනුගමනය කර ඇත.

### 2.2.2. ගිනුම්කරණ අඩුපාඩු

(අ) ස්ථාවර තැන්පතු සඳහා පොලිය නිවැරදිව ගිණුම් ගත කර ඇති අතර, දැනට කොම්පන් සභාව සතුව විවිධ බැංකුවල ස්ථාවර තැන්පතු සහතික 89 ක් පමණ පවතින අතර, මෙම ඉදිරිපත් කරන කරුණු කුමන ආයෝජනයට අදාළද යන්න තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් අදාළ විස්තර නිශ්චිතව ලබා දීමෙන් පසු පැහැදලි කිරීමක් කළ හැකි වේ.

(ආ) මෙම තැන්පතුවට අදාළ පොලිය , පොලිය ලැබෙන අවස්ථාවේදී එනම්, තැන්පතුව අලුත් වීමේදී ප්‍රාග්ධනිත කරන බැවින් එතෙක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්වල සටහන් කර ඇත. මෙය 2014.09.03 දින කල් පිරෙන බැවින් එදිනට එම පොලී මුදලට අදාළව ගිණුම් තබනු ලැබේ. එතෙක් ලැබිය යුතු පොලි ගිණුමේ දැක්වෙන රු.1,270,677/-ක මුදල නිවැරදිව ගිණුම් ගතකර ඇත.

(ඇ) රු. 79,444,335 /- ක් වන භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය ගණනය කිරීමේදී දින ගණනෙහි ඇති වූ වෙනස්කම මත මෙම රු. 85,957/- ක මුදල වැඩියෙන් ගණනය වී ඇත. එය ඉදිරියේදී නිවැරදි කර සටහන් තැබීමට උපදෙස් දෙන ලදී.

(ඈ) උත්සව අත්තිකාරම් සහ පාසල් පොත් ණය වෙනුවෙන් ඇතුලත් කල යුතු රු.3500/- ක චාරික මුදල් විශේෂ උත්සව අත්තිකාරම් ගිණුමට පිටපත් වී ඇත. මෙය දැනට නිවැරදි කර ඇත. ( මෙය 14(2)C චාර්තාවට අනුව රු. 7000/- ක් වැරදි ලෙස සටහන්වි ඇති අතර, එය රු. 3500/- ක් විය යුතුය.)

(ඉ) එන්. පී. කුමාරි මිය විසින් ලබගත් විශේෂ උත්සව අත්තිකාම් වූ රු. 4500/- ක මුදල ලෙජරයේ නිවැරදිව සටහන් කර දැනට අය කර ගෙන ඇත. කේ.ආර්.ආර්.ජීවනී මෙය විසින් ලබාගත් එක් මාසික ණය මුදලේ ශේෂය වූ රු. 6725/- ක මුදලද ලෙජරයේ නිවැරදිව සටහන් කර දැනට අය වී ඇත. මේ අනුව රු. 11225/- ක මුදල දැනට අය වි ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ඩබ්ලිව්. ලියනගේ මයා | උත්සව අත්තිකාරම් | රු. 2500/- | |
| | විශේෂ අත්තිකාරම් | රු. 3000/- | |
| | පාසල් පොත් ණය | රු. 4062/- | |
| | | | රු. 9562/- |
| බී. එම්. ධර්මරත්න මයා | උත්සව අත්තිකාරම් | රු. 1000/- | |
| | විශේෂ උත්සව අත්තිකාරම් | රු. 1000/- | |
| | | | රු. 2000/- |
| | | | රු.11562/- |

රු. 11562/- ක් වූ ඉහත ණය මුදල් 2013.12.31 දිනට ලෙජරයේ ඇතුලත් කර කපා හැර ඇත. ඒ අනුව ඔවුන්ගෙන් අය විය යුතු ශේෂයක් නොමැත.

(ඊ) පෙන්වා දී ඇති අඩුපාඩුව සකස් කර අපගේ ගිණුම් වාර්තාවලට අනුව නිවැරදිව ගිණුම් ගතකර ඇත.

(උ) අනියම්, තාවකාලික හා අභ්‍යාසලාභී පදනම මත බඳවා ගත් සේවකයින්ගේ සේවා කාලය මාස 03 න් 03 ට හෝ 06 න් 06 ට බණ්ඩනය වීම සිදු වේ. මෙහිදී සේවා දිගුව ස්ථිරද, නැද්ද යන්න හරියටම කිව නොහැකි බැවින් මේ සඳහා වැටුප උපචිත නොකරන ලදී. ඉදිරියේදී අදාල වර්ෂයට සේවා දිගුවක් ලබා දී ඇති නිලධාරීන් පදනම් කර ගෙන මෙය නිවැරදි කර ගන්නා බව දන්වමි.

(ඌ) රත්නපුර ෆාම්ගාඩ්න් වත්තට අදාල ගොඩනැගිල්ල වෙනුවෙන් දරන ලද වියදම ප්‍රාග්ධනිත කරන ලද නමුත් එයට අදාල ක්ෂය ගණනය කිරීම ගිණුම්වලින් මගහැරී ඇත. ඒ අනුව ගොඩනැගිලි ක්ෂය රු.26.051/- කින් අඩු වී ඇත. වර්ෂය තුල කල්බදු ක්‍රමය මතමිල දී ගත් මෝටර් රථ අදාල වර්ෂයට ක්ෂය ගණනය කිරීම ගිණුම්වලින් අත්හැරී ඇත. මේ අනුව මෙම ක්ෂය ගැලපුම දැනටමත් ගිණුම්වලින් නිවැරදි කර ගැනීමට අධ්‍යක්ෂ/මුදල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

(එ) දැනටමත් නුවරඑළිය පිහිටි ලිඳුල බංගලාව තක්සේරු කර ඇත. රත්නපුර ෆාම්ගාඩ්න් වත්තේ කාර්යාල ගොඩනැගිල්ල තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, 2014 වසරේ ගිණුම්වලට අදාල ගැලපීම් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

(ඒ) මෙම විකුණන ලද වාහන කොම්පනි සභාව වෙත ලැබිය යුතු මුදල් වෙනුවෙන්, 1990 ගණන් වල පටක හා සේද කර්මාන්ත ආයතනයෙන් අප වෙත ලැබුණු පාවිච්චිකරන ලද වාහන වේ. මෙම වාහන 3 ට අදාල පිරිවැය කොපමණ ද යන්න දැනගත නොහැකි බැවින්, එයට අදාල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගැලපීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධව ඔබ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස අධ්‍යක්ෂ/මුදල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ඔ) ඉහත (උ) පිළිතුරට අනුව වැටුප් ගණනය නොකිරීම මත මෙය වෙනස් වී ඇත. එය ඉදිරියේදී නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

(ඔ) එල්.ආර්.සී. 181802 දරණ රිසිට්පතට අදාල ලැබීම දෙසැම්බර් මස දෙවරක් මුදල් පොතට ඇතුලත් වීම මෙයට හේතුවන අතර, එය 2014 ජනවාරි මස බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කිරීමේදී හෙළිදරව් වූ බැවින්, එම මස තුල නිවැරදි කර ගන්නා ලදී.

(ක) 2013.12.31 දිනට ලිපිද්‍රව්‍ය තොග ගණනය කිරීමේදී දිස්ත්‍රික් කාර්යාලවල හා ප්‍රධාන කාර්යාලයේ ඉතිරි තොග ගණන් ගනු ලැබේ. මෙහිදී දිස්ත්‍රික් කාර්යාලයේ සහ ප්‍රධාන කාර්යාලයේ අංශ අතර භෞතික තොග සත්‍යාපන වාර්තාවට ඇතුලත් කර ඇත.

වැඩිම තොග ප්‍රමාණයක් ඇතුලත් වන්නේ මුදල් අංශයට අයත් ප්‍රධාන ගබඩාවේ වේ. මුදල් අංශයේ තොග සමීක්ෂණ වාර්තාවට අදාල අංශයේ ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය ඇතුලත් කලද, ගබඩාවේ තිබෙන තොගය විශාල බැවින්, එය ඇතුලත් නොකරනු ලැබේ. ගබඩාවේ පත්වාගෙන යනු ලබන බඩු වට්ටෝරු පොතට අනුව ශේෂය හා භෞතික තොගය පරීක්ෂා කර, එම ලේඛණයේ නිවැරදිතාවය තහවුරු කරගනු ලැබේ. ඒ අනුව ගිණුම් සැකසීම සඳහා තොග වටිනාකම දැක්වෙන ශේෂය ලබා ගනු ලැබේ. ඒ අනුව රු. 1,334,403/- ක ශේෂය ගබඩාවේ 2013.12.31 දිනට ලිපිද්‍රව්‍ය තොගයේ වටිනාකම බැවින්, මෙය නිවැරදි වේ.

### 2.2.3 <u>අසම්භාව්‍ය බැරකම් ඃ</u>

කොම්පත් සභාව සතුව පවතින නඩු ප්‍රමාණය හා ඒ සඳහා ඉදිරියේදී ගෙවියයුතු වන වන්දි ප්‍රමාණය පිළිබඳව අසම්භාව්‍ය බැරකමක් සභාව සතුව පැවතියද එම නඩු කුමන අවස්ථාවක අවසන් වේද, ඒ සඳහා කොපමණ ප්‍රමාණයක් ගෙවිය යුතුද යන්න පිළිබඳ ඇස්තමේන්තු කළ නොහැකි බැවින්, කොම්පත් සභාව සතුව පවතින නඩු ප්‍රමාණය පමණක් මූල්‍ය ප්‍රකාශනවලට සටහනක් වශයෙන් ඉදිරිපත් කරන ලදී. මෙහි සඳහන් විශේෂ නඩුව සම්බන්ධයෙන් ගෙවීම් වලට අදාල විකල්පයන් පිළිබඳ සාකච්ඡා කරමින් පවතින අතර, ඒ පිළිබඳ අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් මත විශේෂ අභියාචනයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව පියවර ගැනීමට නියමිතව පවතී.

### 2.2.4 <u>පැහැදිලි නොකල වෙනස්කම්</u>

(අ) 1972 සිට අප විසින් විවිධ ඉදිකිරීම සහ නඩත්තු කටයුතුද කරමින් පරිහරණය කරනු ලබන මෙම ගොඩනැගිල්ල සඳහා මුලදී ගෙවිය යුතු බදුකුලී රු. 1400/-, රු. 14,000/- වැනි ඉතා අඩු අගයක සිට එකවර රු. 280,000/-, රු. 330,000/- වැනි මුදලකට වැඩිකර ඇත. එසේම කොම්පත් සභාව විසින් මිලියන 10 ට වැඩි වියදමක් දරා ගොඩනැගිලි ද සාදා ඇත. එබැවින් එකවර විශාල ප්‍රමාණයකින් බදු මුදල් වැඩිකිරීම අප ආයතනයට දැරීමට අපහසු බැවින්, ඉහත කී හේතූන් මත එම මුදල සාධාරණ ලෙස අඩු කිරීම සහ ගෙවියයුතු හිග මුදල් වාරික වශයෙන් සහන කාලයක් තුල ගෙවීමේ හැකියාව ලබා ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග මේ වනවිට සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර, දැනටමත් එය සාකච්ඡා මට්ටමින් පවතී. ඒ අනුව 2012 ට පෙර වැඩි කරන ලද මුදල් ගිණුම් වලට ගැලපීම් කර නොමැති අතර 2012 ට පසු වසර වලට අදාල නියමිත කුලිය හිගයකින් තොරව අද දක්වා ගෙවමින් ගිණුම් තැබීම ද නිවැරදිව සිදුකර ඇත.

(ආ) දල වශයෙන් මුළු වන්දි මුදල් හා පොලී මුදල සහිතව රුපියල් මිලියන **590** ක් වුවත් මෙය නිවැරදිම සංඛ්‍යාවක් නොවන බව පෙනේ. විවිධ වකවානුවලදී කර ඇති තක්සේරු අනුව මෙය වෙනස් අගයක් පෙන්නුම් කරන අතර, මේ සම්බන්ධව දිගින් දිගටම විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡාවට ලක් කරමින් පවතී. ඒ අනුව වන්දි ගෙවිය යුතු නිවැරදි ලිපි ගොනු සංඛ්‍යාව හඳුනාගෙන ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණ වේ ද යන්න ගණනය කරන ලෙසට අදාල නිලධාරින් දැනුවත් කර ඇත.

(ඇ) ආදායම් අංශයේ හා මුදල් අංශයේ බදු ලේඛණ විස්තාත්මක ලෙස පරීක්‍ෂා කර අදාළ වෙනස්කම් මෙම වසරට අදාළව ගිණුම්වල නිවැරදි කර ගන්නා ලෙස ගිණුම් අංශය වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ඈ) ඉදිරියේදී ආදායම් අංශයේ වාර්තා හා මුදල් අංශයේ වාර්තා නිවැරදි කර සංසන්දනාත්මක වාර්තාවක් ලබාගෙන ඒ අනුව ගිණුම් වාර්තා නිවැරදි කිරීමට උපදෙස් ලබා දෙන ලදී. **2012** වසරට අදාළ බදු ලැබීම් පිළිබඳ විස්තර ආදායම් අංශයේ ලිපිගොනු වෙන වෙනම පවත්වා ගෙන යනු ලබන අතර, ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට පුළුවන.

(ඉ) ආදායම් අංශයේ වාර්තා සහ මුදල් අංශයේ වාර්තා පදනම් කර ගෙන වෙනසට හේතු ඉදිරියේදී වාර්තා කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

(ඊ) සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ලේඛණ හා ගෙවීම් නිවැරදි වේ. මූල්‍ය ප්‍රකාශනවල සඳහන් සේවක අර්ථසාධක අරමුදලට අදාල වියදම හා භාරකාර අරමුදලට අදාල වියදම රු. **15,391,103.76** ක් වියයුතු වුවත්, ගිණුම්ගත වී ඇත්තේ **15,355,252.52** කි. ඒ අනුව වෙනස රු. **75,734/-** ක් නොව රු. **35,851.24** කි. මෙය වැටුප් ගිනුමට පිටපත් වී ඇත. එය දැනට නිවැරදි කර ඇත. මෙහිදී සේවකයින්ට අදාළ දායක මුදල නිවැරදිව අදාල ගිණුම්වලට බැරවී ඇති බව වැඩිදුරටත් දන්වමි.

### 2.2.5. <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ)
(ආ) අප කොම්පත් සභාවේ වත්කම් වල තිරුපනය කරන ලැබියයුතු ණය ගැතියන් මිලියන 2158 කි. මෙම මුදල් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු වේ. ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා හඳබිම අධිකාරිය යන රාජ්‍ය ආයතනවලට මෙම මුදල් ගෙවන ලෙසට දන්වා ඇත. වාර්ෂික ගිනුම් වාර්තාවට අනුව ලැබිය යුතු මුදල් ශේෂ සනාථ කර එවන ලෙසටද දැනුම් දී ඇත.

වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, වෙත පවරාගත් ඉඩම් නැවත එම ආයතනය විසින් ජාතික පශු සම්පත් මණ්ඩලය, පොල් සංවර්ධන මණ්ඩලය, කජු සංස්ථාව වැනි ආයතනවලට බදු පදනම මත ලබාදී ඇති අතර, එම ආයතන වල ප්‍රධානීන් කැඳවා සාකච්ජා කරන ලදී. එහිදී එම ආයතනවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීමත් නිවැරදි සංඛ්‍යා ලේඛණ නොමැති වීමත් යන ගැටළු ඉදිරිපත් විය.

මෙම ගැටළුව විසඳීම සඳහා ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් භාණ්ඩාගාර නිලධාරින්ද කැඳවා සාකච්ජා කරන ලෙසට ඉල්ලීමක් ද කල අතර, ලේකම්තුමා විසින් එක් එක් ආයතනයෙන් ලැබියයුතු මුදල් පිළිබඳ විස්තර ඉල්ලා ඇත. අදාල ලිපිගොනු අනුව එකී විස්තර ද සපයා ඇත.

මේ අනුව මෙම ලැබියයුතු මුදල් ලබා ගැනීම සම්බන්ධව විවිධ අවස්ථාවල උත්සාහයන් ගනු ලැබුවද, තනිව ගත්කල අප කොමිෂන් සභාවට පමණක් විසඳාගත හැකි ප්‍රශ්ණයක් නොවන බවත්, මෙය පොදුවේ ප්‍රතිපත්තිමය තීරණයක සිට මහා භාණ්ඩාගාරය මැදිහත් වීම මත විසඳා ගත යුතුව පවතින්නකි.

මැතිවරණ ඉඩම් ප්‍රතිසංස්කරණ සමූපකාර සමිති සහ විවිධ සේවා සමූපකාර සමිති දැනට ඈවර කර ඇති බවට වරින් වර අප වෙත දැනුම් දී ඇත. ඒ අනුව දැනට විගණන හා කළමනාකරණ කමිටුවේ තීරණයක් මත මෙම අයවිය යුතු සමූපකාර සමිති පිළිබඳ සමූපකාර කොමසාරිස් වෙත ලියා, ඒ අනුව තීරණයක් ගැනීම සඳහා දැනට කටයුතු කෙරෙමින් පවතී.

මෙම ණයගැති ශේෂයන් කපා හැරීමට කිසිම විටෙක අනුමැතියක් නොලැබෙන බැවින් හා එම ශේෂයන් අයකර ගැනීම සඳහා විශාල උත්සාහයක් දරන බැවින්, මෙම මුදල් නොලැබේය යන පදනමෙන් සහ නොලැබෙන ප්‍රමාණය කොපමණ ද යන්න හරියටම දැන ගැනීමට නොහැකි බැවින්ද මේ සඳහා අඩමාන ණය වෙන්කිරීමක්ද සිදු කරනු නොලැබේ.

(ඇ) මෙම නිලධාරීන්ගෙන් සමහරක් නිලධාරීන් වැඩ තහනම් කිරීම ආදී නීතිමය ක්‍රියා මාර්ග හේතුවෙන් පාරිතෝෂික මුදල් ද ලබාගෙන නොමැත. එම නීතිමය ක්‍රියා මාර්ග අවසන් වීමෙන් පසු අදාල පාරිතෝෂික ගෙවීම් තුලින් මෙම ණය වාරික මුදල් අයකර ගත හැක. ණය ගෙවීම පැහැර හැර ඇති සමහර පුද්ගලයින් මියගොස් ඇති බව වාර්තා වී ඇති අතර, පොදුවේ සියලුම ණය පැහැර හැර ඇති පුද්ගලයින් වෙත ණය ගෙවන ලෙස ලිඛිතව දැනුම් දී ඇත. මේ සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ අතර, මෙම පුද්ගලයින් පිළිබඳ වෙන වෙනම වාර්තාවක් ඉදිරියේදී සකස් කර සුදුසු ක්‍රියා මාර්ගයට එළඹීමට නියමිත වේ.

(ඈ) 2002 - 2004 කාලය තුළ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් තහනම් කරන ලද මෙම ඉඩම් ගනුදෙනුව එකී ආයතන හෝ පුද්ගලයින් විසින් නැවත පවරා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව කොමිෂන් සභාව මගින් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන්නට යෙදුනි. එහිදී අමාත්‍ය මණ්ඩලය විසින් තහනම් කරනු ලැබ මෙම ඉඩම් ගනුදෙනුවට අයත් ඉඩම නැවත පවරා දීමට ක්‍රියා කරන්නේ නම්, ඒ සඳහා සංශෝධන සහිත කැබිනට් පත්‍රිකාව සකස් කර ඉදිරිපත් කළයුතු බව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් දැනුම් දී ඇත. ඒ අනුව අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළද, ඒ සඳහා මෙතෙක් තීරණයක් ගෙන නැත. මේ යටතේ සංවර්ධනය කළයුතු ඉඩම් බදු පදනම යටතේ ලබා දීමටත්, සංවර්ධනය නොකල ඉඩම් නැවත පවරා ගැනීමටත් ක්‍රියා කරමින් පවතී. මෙයට අමතරව අත්තිකාරම් ආපසු ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන පුද්ගලයින් හා ආයතන වෙත එම මුදල් කොමිෂන් සභාවේද අනුමැතිය ලබාගෙන නිදහස් කරනු ලැබේ. අමාත්‍ය මණ්ඩල නිශ්චිත තීරණයක් ලැබෙන තෙක් මෙය නිරවුල් කිරීමේ හැකියාවක් නොපවතී.

(ඉ) ලැබිය යුතු ආදායම් ලෙස වර්ෂ 20 කට වැඩි කාලයක සිට ගිණුම් වාර්තා වල පෙන්නුම් කරනු ලබන මෙම ගිණුමේ ශේෂය වාර්ෂිකව අඩුවී යයි. දැනට ලැබිය යුතු බදු ආදායම් තුළ ඇතුළත් නොවන පෙර වර්ෂවලට අදාළ ආදායම් ලැබීම් මෙම ගිණුමේ ඇතුළත් කර ඇත. මේ පිළිබඳ විස්තර 1455 ලෙජර් ගිනුමේ ඇතුළත් කර ඇත. එය විගණනයට ඉදිරිපත් කරන ලදී.

**2.2.6 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

**<u>ස්ථාවර වත්කම් ඃ</u>**

| | |
|---|---|
| **<u>ඉඩම්:</u>** | ඉඩම් ලේඛණය යාවත්කාලීන කිරීමෙන් පසු අදාළ පියවර ගැනීමට සටහන් කර ගතිමි. |
| **<u>ගොඩනැගිලි:</u>** | මොණරාගල , දිස්ත්‍රික් කාර්යාලීය ගොඩනැගිලි වටිනාකම ලිඳුල බංගලාව සහ රත්නපුර ෆාම්ගාඩ්න් වත්ත වෙනුවෙන් දරනු ලබන ප්‍රාග්ධන වියදම් ද ඇතුළුව රු. 4,586,223/- ක් ගිනුම්වලට ඇතුළත් කර ඇත. |
| **පරිගණක උපාංග, ලී බඩු සවිකිරීම, මෝටර් රථ කාර්යාල උපකරණ සුහ සාධක උපකරණ** | 2013.12.31 දිනට අදාළ තොග සමීක්ෂණයක් සිදුකර, සමීක්ෂණ මණ්ඩල වාර්තා සහ ඒ සම්බන්ධ වත්කම් ලේඛණ විගණනය වෙත ඉදිරිපත් කර ඇත. |

**<u>ණය හා අත්තිකාරම්</u>**

| | |
|---|---|
| **මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය ලොහෝර් ආර්යා අරමුදල, ඉන්ධන අත්තිකාරම්, මෝටර්රථ අලුත්වැඩියා සඳහා අත්තිකාරම්** | ශේෂ සනාථ කර පිළිතුර සෘජුවම විගණකාධිපති වෙත ලැබෙන ලෙසට ලිපි මඟින් අදාළ ආයතන වෙත දැනුම් දී ඇත. |
| **<u>බොල් ණය ප්‍රතිපාදන</u>** | වසර 10 කට වැඩි කාලයක් තුළ මෙය ගිණුම් වල පෙන්නුම් කරන අතර, කෙසේ ගණනය කර ඇද්ද යන්න පිළිබඳ විස්තර සොයා ගැනීමට නොහැකිව පවතී. |
| **<u>ලැබිය යුතු ආදායම්</u>** | මෙම ආදායම සනාථ වී ඇති ආකාරය පිළිබඳ දැනටමත් තොරතුරු පරීක්ෂා කරන අතර, පසුව විස්තර ඉදිරිපත් කරමි. |
| **<u>දැව විකිණීම්</u>** | අදාළ ලිපිගොනුවල විස්තර ඉදිරිපත් කර ඇත. |

| | |
|---|---|
| **චන්දි අවිනිශ්චිත, ඉඩම් අත්පත් කරගැනීම්, කුඹුරු ඉඩම් විකුණුම්** | මෙම සම්බන්ධ විස්තර වෙන වෙනම ලිපි ගොනු විශාල ප්‍රමාණයක ඇතුලත්ව ඇත. |
| **අම්පාර දිස්ත්‍රික් කාර්යලයේ ආදායම්** | 2013 වර්ෂයේ ඔක්තෝබර් මස ආදායම් වාර්තාව මුදල් අංශයේ පවතින අම්පාර දිස්ත්‍රික් කාර්යාලයේ ලිපිගොනුවේ ඇත. 2013 ඔක්.- 2013 දෙසැ. කාලයට අදාළ කුවිතාන්සි පොත් හා අනෙකුත් වාර්තා අභ්‍යන්තර විගණන අංශයේ පවතී. |

2.2.7. <u>**නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම**</u>

(අ) *1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත*

| | |
|---|---|
| (i) *45 (1)(අ) (III) වගන්ති :* | ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ එම වගන්තියේ දක්වා ඇත්තේ අග්‍රාමාත්‍යවරයා විසින් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විමසා එක් සාමාජිකයෙකු පත්කල යුතුය යන්න හෝ අදාළ විෂයභාර අමාත්‍යවරයා විසින් අයෙකු පත්කල යුතුය. නමුත් දැනට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කරමින් සාමාජිකයෙකු සහභාගී වේ.<br><br>නමුත් විගණන වාර්තාවෙන් දක්වා ඇත්තේ අදාළ විෂයභාර අමාත්‍යවරයා (ජනාධිපතිතුමාගේ)නියෝජිතයෙකු,කොමිෂන් සභා සාමාජිකයෙකු ලෙස පත්කර නොමැති බවයි. මෙම උක්ත වගන්ති ප්‍රකාරව එවැනි සාමාජිකයෙකු පත්කර ගැනීමට ප්‍රතිපාදන දක්වා නොමැත. |
| (ii) **33** වගන්තිය | චන්දි හා පොලී මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට අදාළව කටයුතු කිරීම සඳහා විශාල කාර්යභාරයක් කල යුතු අතර, ඒ සඳහා දැනටමත් ලිපි ගොනු **57** ක් සඳහා පුවත්පත් දැන්වීම් පලකර ඇති අතර, කොමිෂන් සභාවේ අනුමැතිය ද ලබාගෙන ඇත. එක් එක් ඉඩම වෙනුවෙන් උසාවියේ නඩු ගොනු-කළ යුතුව ඇති බැවින් ඒ සඳහා එම ලිපි ගොනුවල තොරතුරු නීති අංශය වෙත යොමු කරමින් පවතී. මෙම වැඩ කටයුතු අවසන් වෙමින් පවතින අතර, අදාළ ප්‍රකාශකයින් හිමිකම් කියනු ලැබූ චන්දි හා පොලී මුදල් කොමිෂන් සභාවෙන් බැහැර කොට සිවිල් අධිකරණයක තැන්පත් කිරීමට ඉන්පසු හැකියාව ඇත. |

| | | |
|---|---|---|
| (ආ) | *1971 අංක 38 දරණ මුදල් පනත II වන ජේදය* | ආයෝජන සම්බන්ධව ආයතන මගින් ලබාගත් පොදු තීරණයක් මත කටයුතු කර ඇත. |
| (ඇ) | *2002 අංක 14 දරණ එකතුකල අගය මත බදු පනත* | මෙම පනත් දෙක යටතේ ලියාපදිංචි වීම පිළිබඳ සලකා බැලීම සඳහා කොම්පත් තීරණයක් ලබා ගෙන, ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. මුදල් අංශයේ පවතින 3/3/48 ලිපිගොනුවේ අදාල විස්තර ඇතුලත් කර ඇත. |
| (ඇ) | *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II පරිච්ජේදය 13:3 වගන්තිය* | ඉ. ප්‍ර. කො. සභාවේ දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ/මුදල් තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකිරීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයන්ද පවත්වන ලදී.<br><br>ඉ. ප්‍ර. කො. සභාව තුල පෙර ක්‍රියාත්මක වූ බඳවා ගැනිම් පරිපාටිය අදාළ කර ගනිමින් 2007.03.16 සහ 2009.03. 30 යන දිනයන්හිද ඉ. ප්‍ර. කො. සභාව තුල ක්‍රියාත්මක නව බඳවා ගැනිම් පරිපාටිය අනුව 2012.12.11 සහ 2013. 05. 20 දිනයන්හි ද ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවා ඉදිරිපත් වූ අයදුම්පත්වලට අදාළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණවලටද භාජනය කරන ලදී.<br><br>එහෙත් ඉදිරිපත් වූ අයදුම් කරුවන් බඳවා ගැනීම් පරිපාටියේ ඇතුලත් සුදුසුකම් වලින් යුක්ත නොවීමත් ඉදිරිපත් වූ අයදුම්කරුවන් බඳවා ගැනීම් පරිපාටියේ ඇතුලත් වැටුප සම්බන්ධයෙන් එකග නොවීමත් යන හේතූන් මත අදාළ තනතුර සඳහා බඳවා ගැනීම් කිරිමට හැකියාවක් නොමැති විය.<br><br>මෙකී හේතූන් මත අධ්‍යක්ෂ/මුදල් තනතුරේ නිත්‍ය නිලධාරියකු තෝරා පත්කර ගැනීමට හැකියාවක් නොමැති කමින් 2008. 01. 01 දින සිට ගණකාධිකාරී III ශ්‍රේණියට බඳවා ගනු ලැබූ නිලධාරිණියගෙන් අධ්‍යක්ෂ/මුදල් තනතුරේ රාජකාරිය ආවරණය කර ගැනීමට තීරණය වූ අතර, ඒ සඳහා ඇට ආයතන සංග්‍රහයෙන් ගැලපිය හැකි ප්‍රතිපාදන යටතේ 1/6 ක දීමනාවක් ලබා දිමටද කටයුතු කරන ලදී. |

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් 2014.10.10 දින පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී දීර්ඝ ලෙස සාකච්ඡාවට භාජනය වූ අතර, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර බඳවා ගැනීමේ පටිපාටියේ සුදුසුකම් සංශෝධනය කර හෝ වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට නිර්දේශ ඉදිරිපත් වී ඇත. ඒ අනුව සුදුසු පියවර ගැනීමට නියමිතව ඇත.

(ඉ) ***ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය***

(i) *මුදල් රෙගුලාසි 502 (2)*

ඉඩම් හැර අනෙකුත් ස්ථාවර වත්කම් සම්බන්ධව ලේඛණයක් මුදල් අංශයේ පවත්වාගෙන යනු ලැබේ. එහි පිරිවැය, අත්පත් කරගත් දිනය වාර්ෂික ක්ෂය අනුපාතය සඳහන් කරමින් 2009 වසරේ සිට මෙම ලේඛණය යාවත්කලීන කරමින් පවත්වාගෙන යනු ලබයි.

(ii) *මුදල් රෙගුලාසි 134 ( 3)*

අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරන ලෙස අදාළ නිළධාරීන් දැනුවත් කරන ලදි.

(iii) *මුදල් රෙගුලාසි 104 (3) හා (4)*

ඉ.ප්‍ර.කො. සභාවට අයත් අංක PB-7869 දරණ වාහනයට 2012.12.31 දිනැතිව සිදු වූ අනතුර සම්බන්ධයෙන් මූලික විමර්ශන වාර්තාව 2013.06. 24 දිනැතිව ඉදිරිපත් කර ඇති අතර, එකී වාර්තාවෙන් එම අනතුර සිදු වූ අවස්ථාවේදී වාහනය ධාවනය කරන ලද රියදුරු තැනගේ වරදින් සිදු නොවූවක් බවට වාර්තා කර ඇත.

මෙම වාහනයට 2013.04.24 දිනැතිව සිදු වූ අනතුර සම්බන්ධයෙන් 2013.12.11 දිනැතිව මූලික විමර්ශන වාර්තාව ඉදිරිපත් කර ඇති අතර, ලැබූ රක්ෂණ වන්දියෙන් බැහැරව වාහනයේ අළුත්වැඩියාව සඳහා වියදම් දරා ඇති ගාස්තු ප්‍රමාණය එම අවස්ථාවේ වාහනය පදවන ලද රියදුරුගෙන් අයකර

ගැනීමට කටයුතු කරන ලෙසට මූ. රෙ. 104 ප්‍රකාරව පැවති පරීක්ෂණ මණ්ඩලය තීරණය කරනු ලැබූයෙන් ඒ අනුව ඉදිරි කටයුතු කරන ලදී.

(ඊ) ***2006 ජනවාරි 25 දිනැති අංක 08 දරණ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 7.1 හා 7II.I වගන්ති***

ඉ. ප්‍ර. කො. සභාවේ වාහන අළුත්වැඩියාවේදී මෙතෙක් අනුගමනය කරනු ලැබූ ක්‍රියා පිළිවෙත අනුව එසේ ක්‍රියාත්මක වීම සිදු නොකළද, මේ වන විට එයින් බැහැරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පදනම් කොට ගෙන වාහන අළුත්වැඩියා කටයුතු පවත්වා ගෙන යනු ලැබේ.

(උ) ***<u>2003 ජූනි 2 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛණ</u>***

*4.2.6 <u>වගන්තිය</u>*

වාර්ෂික කාර්යය සාධන වාර්තාව අදාල අමාත්‍යාංශ වෙත යොමු කර ඇති අතර, 2014 වර්ෂයේ සිට කාර්තුමය මූල්‍ය වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට යොමු කර ඇත.

*6.5.1වගන්තිය*

2013 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තා කෙටුම්පත 2014-03-18 දිනැති ආවරණ ලිපියෙන් අදාළ ආයතනවලට යොමුකර ඇත.

## 3. <u>මූල්‍ය සමාලෝචන</u>

### 3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

රජයේ කඩිනම් ආර්ථික සංවර්ධනය උදෙසා 2010 - 2012 වසරක කාලය තුල රාජ්‍ය ආයතන වෙත අත්පත් කරගත් ඉඩම් සඳහා 2012 වසර තුල විශාල අත්පත් වන්දි ප්‍රමාණයක් ලැබුණි. ඒ අනුව 2012 වසරේ ඉඩම් අත්පත් ආදායම ඉහළ යන ලදී. 2012 වසරට සාපේක්ෂව ඉඩම් අත්පත් වන්දි වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන රාජ්‍ය ආයතන වෙත අයවැය මගින් ලබා ගැනීමට නොහැකිවීම මත 2013 වසරේ මෙම ඉඩම් අත්පත් ආදායම අඩුවී ඇත. 2008 - 2012 කාල වලට අදාල නීත්‍යානුකූලව ඉඩම් බදු දීමේ ක්‍රමය කඩිනම් වූ බැවින්, එම වසර වල බදු ආදායම් වැඩවී ඇත. දැනට අලුතින් බදු දීම සඳහා නිරවුල් ඉඩම් ප්‍රමාණය අඩු බැවින්, අලුතෙන් බදු ආදායම් එකතු වීම් ක්‍රමයෙන් අඩුවී ඇත.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

වෙළඳ හා අනෙකුත් ණය ගැතියන්ගේ අගය රුපියල් මිලියන 2,218 ක් වීම මත මෙම අනුපාතය වැඩිවී ඇත. ජංගම වත්කම් තුළ නිරූපනය කරනු ලබන සියලුම වත්කම් ද්‍රවශීල වත්කම් බැවින්, අපගේ ආයතනය සේවා සපයන ආයතනයක් බැවින් අවසාන තොග දක්නට නොලැබීමත් ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම ඉතා අඩු අගයක් ගන්නා බැවින්, ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය සමාන අගයක් ගනු ලබයි.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

මූල්‍ය ප්‍රකාශනවල 2013.12.31 දිනට සඳහන්ව ඇති නඩු සංඛ්‍යාව 626 ක් ලෙස සටහන් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාර්යාලවලින් හා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් අංශවලින් ලබා ගත් තොරතුරු ද, නීති අංශය මගින් පවත්වා ගෙන යනු ලබන ලිපිගොනු ද පදනම් කර ගත්විට 2013.12.31 දිනට නිවැරදි නඩු සංඛ්‍යාව 435 කි.

2014.11.01 දිනට මෙම නඩු සංඛ්‍යාව 480 ක් බවද දන්වන අතර, ඒ සම්බන්ධ විස්තරාත්මක වාර්තාවක් මේ සමග අමුණා ඇත. පූර්ව වාර්තාව සකස් කර ඇත්තේ හිටපු නීති අධ්‍යක්ෂ ඊ. ඩබ්. වසන්තා සිල්වා මහත්මිය වන අතර, අවසන් කර ඇති කටයුතු ඇතුලත් කර වගකීමකින් තොරව කයුතු කර ඇති බව පෙනේ. මෙවැනි කරුණු නිසා ඇයගේ සේවා දිගුවද ලබා නොදුන් අතර, එයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඇය විසින් පැමිණිලි කළද, එයද ප්‍රතික්ෂේප කර ඇත.

## 4. මෙහෙයුම සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

අප කොම්පත් සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය බවට ඉඩම් ආයෝජනය සඳහන් කළ හැක. මෙම සම්පත සීමිත බැවින්, දැනට ඉඩම් විකිණීම් මත ලැබෙන ආදායම අඩුවෙමින් පවතී.

තවද, 2002-2004 කාලය තුළ තහනම් කරන ලද ඉඩම් සම්බන්ධයෙන් මෙතෙක් කැබිනට් මණ්ඩලය මගින් සුදුසු තීරණයක් ගෙන නොමැති බැවින්, මෙම ආදායම් වැඩිකර ගැනීම පිළිබඳ ඉදිරියේදී ගැටළු පැන නැගිය හැක.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) කොම්පත් සභාව විසින් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කර ඇතත්, වන්දි ලබා ගැනීමට ප්‍රකාශකයින් ඉදිරිපත් නොවීමත්, ඒ සඳහා විකල්ප ඉඩම් ලබා දෙන ලෙසට ඉල්ලීම් කිරීමත්, ප්‍රකාශකයින්ගේ අයිතිය (හිමිකම්) තහවුරු කිරීමේ නීතිමය ලියකියවිලි ආදිය පිළිබඳ පැන නැගී ඇති ගැටළුකාරී තත්වයන් හේතුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද වී ඇත. දැනට මෙසේ හෝ සුළු ප්‍රමාණයක් හෝ ගෙවීම් කරන්නේ ප්‍රකාශක හිමිකම් තහවුරු වන ආකාරයට සහ අධිකරණ නියෝගයන් මත උසාවියේ තැන්පත් කිරීම සඳහා ය.

(ආ) දැනට පවතින ලිපිගොනු 600 කට ආසන්න ප්‍රමාණයක් සඳහා ලිපිගොනු පරීක්ෂා කරමින් කටයුතු කරනු ලබන අතර, කොමිෂන් සභාවට අවසන් වශයෙන් පැවරෙන ඉඩම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම අඛණ්ඩව සිදු කරයි. මෙම තොරතුරු ලබා ගැනීමේ ප්‍රගතිය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ද වාර්තා කිරීමට උපදෙස් ලැබී ඇති හෙයින් අදාළ තොරතුරු එය වෙත වාර්තා කරනු ලබයි.

තවදුරටත් ව්‍යවස්ථාපිත නිශ්චය ලබා නොදුන් ප්‍රකාශක ලිපි ගොනු පැවතීම, ලිපි ගොනුවලට අදාළව ඉඩම් ක්ෂේත්‍රයේ හඳුනා ගැනීමට අපහසු වීම, පවුලතුල පැවරීම් යටතේ නීතිමය බැඳීම් සඳහා ඉඩම් ලබාදීමට පැවතීම, ඉඩම්වල අයිතිය තහවුරු කිරීමට අදාළ ලේඛණ ඉදිරිපත් නොකිරීම, උරුමකරුවන් ඉදිරිපත් නොවීම ආදී හේතු නිසා වන්දි ගෙවීමට අදාළ ඉදිරි කටයුතු කඩිනම් කිරීමට අපහසු වී ඇත.

(ඇ) හිමිකම් තහවුරු නොවූ පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් කරන ලද ගොනු සංඛ්‍යාව 104 කි. එම ලිපි ගොනු අතුරින් 49 ක් සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් වන්දි නිශ්චය අප වෙත යොමුකොට ඇත. අපගේ ලේඛණ අනුව එම වන්දි නිශ්චය රු. 3,136,936/-ක් වන අතර, ඊට අදාළ බිම් ප්‍රමාණය අක්. 2591 රූ.1 පර්. 05 කි. ඔබගේ විමසීමේ දැක්වෙන පරිදි අක්කර 66161 ක් නොවන බවද කාරුණික අවධානය සඳහා දැනුම් දෙමි. වන්දි නිශ්චය නොකරන ලද ලිපි ගොනු 55 ට අදාළව දක්වා ඇති බිම් ප්‍රමාණය අක්. 2874 රූ. 3 පර්. 34 ක් පමණ වන අතර, එක් එක් ප්‍රකාශක ලිපි ගොනු යටතේ පැවරෙන ඉඩම් ප්‍රමාණයේ පවතින විෂමතාවය මත බිම් ප්‍රමාණයේ වෙනසක් ඇති විය හැකි අතර, ඊට සමගාමීව වන්දි මුදල තීරණය කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන කරුණු (පැවරුණු ඉඩමේ පැවති වගාව, ඵලදාව සහ පනතට අනුව අක්. 01 ට ගෙවීමට නිර්දේශ කර ඇති වන්දි මුදල) මත වන්දි මුදලෙහි ද වෙනසක් ඇති වී ඇත.

### 4.3 <u>මෙහෙයුම් ආකාර්යක්ෂමතා</u>

(අ) මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලද පොදු තීරණයක් මත කටයුතු කර ඇත.

(ආ) 2013.03.13 දිනැතිව BD/GPS 01/1/8/1 දරණ ලිපියට අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් මෝටර්රථයක් මිළදී ගැනීම සඳහා එහි පිරිවැය හා පිරිවැයට අදාළ බදු ඇතුළත්ව රුපියල් මිලියන 10 කට අනුමැතිය ලැබී ඇත. 2013.11.05 දිනැතිව ටොයෝටා ලංකා ආයතනය මගින් මිළ ගණන් ලබාගත් අතර, වාහනයේ මිළ රු. 8,808,036/- ක් ලෙසද, එයට අදාල වැට් මුදල රු. 1,056,964/- ක් ලෙසද ඇතුළත්ව රු. 9,865,000/- ක මුදලකට වාහනය මිළ දීගන්නා ලදී.

මෙම වාහනය මිළදී ගැනීමට අදාල මුදල රු. 9,865,000/- ක වියදම් දැරීමක් වන අතර, එම වියදම අනුමැතිය ලබාගත් සීමාව තුල ක්‍රියාත්මක වූවක් බවද සඳහන් කරමි.

ඉහත සඳහන් මුදලින් රුපියල් මිලියන 5,000,000/- ක් කල්බදු ක්‍රමය යටතේ ලබා ගන්නා ලද අතර, එයට අදාල මුද්දර ගාස්තුව රු. 55760/- කි. තවද, මෙම මෝටර් රථය පාවිච්චි කිරීමේදී ගෙවියයුතු අර්ධ සුඛෝපභෝගී බද්ද රු. 150,000/- කි.

මෙම මිළදී ගැනීමට අදාළව ටොයෝටා ආයතනයෙන් නිකුත් කර ඇති බිල්පතේ සියලුම බදු ඇතුළත් මිල රු. 9,865,000/- කි.

මෙම මොටර් රථය අනුමත සීමාව තුල මිළදී ගැනීමක් බවටද කොම්පත් සභාව ද දැනුවත් කර ඇත.

(ඇ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව තිබූ අංක 51-6460 , 53-9673 දරණ කැබ් රථ දෙක සහ අංක 61-1117 දරණ වෑන් රථය නිතර නිතර අළුත්වැඩියාවන් කරලීමට සිදුු වන බැවින් ද, එකී අලුත්වැඩියාවන් සඳහා වරින්වර විශාල ලෙස වියදම් දැරීමක් ද සිදුු කරනු ලබන හෙයින් මෙකී වාහන තුන විකිණීම් කර ඒ වෙනුවට නව කැබ් රථ දෙකක් සහ වෑන් රථයක් මිළ දී ගැනීම් කිරීමට ජනාධිපති කාර්යාල අනුමැතිය පතා 2011.11.04 දිනැතිව යොමුකර ඇත.

එම වාහන තුන විකිණීම් කිරීම සඳහා වූ යෝජනාවට ජනාධිපති කාර්යාලය මගින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද 2012.0131 දිනැති ලිපියේද සඳහන් වේ.

එහෙත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වාහන මිළ දී ගැනීම සඳහා 2012.09.18 දිනැතිව අනුමැතිය ලබා දී ඇති අතර, වාහන විකිණීම සඳහා අනුමැතිය ඇතුළත් කිරීමක් සිදුු වී නොතිබුණි.

නමුත් අංක 110-7479 දරණ යතුරුපැදිය විකිණීම් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2012.07.25 දිනැතිව අනුමැතිය ලබාදුන් ලිපියේ භාවිතයට නුසුදුසු බවට නිශ්චිතව හඳුනා ගන්නා ලද වාහන අපහරණය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ වෙනම අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවන බවත්, භාවිතයට නුසුදුසු බවට හඳුනාගෙන ඇති වාහන අපහරණය කිරීමේ කටයුතු රාජ්‍ය මුදල් චක්‍රලේඛ 353 අනුව සිදුු කරන ලෙසටත් දන්වා තිබූයෙන් කැබ් රථ දෙක සහ වෑන් රථය විකිණීම් කිරීමේ කටයුතු එසේ ලද උපදෙස් අනුගමනය කරමින් අදාළ චක්‍රලේඛණය අනුගමනය කරමින් විකිණීම් කිරීම සිදුු කරන ලදී.

(ඇ) <u>අංක PC-6654දරණ වාහනය අනතුරකට භාජනය වීම</u>

අංක PC - 6654 දරණ වාහනයේ අළුත්වැඩියාවන් සඳහා වාහනයේ නියෝජිත ආයතනය විසින් ඉදිරිපත් කල පළමු සහ දෙවන වියදම් ඇස්තමේන්තු සඳහා ජනාධිපති කාර්යාලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. නියෝජිත ආයතනය තෙවන ඇස්තමේන්තුවක් ලෙස වියදම් සඳහන් කර ලේඛණයක් මෙම කොම්පත් සභාව වෙත ඉදිරිපත් කර නොතිබූ අතර, ඔවුන් විසින් රක්ෂණ සමාගම් වෙත අළුත්වැඩියාවන් සඳහන් කර අමතර ඇස්තමේන්තු (Suplimentry) තුනක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන රථයේ අළුත්වැඩියා නිම කිරීමෙන් පසු අප ආයතනය වෙත සියලු වියදම් සහිතව අවසන් බිල්පත ඉදිරිපත් කර ඇත. ඒ අනුව තෙවන ඇස්තමේන්තුව ලෙස වෙනම ලේඛණයක් ඉදිරිපත් නොවූ අතර, අවසන් බිල්පත මගින් මුළු වියදම් දන්වා තිබුණි.

කෙසේ වෙතත් මෙම වාහන අනතුර සම්බන්ධයෙන් මූ. රේ. පරීක්ෂණයෙන් හා කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කිරීමෙන් පසුව ලබාගත් කොමිෂන් තීරණයත්, වාහනයේ අළුත්වැඩියාව සඳහා වැය වූ මුළු වියදමත් ආයතනයෙන් දැරීමට සිදු වූ වියදමත් සම්බන්ධයෙන් 2013.11.12 දිනැතිව ජනාධිපති කාර්යාලය වෙත වාර්තා කර ඇත.

මෙම වාහනයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මූ.රේ. 104 පරීක්ෂණය සිදු කිරීම සඳහා රජයේ අළුත්වැඩියාව සඳහා දැරිය යුතු මුළු මුදලද නිශ්චය වශයෙන් දැන ගත යුතුය. කොමිෂන් සභාව වෙත නියෝජිත ආයතනයෙන් අවසන් බිල්පත ලැබුනේ 2013. 09. 20 දින වන අතර, රක්ෂණ සමාගමද මෙම හදිසි අනතුර පිලිබඳ රක්ෂණ සමාගමෙන් ගෙවන ලද අවසන් මුදල තීරණය කරනු ලැබුයේ හදිසි අනතුර පිලිබඳව ඔවුන් විසින්ද සිදු කරන ලද මූලික විමර්ශනයකින් පසුවය.

නැවතත් කොමිෂන් සභාව විසින් අවසන් බිල්පතට අනුව රු. 82,219.26/- ක මුදලක් වාහනයේ අයිතිකරුගේ ගිණුමට බැර කර තිබූ බැවින් එම මුදල අඩු කර ගැනීම පිලිබඳ නියෝජිත ආයතනයෙන් විමසුම් කරන ලදී. මෙම ක්‍රියාදාමය සඳහා දීර්ඝ කාලයක් ගතවීම හේතුවෙන් මූ. රේ 104 පරීක්ෂණය පැවැත්වීම ද ප්‍රමාද වී ඇත. දැනට මෙම රු. 82,219.26/- ක මුදලට සම්බන්ධ නිලධාරියාගෙන් වාරික වශයෙන් අය කරමන් පවතී. කෙසේ වෙතත් ඉදිරියේදී මෙවැනි තත්වයන් වලක්වා ගත යුතු බවට නිලධාරීන්ට දැනුම් දී ඇත.

(ඉ) <u>අංක KH 9751 දරන වාහනයේ අළුත්වැඩියාව</u>

කාර්යාලයේ වාහන හිගකම සහ ධාවන අවශ්‍යතා මත කොමිෂන් සභාවේ අනුමැතිය ද ඇතිව මෙම අළුත්වැඩියාව සිදුකර ඇති අතර, 2013.06.10 දිනැති ලිපිය මගින් අළුත්වැඩියාවට අදාළ සියලු කරුණු දන්වා ජනාධිපති ලේකම්තුමාගේ අනුමැතිය සඳහා යවා ඇත. එම අළුත්වැඩියාව සඳහා 2013.06.25 දිනැතිව අනුමැතිය ලැබී ඇති අතර, එම ලිපියේ ලබා දී ඇති උපදෙස් පරිදි දැනට කටයුතු කෙරෙමින් පවතී.

වාහනයේ බිඳවැටීම් පිලිබඳ තාක්ෂණ නිලධාරී වාර්තා අනුව නියෝජිත ආයතනය වෙත යොමු කිරීමේදී දෝෂ සම්බන්ධව ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු එකිනෙකට වෙනස් වූ අළුත්වැඩියාවන් ලෙස නිරීක්ෂණය වේ. ඒ සම්බන්ධව තීරණයන් අවශ්‍ය තාක්ෂණික කුසලතාවයක් සහිත නිලධාරියෙක්ගේ නිර්දේශය මත නියෝජිත ආයතනය සමග සාකච්ඡා කර ගනු ලබයි. මෙහිදී විශේෂිතව ගිවිසුමකට නොඑළඹියද සිදු කරන්නාවූ පිලියම් වෙනුවෙන් අදාළ ආයතනය වගකීම් කාලයක් ලබා දෙනු ලබන අතර, එම කාලය තුල අප ආයතනය විසින් ද එම සේවාව නැවත සිදු කරනු නොලබන අතර, ඒ පිලිබඳ ආයතනය සුපරීක්ෂාකාරී වේ.

මෙම වාහනය සම්බන්ධව ආයතනය තරමක අපහසුතාවයකට පත් වූ අතර, මෙම තත්වය වාහනයේ නිෂ්පාදන තත්වයේ උසස් ප්‍රමිතියක් නොමැතිකම නිසා සිදුවිය හැක්කක් ද විය හැක.

මෙය අවිධිමත් භාවිතය නිසා වූ බවට නිගමනයකට පත්වීමට සාධක නොමැති බව ද සඳහන් කරමි. එය මෙකී වාහන වර්ගයේ ස්වභාවයක් බවට අනාවරණය වී ඇත.

මෙම වාහනය සම්බන්ධයෙන් ඉහත විගණනයටද භාජනය වී ගැටළුකාරී තත්වයන් ආයතනය විසින් ද ප්‍රායෝගිකව මුහුණ දුන් අතර, තවදුරටත් මෙම ආයතනයට මෙම වාහනය තබා ගැනීම ආර්ථික වශයෙන් විශාල අලාභයක් බැවින් විකිණීම වඩා යෝග්‍ය ක්‍රියාවලියයැයි අදහස් කරමි.

මෙම වාහනය මිළ අධික නවීන පන්තයේ නවතම වාහනයක් වන අතර, මෙම එන්ජිමේ දෝෂය වන විට මිළ දී ගෙන වසර **2** ක් පමණ ඉක්මගිය වාහනයකි. දෛනිකව රියදුරා විසින් කරනු ලබන පරීක්ෂාවන්ගෙන් අනතුරුව රථය ධාවනය කරනු ලබන අතර, පූර්ව අනතුරු සංඥා හෝ නොලැබී වාහනය ක්‍රියා විරහිත වූ බව වාර්තා වූ අතර, මේ පිළිබඳ ට්‍රාන්ස්මෙක් ඉංජිනියරින් ආයතනයෙන් විමසූ අතර වාහනයේ බෙයාරින් පද්ධතිය හිර වීම නිසා එන්ජිම ක්‍රියා විරහිත වී ඇති බවත් සාමාන්‍යයෙන් අධිවේගී මාර්ගයේ ගමන් කරන වාහනවල එන්ජිමේ මෙවැනි කාර්මික දෝෂ ඇති වීමට හේතු රාශියක් පැමිණිය හැකි බවත් දන්වා ඇත. කෙසේ වෙතත් මේ සියලු කරුණු අනුව මෙම වාහන වර්ගයේ හා අදාළ සමාගම් පිළිබඳව කොම්පත් සභාව සාකච්ඡා කර ඇති අතර, ඒ අනුව ඉදිරියේදී වාහන ගැනීමේදී පියවර ගනු ඇත.

(ඊ) **<u>ඉඩම් බදුදීම් සහ විකිණීම්</u>**

(1) **<u>හුඹහපිටිය වත්ත</u>**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පත් සභාව සතු ඉඩමක් ව්‍යාපෘතියකට ලබා දීමේදී කොම්පත් සභාවේ විධිමත් පටිපාටි අනුගමනය කර තක්සේරු වාර්තාව ලබාගැනීමෙන් පසු බදු මුදල් අයකර ඉඩමේ භුක්තිය භාර දෙනු ලැබේ. එසේ භුක්තිය භාරදීමේදී කොම්පත් සභාවේ බලධාරියා සභාපතිතුමා බැවින් එතුමා විසින් බලය පවරන නියෝජිතයෙකු ලෙස දිස්ත්‍රික් අධ්‍යක්ෂ හෝ දිස්ත්‍රික් අධ්‍යක්ෂ බලය පවරන ක්ෂේත්‍ර නිලධාරී මහතෙකුට ඉඩමේ භුක්තිය භාර දීමට හැකියාව ඇත. ඒ අනුව මාගේ වාචික උපදෙස් මත නිසි පියවර ගෙන ඇත.

කුඹුරුහේන ඉඩමේ අනවසරකරුවන් විසින් අනවසරයෙන් භුක්ති විඳින කොටස බදු පදනම මත ලබා දෙන ලෙස ඉල්ලා ඇති අතර, මේ පිළිබඳව ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය හා අනවසරකරුවන් සමග සාකච්ඡා කර කොම්පත් සභා පනත ප්‍රකාරව සුදුසු ක්‍රියා මාර්ගයකට එළඹීමට කටයුතු කරනු ලැබේ.

කලුකොහුතැන්න ඉඩමෙන් අක්කර 03 රූඩ් 1 පර්චස් 18.90 ක බිම් ප්‍රමාණයක් බදු පදනම මත ලබාදීම සඳහා කටයුතු කිරීමේදී රු. 113,600/- ක මුදලක් අය කර ඇත්තේ 2009 සිට 2014 වර්ෂය දක්වා බදු මුදල නොව එම මුදල අතර ඇත්තේ දළ බදු මුදල ලෙස රු. 95,000/- ක් හා අනවසරයෙන් ඉවත් කරන ලද ගස්වල තක්සේරුව ලෙස රු. 18,600/- ක් ලෙසය.

මෙම ඉඩම සඳහා 2009 වර්ෂයේ තක්සේරුව කැඳවා ඇතත්, එම තක්සේරුව මෙතෙක් ලැබී නොමැති අතර, තක්සේරු වාර්තාව ලද පසු තක්සේරු මුදල් අය කර බදු ඔප්පු සකස් කිරීම සඳහා යොමු කරනු ලැබේ. මේ පිළිබඳව එල්පී/ජ්/එල්ආර්සී/02/2013/01 සහ 2013 දෙසැම්බර් 02 දිනැති විගණන විමසුමේ (ඊ) පිළිතුරෙන් පැහැදිලි කර ඇත.

(11) <u>මොණරකැලේ වත්ත</u>

මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි මොණරකැලේ වත්ත ඉඩමෙන් රබර් වගා කිරීමට වර්ල්ඩ් විව් ඉම්පැක් ආයතනය වෙත ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් ව්‍යාපෘති කමිටුවේ නිර්දේශ සමග කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව අංක 7521 දරණ කොමිෂන් තීරණය මගින් මෙම ඉඩමේ 2467 හා 2468 පිඹුරුවලට අදාළ අක්කර 280 ක ප්‍රමාණය දෙමළ පදිංචිකරුවන් 153 දෙනාගේ භුක්තිය අහිමි නොවන පරිදි බදු පදනම මත ලබා දීමය. මෙහිදී පදිංචිකරුවන්ට කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන මගින් රබර් වගා කිරීමට සහනාධාර ලබා දී ඇති අතර, ඔවුන්ගේ ඉඩම් කොටස් සඳහා බදු ගිවිසුම් ඉල්ලා ඇත. ඒ අනුව දෙපාර්ශවය සමග සාකච්ඡා පවත්වා ඇති අතර, ගැටළුමය තත්වය නිරාකරණය කර නැවත මායිම් හඳුනා ගැනීමෙන් පසු නියමානුකූල කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට ඇත.

මායිම් හඳුනාගෙන නැවත පිඹුරු සකස් කර ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස දැනටමත් අදාළ අංශ වෙත උපදෙස් ලබාදී ඇත.

බදු අත්තිකාරම් මුදල් ලෙස රු. 10,00,000/- ක් 2011.10.28 දින ගෙවා ඇතත් ඉහත දන්වා ඇති ගැටළුමය තත්වය නිරාකරණය වූ පසු නියමිත තක්සේරු මුදල් අයකර ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු බදු ගිවිසුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

2011 වසරේ සිට වර්ල්ඩ් විව් ඉම්පැක් ආයතනය මෙම ඉඩම භුක්ති විඳිනු ලබන හෙයින් 2013.03.08 තක්සේරු වාර්තාව ලබාදී තිබුණද, ලබා ගෙන ඇත්තේ 2011 වසරේ තක්සේරුවය.

ඉහත දන්වා ඇති තක්සේරු වාර්තාව අනුව අය විය යුතු නියමිත තක්සේරු මුදල මෙහි සඳහන්ව ඇති ආරවුල් තත්වය නිරාකරණය කිරීමෙන් පසුව නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
(එල්පී/ඒ/එල්ආර්සී/02/2013/05 සහ 2013 දෙසැම්බර් 02 දිනැති විගණන විමසුමේ (ඉ)පිලිතුරෙන් පැහැදිලි කර ඇත.)

(111) **<u>ලේලන්ඩ් වත්ත</u>**

2013.07.16 ලේලන්ඩ් වත්ත නැමැති ඉඩමේ අක්කර 00 රූඩ් 1 පර්චස් 10 ක ප්‍රමාණයක් ප්‍රිතිකා ප්ලාස්ටික් ආයතනය වෙත බදු පදනම මත ලබාදීම සඳහා කොම්පත් තීරණයට අනුව අමාත්‍යාංශ අනුමැතියද ගෙන රු.80,000/-ක බදු මුදලක් අය කර ඇති අතර, බදු ගිවිසුමක් සකස් කරන අවස්ථාවේදී ආයතනය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විස්තර ආදිය පිළිබඳ තොරතුරු නැවත ලබා දිය යුතු බැවින් එකී ආයතනය විසින් තොරතුරු ලබාදීම ප්‍රමාද වීම නිසා බදු ගිවිසුම සකස් කර නොමැත. අදාළ ආයතනය සමාගමක් නොවීමෙන් අදාල ව්‍යාපාරය ඒකපුද්ගල ව්‍යාපාරයක් වීම නිසාත් ඊට අදාළ අනුමැතිය සඳහා එය සකස් කල යුතුව ඇත. මේ නිසා අදාළ තොරතුරු ගෙන්වා අදාළ බදු ගිවිසුම සකස් කිරීමට ඔප්පු අංශය වෙත යොමුකර ඇත.

(1V) **<u>මාකඳුර වත්ත</u>**

ඇගලුම් නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්ලාස්ටික් උපාංග සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි මාකඳුර වත්ත ඉඩමෙන් ෆීනික්ස් ඉන්ඩස්ට්‍රීස් සමාගම වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දීමට 2006.06.08 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇත.

ඒ අනුව කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඉඩමේ නීත්‍යානුකූල භුක්තිය භාර දි ඇත්තේ 2006.06.29 වන දිනය.

ඒ අනුව ඉඩමේ භුක්තිය භාර දුන් වසරට අදාළව තක්සේරු වටිනාකම මත මෙම ඉඩම 30 අවුරුදු කාලයකට බදු පදනම මත ලබා දීමට 7495 හා 2011.01.24 දිනැති කොම්පත් තීරණය මගින් තීරණය කර ඇත.

විෂයභාර අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා දී ඇත්තේ කොම්පත් සහා තීරණයේ දැක්වෙන කොන්දේසි යටතේ වසර 30 ක කාලයකට ෆීනික්ස් ඉන්ඩස්ට්‍රීස් පුද්ගලික සමාගමට බදු දීමටය.

ඉඩමේ භුක්තිය භාර දුන් දිනය නිෂ්පාදන කටයුතු ආරම්භ කල දිනය බදු ගිවිසුම ආරම්භ වන දිනය බැවින් එදින සිට තක්සේරුව ගණනය කර ඇත. ඒ අනුව **30** අවුරුදු කාලයක් සඳහා මෙම ඉඩම් කොටස් **5546** ද **5547** හා **5548** දරණ බදු ගිවිසුම් **2013.12.26** දින සකස් කර භාරදී ඇත.

( V) <u>**කැටන්දොළ වත්ත**</u>

ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කැටන්දොල වත්ත නැමැති ඉඩමෙන් පර්. **25.6** ක් තක්සේරුව මත ලබා දීමේදී එම ඉඩමෙහි පිහිටි ගොඩනැගිල්ල සඳහා තක්සේරුව අය නොකරන ලද අතර, පසුව ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව කැඳවා තක්සේරු මුදල් අයකර ඔප්පු සකස් කිරීම සඳහා ඔප්පු අංශයට යොමුකර ඇත.

මෙම ඉඩමේ අනවසරකරුවන් නියමානුකූල කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙතින් ඔවුන්ගේ පදිංචිය හා බුක්තිය සනාථ කළ හැකි ලියකියවිලි යොමු කරන ලෙස දන්වා යවා ඇත. දීර්ඝ කාලයක් පදිංචිව ස්ථිර නිවාස තනාගෙන සිටින පදිංචිකරුවන් ඉවත් කිරීම බරපතල සමාජ ගැටළු රාශියකට හේතු වන නිසා චක්‍රලේඛ ප්‍රකාර ඒ සම්බන්ධව පියවර ගනු ලැබේ.

( VI) <u>**ලීට්ල්වැලි වත්ත**</u>

හදබිම අධිකාරිය විසින් **1980.10.26** දිනින් යුතුව නිකුත් කර තිබූ ලිපියද, එය නිවැරදි බවට හදබිම අධිකාරියේ සභාපතිවරයා විසින් **2006** වර්ෂයේදී තහවුරු කර තිබීමද **2005.10.03** මැණුම් නියෝගයක් නිකුත් කර එය ක්‍රියාත්මක වී නොතිබීම ද මහජන නියෝජිතයෝ (දේශපාලන අධිකාරිය) විසින් ඒ සම්බන්ධ කර ඇති ඉල්ලීම් ද සලකා ඔහු බුක්ති විඳිමින් සිටීම ද අවධානයට ගෙන එම ප්‍රමාණය සඳහා **2009.11.26** දින මැණුම් නියෝගයක් ලබා දී ඇත. එහෙත් හදබිම අධිකාරියේ ලේඛණවල ඔහුගේ නම සඳහන්ව නොමැති බවට වාර්තා වීමෙන් පසු එකී මැණුම් නියෝගය **2010.07.26** දින අවලංගු කරන ලදි.

නැවත ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය සරත් අමුණුගම මහතා අමතා අපටද පිටපත් සහිතව අදාළ ඉඩමට ඔප්පුවක් ලබා දී තිබේනම් නිදහස් කිරීමට පියවර ගන්නා බව සඳහන් කර ඇත. අදාළ ඉල්ලීම් සලකා ඉල්ලුම්කරු විසින් ද නිතර නිතර පැමිණිලි කිරීමද අනුව නැවතත් **2011** ජනවාරි **07** දින මැණුම අළුත් කරන ලදි.

ඉල්ලුම්කරු විසින් ඔහුට "නැඩ්සා" ආයතනය මගින් අක්කර 2 1/2 ට වන්දි ලෙස බලපත්‍ර නිකුත් කර ඇති බව පවසමින් ඒ සඳහා මැනුම් නියෝග ඉල්ලා සිටීම නිසා 2011.02.23 දින අක්. 02 රූ. 2 පර්. 00 සඳහා සංශෝධිත මැණුම් නියෝගයක් ලබා දී ඇත. ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ 2011.03.16 දින ලිපියේ ඉල්ලීම සලකා බලා අදාළ මැණුම් කිරීම අත්හිටුවන ලදී. නැවතත් ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2011.06.13 අතිගරු ජනාධිපතිතුමාගේ සම්බන්ධතා අධ්‍යක්ෂට යවන ලද ලිපියේ අපගේ පිටපතේ සඳහන් වන්නේ 2011.05.26 දින ඉල්ලුම්කරු හා පැවති සාකච්ඡාවේදී අක්. 1/2 ක ප්‍රමාණයක් ලබා දීමට යෝජනා කලද, ඉල්ලුම්කරු එය පිළි නොගන්නා බවයි. ඉහත පසුබිම මත ඒ ආකාරයෙන් කරුණු සිදු වී ඇත. 2012.06.20 දිනෙන් යුතුවද මේ සම්බන්ධව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් විමසීමක් කර ඇතත් පිළිතුරු ලබා දී නොමැත. එමනිසා එය තවමත් නිරාකරණය නොවූ කරුණක්ව පවතී.

(VII) <u>පිටකන්ද වත්ත</u>

කොම්පනි සභාවේ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට පිටකන්ද ඉඩම පවරා දීමට කටයුතු කර තිබියදී පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් කොම්පනි සභාවේ නියමයන්ට හා රෙගුලාසිවලට පටහැනිව 2005 වසරේදී රු. 5,400,000/- ක මුදලට බදු පදනම මත සූරියා ටෙක්ස්ටයිල් මිල්ස් පුද්ගලික සමාගම වෙත ද ඔවුන් විසින් ඉහත දේපල රු. 400,000/-ක මුදලට එස්.එස්.එච්. ඔටෝ මොබයිල් ඇන්ඩ් ඉන්වෙස්මන්ට් පුද්ගලික සමාගමට විකුණා තිබීම, පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් කොම්පනි සභාව දැනුවත් නොකිරීම නිසා මෙය සිදු වී ඇත. පාර්ශවයන් ගෙන්වා සාකච්ඡා කර පියවර ගැනීමට උපදෙස් ලබාදී ඇත.

(VIII) <u>යාලබෝව වත්ත</u>

මොණරාගල දිස්ත්‍රික්කයේ පිහිටි යාලබෝව වත්ත ඉඩමෙන් අක්කර 196 රූඩ් 0 පර්චස් 04 ක ප්‍රමාණයක් බදු මුදල් ගෙවීමකින් තොරව සීනි සංයුක්ත මණ්ඩලය විසින් 1982 දක්වා භුක්ති විඳ ඇත.

මෙම ඉඩමේ ප්‍රමාණය පැලවත්ත සීනි සමාගමට භාර දී ඇති අතර, එයින් අක්කර 50 ක ප්‍රමාණයක් මහ/650 ප්‍රකාශිකාවගේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ලබාදුන් පසු පැලවත්ත සීනි සමාගම මින් අක්කර 146 ක ප්‍රමාණයක් භුක්ති විඳ ඇත.

එම අක්කර 146 ක ප්‍රමාණය නියමානුකූල කිරීම සඳහා ඉඩම මැණුම් කිරීමේදී ඔවුන් භුක්ති විඳි ප්‍රමාණය අක්කර 224 රූඩ් 2 පර්චස් 38 ක් බව අනාවරණය වී ඇත.

පැලවත්ත සීනි සමාගම භුක්ති විඳි මෙම ඉඩම් ප්‍රමාණයම ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත.

සමාජ සුභ සාධන අමාත්‍යවරයාගේ ඉල්ලීමට අනුව මොණරාගල දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් දන්වා ඇත්තේ ඉහත දක්වා ඇති සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයම පැලවත්ත සීනි සමාගමට ලබාදී ඇති බැවින් එම ඉල්ලීම ඉටු කිරීමට නොහැකි බවය.

දිස්ත්‍රික් කාර්යාලයේ මාණ්ඩලික සහකාර විසින් දන්වා ඇත්තේ පැලවත්ත සීනි සමාගමට අක්කර 146 ක ප්‍රමාණයක් ලබා දී ඉතිරි අක්කර 78 ක ප්‍රමාණය නගර සංවර්ධනයට නිදහස් කළ යුතු බවයි.

නමුත් මැණුම් කිරීමට ප්‍රථම මෙම සම්පූර්ණ ඉඩම පැලවත්ත සීනි සමාගම විසින් භුක්ති විඳ ඇති බැවින් 5795 දරණ කොමිෂන් තීරණය මගින් අක්කර 224 රූඩ් 2 පර්චස් 38 ක ප්‍රමාණයට පැලවත්ත සීනි සමාගම වෙත බදු දීමට තීරණය කර ඇත. තත්වය මෙසේ තිබියදී නැවතත් මෙම සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයම ලබා දෙන ලෙස පැලවත්ත සීනි සමාගම විසින් ඉල්ලා ඇත. කෙසේ වෙතත් මෙම ඉඩම ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ රජයට පවරා ගෙන ඇත.

(IX) <u>කුඹල්ගොඩ වත්ත</u>

මෙම කොමිෂන් සභාවේ ර/103 ප්‍රකාශක වන ඩී. එස්. ධර්මදාස මහතා විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි කුඹල්ගොඩ ගෲප් නැමැති ඉඩමේ කොටස් 03 ක් සඳහා නියමිත ආකෘති පත්‍ර 03 ක් මගින් පහත පරිදි ප්‍රකාශන පත්‍ර ඉදිරිපත් කර ඇත.

| සවිස්තර විශේෂ්‍ය අංක | ඉඩමේ නම | ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | අක්. | රූ. | පර්. |
| ර/103/ර/01 | කුඹල්ගොඩ ගෲප් | 12 | 0 | 30 |
| ර/103/ර/07 | කුඹල්ගොඩ ගෲප් (මැදලන්ද කොටස) | 09 | 0 | 08 |
| ර/103/ර/09 | කුඹල්ගොඩ ගෲප් | 20 | 3 | 20 |

ඉහත පරදි ප්‍රකාශිත ඉඩම් අතුරින් ර/103/ර/7 සහ ර/103/ර/9 යටතේ ප්‍රකාශිත ප්‍රමාණයන් ප්‍රකාශකගේ නීතිමය බැඳීම් සඳහා ලබා දී ඇති බව ගොනුව අනුව පැහැදිලි වේ.

ර/103/ර/1 යටතේ ප්‍රකාශිත ඉඩම් තනි ඉඩමක් නොවන අතර, එය පහත සඳහන් පරිදි ඉඩම් කොටස් 04 කින් සමන්විත වන බව ගොනුව අනුව පැහැදලි වේ.

i. පරදෙනිය හේන සහ දෙහිගහහේන
ii. ගම්ඉමේ හේන
iii. ගල්කොටුවේ හේන
iv. පරහ වත්තේ හේන සහ දොඹගහ වෙල හේන

ඉහත සඳහන් ඉඩම් කොටස්වලින් ප්‍රකාශකට අයිති ප්‍රමාණයන් පහත පරිදි වන බව කොම්පන් සභාවේ නීති නිලධාරින් විසින් නිකුත් කර ඇති 1981.01.20 දිනැති වාර්තා අනුව පැහැදිලි වේ.

| ඉඩමේ නම | ප්‍රමාණය | | |
|---|---|---|---|
| | අක්. | රූ. | පර්. |
| i. පරගහදෙනිය සහ දෙහිගහ හේන | 15. | 1. | 19 |
| ii. ගමේ ඉමේ හේන | 01. | 0. | 03 |
| iii. ගල්කොටුවේ හේන | 00. | 2. | 00 |
| iv. පරහ වත්තේ හේන සහ දොඹගහවෙල හේන | 03. | 0. | 37 |
| | 10. | 0. | 19 |

ඒ අනුව එකී ප්‍රමාණය කොම්පන් සභාව සතු වී ඇති අතර, එම ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 2.02 ක ප්‍රමාණය අංක 417/9 සහ 1986.09.02 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කිරිම මගින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා දී ඇත. ඉහත ඉඩම් කොටස් 04 සඳහා ප්‍රකාශකට පැවති අයිතියට සමාන අයිතියක් ප්‍රකාශකයකු නොවන රත්නා විජේසිරිවර්ධන යන අයටද තිබී ඇති බව ගොනුව අනුව පැහැදිලි වේ.

එකී හවුල් අයිතිය ක්ෂේත්‍රයේ නිශ්චිතව මැනිමක් තුලින් හඳුනා ගැනීමට කටයුතු කර ඇති බවට තොරතුරු නොමැත. තවද, ඉහත පරිදි ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා දී ඇති බිම් ප්‍රමාණය මැණුම් කර පවරා දී නොමැති බැවින් එම ප්‍රමාණය ද ක්ෂේත්‍රයේ නිශ්චිතව හඳුනා ගැනීම දුෂ්කර වේ.

රත්නපුර දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් රත්නපුර සහකාර ඉඩම් කොමසාරිස් අමතා ඇති 1986.10.25 දිනැති ලිපියේ සඳහන් කරුණුවල නිරවද්‍යතාවය පිළිබඳ තහවුරු වීමක් අදාළ ගොනුව අනුව නොපෙනේ. ඒ අනුව එය නිවැරදි ලෙස ගැලපීමේ හැකියාවක් ද නොපවතී.

ඉඩම් කොටසේ ක්ෂේත්‍රත්වය පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරියාගේ වාර්තාව දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය සහිතව ලබා ගැනීම මගින් ක්ෂේත්‍රයේ ඉඩම් නිදහස්ව පවතින බව තහවුරු වූ නිසා අංක 6046 හා 2005.11.07 දිනැති කොම්පත් තීරණය මගින් බදු දීමට තීරණය කොට ඇත. එකී තීරණය අනුමත කර ඇති අමාත්‍යතුමාගේ අනුමත ලිපියේ ද ඉඩම් ප්‍රමාණය අක්. 42 පර්. 18 ලෙස සඳහන් වේ.

මේ අනුව අදාළ පවරා දී ඇති ප්‍රමාණයට (හෙක්. 2.5) වඩා ඉඩම් ප්‍රමාණයක් ඉහත කරුණු අනුව පවතින නිසා ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාග් ලිපිය ර්ට අදාළව පවරා දී ඇති හෙක්. 2. 2 ප්‍රමාණයට සීමා වන බව පෙනේ.

කෙසේ වෙතත් මෙම සියලු කරුණු අනුව කොම්පත් සභාව ක්‍රියා කර ඇති ආකාරය පටිපාටිමය වශයෙන් දෝෂ සහගත බවත් නොපෙනෙන අතර, නිශ්චිත ප්‍රමාණය සඳහා නීත්‍යානුකූල බදුකරුවෙක් ලෙස පූර්ව බදුකරු හඳුනා ගැනීමේ හැකියාවක් නොපවතී.

( X ) <u>තණහේන වත්ත</u>

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පත් සභාව සතු තණහේන වත්ත ඉඩමේ අංක 2001/21 දරණ පිඹුරට අනුව කැබලි අංක 1-5 දක්වා පෙන්නුම් කර ඇති අක්කර 01 රූඩ් 2 පර්චස් 11.7 ක ප්‍රමාණය කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය මත අංක 5122 දරණ කොම්පත් තීරණයට අනුව නෝර්ත් වෙස්ටන් ඇපරල් පුද්ගලික සමාගමට වසර 30 ක කාලයකට බදු දීමට එවකට ගරු විෂයභාර අමාත්‍යවරයා අනුමත කර ඇත.

පසුව මෙම ආයතනය විසින් ඩිසයින් ස්ටුඩියෝ මැනුෆැක්චරිස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත මෙම ඉඩම ලබාදීමට යොමු කරන ලද ඉල්ලීමට අනුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ලබා දීමට 7791 දරණ කොම්පත් තීරණය මගින් අනුමත කර ඇත. විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව තීරණයක් ගැනීමට නැවත කොම්පත් සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, මීට පෙර මෙම ඉඩම බදු දීමට එවකට විෂයභාර අනුමැතිය ලැබී ඇති බැවින් නැවත අනුමැතිය ලබා ගැනීම් අවශ්‍යතාවයක් පැන නොනගින බවට 8339 දරණ කොම්පත් සභාව මගින් තීරණය කර ඇත.

අදාළ ආයතන දෙකම ව්‍යාපාරික කාර්යයේ ඇගළුම් කර්මාන්ත නිසා ඒ සම්බන්ධ ස්ථානය හා කාර්යය සඳහා විෂයභාර ඇමතිතුමා වරක් අනුමත කර තිබේනම් නාමය වෙනස් විමකදී නැවත ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමක් අදාළ නොවන්නේ ය පදනම මත කොම්පම අදාළ තීරණය ගෙන ඇත.

මෙම තීරණය මීට පෙර 2013.11.26 දින විගණන විමසීමේදී විමසා ඇති අතර, කොම්පන් තීරණය පිළිබඳව 2014.01.13 දින මාගේ ලිපියේ **අ** ඡේදය යටතේ පැහැදිලි කර ඇත.

### ( XI) <u>මුල්හල්කැලේ වත්ත (තැන්නහේන වත්ත)</u>

ඉඩම් ප්‍රතිසංස්කරණ කොම්පන් සභාව සතු නුවරඑළිය දිස්ත්‍රික්කයේ තැන්නහේන පිහිටි මුල්හල්කැලේ වත්ත ඉඩමෙන් අක්කර 02 ක ප්‍රමාණයක් කාසල් පවර් හවුස් පුද්ගලික සමාගම වෙත ජල විදුලි ව්‍යාපෘතියක් සඳහා 2012.04.07 දින භුක්තිය භාරදී ඇති අතර, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්.එම්.යූ.එන්.කේ.රත්නායක මිය විසින් 2014.04.23 දින ලියා සහතික කරන ලද අංක 5772 දරණ බදු ගිවිසුම සකස් කර ඇත.

## 4.4. <u>ද්‍රව්‍ය අක්‍රමිකතා</u> ඃ

අම්පාර දිස්ත්‍රික් කාර්යාලයේ අධ්‍යක්ෂ නිළ කාමරයේ තිබූ ලිපිගොනු සහ මුදල් කුවිතාන්සි පොත් නැතිවීම සම්බන්ධයෙන් අදාළ පොලිස් ස්ථානය වෙත පැමිණිලි කර ඇති අතර, අදාළ පොලිස් ස්ථානය විසින් මේ වන විටද පරීක්ෂණ සිදු කරගෙන යනු ලැබේ.

මෙකී කාල සීමාව තුල අම්පාර දිස්ත්‍රික් කාර්යාලයේ සේවයේ නියුතුව සිටි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා ප්‍රධාන කාර්යාලය වෙත ස්ථාන මාරු කරන ලද අතර, ඔහුගේ රාජකාරී ක්‍රියා කලාපයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනයට ලක්කර 2011 වර්ෂයේ සිට මුදල් කුවිතාන්සි මගින් අයකර බැංකුගත නොකරන ලද රු. 1,299,750/- ක මුදලක් වාරික වශයෙන් අයකර ගැනීමටද කටයුතු කරන ලදී.

තවද, මේ සම්බන්ධයෙන් විමර්ශන නිලධාරියකු පත්කර මූලික විමර්ශනයක් සිදු කරන ලද අතර, ඔහු විසින් ඉදිරිපත් කරන ලද මූලික විමර්ශන වාර්තාව අනුව විමර්ශන චෝදනා පත්‍ර ඉදිරිපත් කර විධිමත් විනය ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් පවතී. කටයුතු කිරීම මේ වන විටත් ආරම්භ කර ඇති බව වාර්තා කර සිටිමි.

## 4.5. හඳුනා ගන්නා ලද පාඩු

ඉ.ප්‍ර.කො. සභාවේ කටයුතු පරිගණක ගත කිරීමේ වැඩ පිලිවෙල යටතේ 2002 වර්ෂයේදී මිල දී ගනු ලැබූ පරිගණක පද්ධතිය සම්බන්ධයෙන් සිදු වී ඇති අක්‍රමිකතාවය පිලිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිරීමෙන් පසුව එම ආයතනයෙන් පරීක්ෂණ කටයුතු පවත්වා ඒ සඳහා නීතිමය උපදෙස් ලබා ගැනීමට නීතිපතිතුමා වෙත යොමුකර ඇත.

නීතිපතිතුමන් විසින් පැමිණිල්ලේ සඳහන් කරුණු අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණයට භාජනය විය යුතු බැවින් මෙම කරුනු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට 2006.04.20 දිනැතිව යොමුකර ඇත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ඊට අදාළව BC/1322/06/3-14 යටතේ විමර්ශන කටයුතු පවත්වා ගෙන යනු ලබන බව වාර්තා කර තිබුණි.

එකී විමර්ශනයට අදාළ ලිපිලේඛණ ද එම ආයතනය වෙත භාරගත් අතර, මේ වන විට එම ලිපිලේඛණ ඉ.ප්‍ර.කො.සභාව වෙත නැවත භාර දී ඇති අතර. මෙකී කරුණු සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනය මගින් අනාවරණය වූ කරුණු මත අල්ලස් පනත යටතේ අධිකරණයේ දී නඩු පවරා සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු නොමැති බැවින් තවදුරටත් කටයුතු නොකිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව තීරණය කළ බවට දන්වමින් 2014.02.07 දිනැති ලිපිය යොමු කර ඇත.

මෙම කරුණු ඉදිරි කොමිෂන් සභා වාරය වෙත ඉදිරිපත් කර එහිදී ලැබෙන්නාවූ උපදෙස් මත ඉදිරි පියවර ගැනීමට නියමිතය.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය ඃ

ඉ.ප්‍ර.කො.සභාව වෙනුවෙන් මේ වන විට සේවක සංඛ්‍යාව **307** ක් සඳහා අනුමැතිය ලැබී ඇති අතර, අනුමත සේවක සංඛ්‍යාවෙන් බැහැරවූ සේවක සංඛ්‍යාව සඳහා ද ඔවුන්ගේ අවශ්‍යතාවය සාධාරණිය කරමින් අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය තොරතුරු ජනාධිපති කාර්යාලය හරහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

සමස්ථ සේවක සංඛ්‍යාව සඳහාම නුදුරු දිනයකදී අනුමැතිය ලැබෙතැයි අපේක්‍ෂා කරන බැවින් එසේ අනුමැතිය ලබා ගත් පසු පුරප්පාඩුව පවතින තනතුරු සඳහා සුදුස්සන් බඳවා ගැනීම් කිරීමට කඩිනම් ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය ඃ

**5.1 සංයුක්ත සැලැස්ම**

2013 - 2017 සංයුක්ත සැලැස්ම ඡායා පිටපත් ලබා ගැනීමේදී ඇති වූ යම් යම් ප්‍රමාදයන් නිසාවෙන් එක් පිටුවක් අඩුවෙන් ලේඛණයට ඇතුලත් වී ඇති බව නිරීක්‍ෂණය කලෙමි. මෙය හුදෙක්ම සිදු වී ඇති ප්‍රමාද දෝෂයක් වන අතර, මින් ඉදිරියට සකස් කරනු ලබන ලිපිලේඛණ සම්බන්ධයෙන් නැවත පරීක්‍ෂා කර බැලීමක් සිදු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

(අ), (ආ), (ඇ), (ඈ), විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කරන ලෙසටත්, ඉදිරි වර්ෂයන් සඳහා සකස් කරනු ලබන ක්‍රියාත්මක සැලැස්ම කෙරෙහි නැවත නැවතත් පසු විපරම් කටයුතු සිදු කරන ලෙසටත් අදාළ නිලධාරීන් දැනුවත් කරන ලදි.

**5.3 අභ්‍යන්තර විගණනය**

2013 වර්ෂය සඳහා ඉදිරිපත් කල අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාවට නැංවීමේදී කඩිනම් ඔප්පු බෙදා දීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රමුඛස්ථානය දෙමින් ආයතනයේ යෝජිත වූ කාර්යයන් බොහෝ දුරට ඉටු කර ඇති අතර, ඉඩම් උපරිම සීමා අංශයේ ලිපිගොනු, වන්දි ගෙවීම් පරීක්‍ෂා කිරීමේදී ප්‍රකාශකයින්ගේ ගොනු, ව්‍යවස්ථාපිත නිශ්චය, පවුලතුල පැවරීම, හුවමාරු, බුක්තිය භාර ගැනීමේ සහතිකය, ඉ.ප්‍රකො.සභාවට පැවරි ඇති ප්‍රමාණය

ගැසට් කර තිබේද, වන්දි ගෙවා තිබේද, නීති නිලධාරියකු විසින් ඉඩම් අයිතිය තහවුරු කර තිබේද, ඉඩම් හුවමාරු කිරීමේදී ප්‍රධාන තක්සේරුකරු විසින් ඉඩම් තක්සේරු කර තිබේද, තක්සේරු වටිනාකමේ වෙනස අයකර තිබේද, යන්න පරීක්ෂාවට ලක්කර ඇත.

එමෙන්ම මැණුම් අංශය පරීක්ෂාවට ලක් කිරීමේදී ඉ.ප්‍ර.කො. සභාවට පැවරී ඇති ඉඩම් ලියාපදිංචි කර ඇති මිනින්දෝරුවෙකු විසින් පිඹුරු සකස් කර ඇද්ද, එය මැණුම් අධ්‍යක්ෂ විසින් අනුමත කර තිබේද, ඒ වෙනුවෙන් 10% ක අධීක්ෂණ ගාස්තු ගෙවා තිබේද, යන්න හා ඉඩම්වල කට්ටි කැඩීමට නියමානුකූල ආකාරයට මැනුම් නියෝග නිකුත් කර තිබේද, මැණුම් නියෝග නිවැරදි වගන්තියට අනුව නිකුත් කර තිබේද (බදුද/විකිණීම්ද) ආදී වශයෙන් විගණනයට භාජනය කර ඇත.

තවද සියලුම දිස්ත්‍රික් කාර්යාල විගණනය කිරීමට සැලසුම් කලද, එය පැවති රාජකාරිය සමග ඉටු කිරීමට නොහැකි වී ඇති අතර, 2014 වර්ෂයේදී එය ඉටු කිරීමට උපදෙස් දෙන ලදී.

**5.4 විගණන කමිටු**

පීඩී/චක්‍රලේඛ12 (යහපාලනය සඳහා මාර්ගෝපදේශ) චක්‍රලේඛයේ 7.4.1 ට අනුව විධායක නොවන කොම්පත් සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විගණන හා කළමනාකරණ කමිටුව පවත්වනු ලබන අතර, විගණකාධිපති වාර්තාවේ දක්වන පරිදි මේ සම්බන්ධව 2014.10.10 දින විගණන හා කළමනාකරණ කමිටු වාර්තාවට අනුව ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.

**5.5 අයවැය ලේඛණමය පාලනය ඃ**

ඇස්තමේන්තු ගත ආදායම් වියදම් හා සත්‍ය ආදායම වියදම අතර, වෙනස සොයා බලා අයවැය ඇස්තමේන්තුව සංශෝධනය කරමින් පවත්වා ගෙන යාම සිදුකළ යුතු වුවත්, 2013 වසර තුල එසේ සිදු කිරීමට නොහැකි විය. දැනට 2014 වර්ෂය සඳහා අයවැය විචලයන් පරීක්ෂා කර බලා එයට පාදක වූ හේතු සහිතව කොම්පත් සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කර ඇත. ඒ අනුව ඉදිරියේදී මෙය වඩාත් ක්‍රමවත්ව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

## 5.6 <u>වාර්ෂික වාර්තා සභාගත කිරීම:</u>

2012 වාර්ෂික වාර්තාව සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ජනාධිපති කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් විගස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරිමේ හැකියාව ඇත.

## 6. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) 2013 වසරේ සිට ගිණුම් අංශයට අදාළ කුවිතාන්සිපත්වල පිටපත් ප්‍රධාන කාර්යාලයට ලබාගත් අතර, 2014 වසර තුළ එම ආදායම් වාර්තාව, මුදල් පොතේ උධෘතය ද සමග ලබා ගැනීමට ක්‍රම වේදයක් පවත්වා ගෙන යනු ලැබේ.

(ආ) දිස්ත්‍රික් කාර්යාල වෙත ලැබෙන ආදායම ප්‍රධාන කාර්යාලයේ ගිණුම වෙත මාරු කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කර ගැනීම සඳහා සෑම මසක් අවසානයේ ආදායම් විස්තර ඊළග මස 05 වෙනිදාට පෙර දුරකථනය මගින් ලබා ගැනිම සිදු කෙරේ. මෙසේ ලබා දෙන ආදායම් විස්තර ආදායම් ලේඛණ සමග බොහෝ දුරට නිවැරදි වේ. සියලුම දිස්ත්‍රික් කාර්යාල වෙත ආදායම් වාර්තා එවන ලෙසට දැනුම් දී ඇතත්, සමහර මාසවල එවන ලද ආදායම් වාර්තා ගොනුගත නොවීම මත අඩුවී ඇත. 2014 වර්ෂයේ සිට සියලුම ආදායම් වාර්තා ලබා ගන්නා ලෙසට අධ්‍යක්ෂ/ආදායම් සහ අධ්‍යක්ෂ/මුදල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

(ඇ) සෑම ගිනුමකට අදාල බැංකු සැසදුම් වාර්තා පරීක්ෂා කර බලා අනුමත කර ඊළග මස 15 ට පෙර විගණකාධිපති වෙතද යොමු කරනු ලැබේ. එහි සකස් කල බවට, පරීක්ෂාකල බවට හා අනුමත කල බවට අත්සන් කර ඇත.

(ඈ) විගණනයෙන් පෙන්වා දී තිබූ පරිදි ඉදිරියේදී දෛනික ධාවන සටහන් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අවධානයට ලක් කල යුතු බවටත්, මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා ලෙසට දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා රියදුරු සහ ධාවන සටහන් පරීක්ෂා කරනු ලබන නිලධාරිණිය වෙතද දැනුම් දී ඇත.

(ඉ) නඩු ලේඛණයක් සකස් කිරිමට අදාළ නිලධාරන් දැනුවත් කර ඇති අතර, දැනට එය සකස් කිරිමට පියවර ගෙන ඇති බව වාර්තා කර ඇත.

(ඊ) සෑම වසරකම ගිණුම් වල දැක්වෙන ශේෂයන් සනාථ කර එවන ලෙසට ලිපි මගින් දැනුම් දුන්නද ඒ සඳහා ලැබෙන ප්‍රතිචාර ඉතා අඩු මට්ටමක පවතී. සමහර ආයතන දැනට නොමැතිවීමත්, ලිපිනයන් වෙනස් වීම හෝ සොයාගත නොහැකි වීමත් යන කරුණු මත ශේෂ සනාථ නොලැබී ඇත. කෙසේ වෙතත් මේ සඳහා උපරිම උත්සාහයක් දරමින් පවතී.

නීතිඥ නිමල් ජී.පුංචිහේවා
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

<u>**පිටපත**</u>:- ජනාධිපති ලේකම්,
ජනාධිපති කාර්යාලය,
කොළඹ.

.

## 2013.06.11 දින පැවැත්වෙන විගණන හා කළමණාකරන රැස්වීමේදී සාකච්ඡාවට බඳුන්වන කරුණු

01. ලිපිගොනු සංඛ්‍යාව

| | | |
|---|---|---|
| i | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම් තහවුරු කර නොමැති කම නිසා වන්දි ගෙවීමට නොහැකිවීම. | 115 |
| ii | වන්දි වෙනුවට තුවමාරු ඉඩම් ඉල්ලා සිටීම | 25 |
| iii | බුක්තිය භාර ගැනීමේ සහතික නොමැතිවීම | 37 |
| iv | ප්‍රකාශකයින් වෙත යවන ලද වන්දි ප්‍රදාන ලිපියට අනුමැතිය දී නොඑවීම හා වවුචර්පත් අත්සන් කර භාර නොදීම | 127 |
| v | වෙනත් හේතු | 26 |
| vi | ගැසට් නිවේදන පල කොට වන්දි තීරණය කිරීම සඳහා වැඩ කරමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව | 200 |
| vii | වන්දි ගෙවීමට අදාලව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව | 670 |

ඉහත කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම.

02. වැට් බද්ද ලියාපදිංචි කිරීම හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

03. දිස්ත්‍රික් කාර්යාල මගින් ලැබෙන විවිධ ආදායම් වැඩිදියුණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.

04. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා මසකට රු.330000/- ගෙවල් කුලී ගෙවීමට සිදු වී ඇති අතර අලුත් ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම.

05. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සේවකයින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 307 ක ප්‍රමාණයක් අනුමත කර එවා ඇති අතර ඉතිරි පිරිස අනුමත කර ගැනීමට සාකච්ඡා කිරීම හා කළමනාකරණ සේවා අංක 30 අනුව සේවකයින් සියලු දෙනා අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සිදු කර ඇත.

06. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංචිතයේ ඇති වාහන හා දිස්ත්‍රික් කාර්යාල වලට ආදායම් වැඩිකර ගැනීම සඳහා ලබාදුන් වාහන වෙනුවෙන් [illegible] මුදලක් වැය වන බවත් , පසුගිය වකවානුවේ සිදු වූ වාහන අනතුරු පිළිබඳවත් වාහන [illegible] කිරීම , වාහන පුද්ගලික පාවිච්චිය සම්බන්ධව සාකච්ඡා කිරීම.

07. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ණයගැතියන් පිළිබඳ රජයේ ආයතන හා පෞද්ගලික ආයතන සම්බන්ධයෙන් ගත යුතු නීතිමය පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

ලේකම්.

විගණන හා කළමණාකරන කමිටුව

**2013.06.11 වැනිදින ප.ව. 2.00 ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවති 2013 වර්ෂයට අදාල 01 වැනි විගණන කමිටු රැස්වීම් වාර්තාව**

පැමිණීම :

1. පී.ඩබ්.සේනාරත්න මහතා - සභාපති
2. එම්.ඒ.එස්.වීරසිංහ මහතා - සාමාජික
3. එම්.අනෝමා තන්දනී මිය - සාමාජික
4. එම්.ආර්.ආර්.මල්ලව මිය - නිරීක්ෂණ මට්ටමින් සහභාගිවීම
5. එස්.ආර්.ඩබ්.එම්.පී.සත්කුමාර මයා - සාමාජික
6. වී.නරේන්ද්‍රනාදන් මයා - ලේකම්
7. සෙනරත් වනිගතුංග මයා - සාමාජික
8. ශ්‍යාමලී රත්නයාක මිය - සාමාජික
9. ජේ.ඩබ්.හපුආරච්චි මයා - සාමාජික

**නොපැමිණීම**

1. යු.කේ.මිහිඳුකුලසූරිය මයා - සාමාජික

ප්‍රථමයෙන්ම පසුගිය කළමණාකරන කමිටුවේදී සාකච්ජාවට බඳුන් වූ කරුණු පිළිබඳ කෙටි සමාලෝචනයක් කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව මෙහිදී භාණ්ඩාගාර නියෝජිතයෙකු ලෙස සහභාගි වන අනෝමා තන්දනී මහත්මිය විසින් මෙම කමිටු රැස්වීම සඳහා සාකච්ජාවට බඳුන් වන කරුණු අදාල පත්‍රිකා මගින් මෙම රැස්වීමට ඉදිරියේදී ඉදිරිපත් කර පුළුල් ලෙස සලකා බලා ගන්නා ලද තීරණයක් වේ නම්, එහිදී ගනු ලබන නිර්දේශය කොමිෂන් සභාවට ඉදිරිපත් කර එය අනුමත කරවා ගත යුතු බව කියා සිටින ලදී.

01.

i. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම තහවුරුකර නොමැති කම නිසා වන්දි ගෙවීමට නොහැකිවීම.
   ලිපිගොනු සංඛ්‍යාව 115 කි.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම තහවුරු කර නොමැති නිසා වන්දි ගෙවීමට නොහැකිවීම සාකච්ජාවට භාජනය වූ අතර මෙසේ වන්දි ගෙවීම ප්‍රමාද වීමෙන් ඉතා අධික ප්‍රමාණයක් පොලී මුදල් ගෙවීමට සිදුවන බැවින් විශේෂයෙන් සැලකිල්ලට ගන්නා ලදී.

ඒ අනුව අදාල ඉඩම් වල නම් සහ ප්‍රකාශකයින්ගේ නම් ඇතුලත් ලේඛනයක් සිංහල ඉංග්‍රීසි හා දෙමළ බසින් ප්‍රවෘත්ති පත්‍රවල පල කිරීමටත් සහ රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමටත්, අනතුරුව මසක් ඇතුලත ප්‍රතිචාරයක් නොලැබුනහොත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට තීරණය විය. කෙසේ වෙතත් මෙම දැන්වීම පල කිරීමට ප්‍රථම නීති උපදේශක වෙත යොමුකර නිර්දේශ ලබාගැනීමට උපදෙස් දෙන ලදී.

ii වන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටීම. - ලිපිගොනු සංඛ්‍යාව 25

අදාල පුද්ගලයින්ට වන්දි වෙනුවට ඉඩම් හුවමාරු කිරීම සඳහා ප්‍රතිපාදන පනතේ සලස්වා නොමැති බවත්, එමනිසා මාසයක කල්දීමක් කර ඊට ප්‍රතිචාර නොලැබුණහොත් අදාල වන්දි මුදල උසාවියේ තැන්පත් කරන බව දන්වා යැවීමටත් ඒ අනුව කටයුතු කිරීමටත් තීරණය විය.

iii බුක්තිය බාරගැනීමේ සහතික නොමැතිවීම - ලිපිගොනු සංඛ්‍යාව 37

මෙම සහතිකය නොමැතිවීමෙන් සිදුවන අභ්‍යන්තර ප්‍රතිඵලය අයිතිකරුවන්ට වන්දි ගෙවා අදාල ගොනු වසා දැමීමට නොහැකි වීමයි. මේ සඳහා ප්‍රායෝගික විසඳුමක් සේ අදාල ඉඩම් අයිතිකරුවන් විසින් වන්දි ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ නම් , එම කාර්ය සඳහා අදාල ඉඩම සොයා දෙන ලෙස ලිඛිතව දන්වා යවා අදාල ඉඩම හඳුනාගැනීමට කටයුතු කිරීමය. එසේ ඉඩම පෙන්වාදීමට නොහැකිවුවහොත් එම කරුණු පදනම් කරගෙන අයිතිකරුට දන්වා අදාල ගොනුව තාවකාලිකව වසා දැමීමට කටයුතු කල හැකිද යන්න සලකා බැලීමට තීරණය විය.

iv ප්‍රකාශකයින් වෙත යවන ලද වන්දි ප්‍රදාන ලිපියට අනුමැතිය දී නොඑවීම හා වවුචර් පත් අත්සන් කර භාර නොදීම - ලිපිගොනු සංඛ්‍යාව 127

මෙම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් තීරණයක් ලබාගෙන ඇති බැවින් ඒ අනුව කටයුතු කිරීමට තීරණය විය.

මොහාන් මෙන්තු - ලිපිගොනු සංඛ්‍යාව 26

එක් එක් ගොනුව තනි තනිව හෝ අධ්‍යනය කර ගැටළුව තීරණය කර ඒ අනුව ඉදිරියට කටයුතු කිරීමට තීරණය විය.

vi ගැසට් නිවේදන පල කොට වන්දි තීරණය කිරීම සඳහා වැඩ කරමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව 200

මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර කොමිෂන් සභාව වෙත කොමිෂන් පත්‍රිකාවක් සකස් කර ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි වෙත උපදෙස් දෙන ලදී.

vii වන්දි ගෙවීමට අදාළව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති - ලිපිගොනු සංඛ්‍යාව 670

මෙම ලිපිගොනු 670 සම්බන්ධයෙන් නිශ්චිත කාලයක් තුළදී නිම කිරීමට අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට අධ්‍යක්ෂ ඉඩම් උපරිම සීමා සහ අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි සමග සාකච්ඡා කර විගණන හා කළමණාකරන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

02. වැව් බද්ද ලියාපදිංචි කිරීම හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම

මේ පිළිබඳව සවිස්තරාත්මක ලිපියක් මුදල් අමාත්‍යාංශය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර අවශ්‍ය උපදෙස් ලබාගැනීමට තීරණය විය.

03. දිස්ත්‍රික් කාර්යාල මගින් ලැබෙන විවිධ ආදායම් වැඩි දියුණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම.

අධ්‍යක්ෂ ආදායම් සමග සාකච්ඡා කර බදු ලෙජරයක් සකස් කිරීමට උපදෙස් දෙන ලදී.
විවිධ ආදායම් යටතේ මැණික් , කළුගල් ආදී ඛනිජ සම්පත් සහිත ඉඩම් වලින් දීර්ඝ කාලීන බදු දෙන ඉඩම්වල බදු හා සුළු බදු වශයෙන් දෙන ලද ඉඩම්වල බදු මුදල් ද ඇතුලත් වේ. මේ සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් සාකච්ඡා කළ අතර, දැනට සියලුම

14

බදු ඉඩම් සම්බන්ධ ලේඛනයක් දිස්ත්‍රික් කාර්යාලවල පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය වේ. බදු ලබාදී ඇති ඉඩම් වල ව්‍යාපෘති පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක සමග දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධ වී වාර්තාවක් ඒලග රැස්වීම් වාරය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී. එම වාර්තාව නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර චක්‍රලේඛනයක් මගින් අදාල නිලධාරීන් දැණුවත් කිරීමට කටයුතු කිරීමට තීරණය කරන ලදී.

04. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා මසකට රු. 330000/- ගෙවල් කුලී ගෙවීමට සිදුවී ඇති අතර අලුත් ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ සාකච්ඡා කිරීම.

කොළඹට ආසන්නයේ විකල්ප ඉඩමක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයක් සෑදීමට ඉඩම් කොමසාරිස් ජනරාල් සමග සාකච්ඡා කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දෙන ලදී.

05. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු 307 ක ප්‍රමාණයක් අනුමත කර එවා ඇති අතර ඉතිරි පිරිස අනුමත කරගැනීමට සාකච්ඡා කළ යුතු බව තීරණය විය. කළමණාකරන සේවා අංක 30 අනුව සේවකයින් සියලු දෙනා අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සිදුකර වැටුප් සකස් කිරීමට කටයුතු කර ඇත.

කළමණාකරන සේවා අංක 30 අනුව සංශෝධිත බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර එවනු ලැබූ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CI/1021 හා 2012.11.12 දිනැති ලිපියට අනුව දැනට අන්තර් ග්‍රහණ ක්‍රියාවලිය සිදුකර ඇත. එම ලිපියේ 2 වන ඡේදය අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ අංක 2/1/113(1) හා 2012.10.18 දිනැති ලිපියේ අංක 3.4.5 සහ 6 ඡේදවල සඳහන් ගැටළුකාරී තත්වයන් ඉවත් කිරීම සඳහා එම ලිපිය නිකුත් කර ඇත. එහි ඇමුණුම් 02 සහ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය සඳහා සකස් කරන ලද උප ලේඛණය සමග සැසඳීමේදී තවදුරටත් විෂමතාවයක් ඇති බවට නිරීක්ෂණය කරන ලදී. එබැවින් අධ්‍යක්ෂ කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන විසින් ඇමුණුම් 02 ට අනුකූල වන සේ අදාල ලේඛනය සකස් කර තවදුරටත් විෂමතා ඇති වන්නේ නම් , එම විෂමතා සවිස්තරාත්මකව සකස් කර (අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන ) එම ලේඛනය විගණන හා කළමණාකරන කමිටුවට ඉදිරිපත් කිරීමට තීරණය විය.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ විය යුතු අතර නිරවද්‍යතාවය තහවුරු ගැනීම සඳහා අභ්‍යන්තර විගණක වෙත ඉදිරිපත් කළ යුතුය.

06. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංචිතයේ ඇති වාහන හා දිස්ත්‍රික් කාර්යාල වලට ආදායම් වැඩිකර ගැනීම සඳහා ලබාදුන් වාහන වෙනුවෙන් නඩත්තුවට අධික මුදලක් වැයවන බවත්, පසුගිය වකවානුවේ සිදු වූ වාහන අනතුරු පිළිබඳවත් වාහන ගාල් කිරීම වාහන පුද්ගලික පාවිච්චිය සම්බන්ධව සාකච්ජා කිරීම.

නිශ්චිත කරුණක් පිළිබඳ පෙන්වා දී නොමැති හෙයින් මේ පිළිබඳව ක්‍රියාකිරීමට අපහසු වන අතර, අදාල සිද්ධියක් සිද්ධීන් ඇතුලත් කර වාර්තාවක් සකස් කර මීළග විගණන රැස්වීමට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

07. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ණයගැතියන් පිළිබඳ රජයේ ආයතන හා පෞද්ගලික ආයතන සම්බන්ධයෙන් ගතයුතු නීතිමය පියවර සම්බන්ධයෙන් සාකච්ජා කිරීම.

ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් විස්තරාත්මක ලේඛනයක් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

08. වෙනත් කරුණු

- ස්ථාවර තැන්පතු වල මුදල් ආයෝජය කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු බවත් ඒ සඳහා ජනාධිපති ලේකම්තුමා මඟින් අනුමැතිය සඳහා ඉල්ලීම සුදුසු බවත් යෝජනා විය.
- ඉදිරියේදී සාකච්ජාවට බඳුන්වන කරුණු ඇතුලත් කර පත්‍රිකාවක් ලෙසට (උදා: කොමිෂන් පත්‍රිකා සකස් කිරීම) සකස්කර සතියකට පෙර අදාල සාමාජිකයින්ට ලබාදීමට කටයුතු කිරීමට කමිටු ලේකම් වෙත උපදෙස් දෙන ලදී.

මීළඟ කළමණාකරණ හා විගණන කමිටු රැස්වීම 2013 අගෝස්තු මස 08 වෙනි දින පැවැත්වීමට තීරණය කරන ලදී.

.....................................................
29.7.2013.

සභාපති

විගණන හා කළමණාකරණ කමිටුව

.....................................................

ලේකම්

විගණන හාකළමණාකරණ කමිටුව

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| එම්.ජ්.එස්.වීරසිංහ මහතා | - සාමාජික | |
| එම්.ආර්.ආර්. මල්ලව මිය | - නිරීක්ෂක | |
| එස්.ආර්.ඩබ්.එම්.පී.සත්කුමාර මයා | - සාමාජික | |
| එම්.අනෝමා නන්දනී මිය | - සාමාජික | |
| සෙනරත් වනිගතුංග මහතා | - සාමාජික | |
| ශ්‍යාමලී රත්නායක මිය | - සාමාජික | |
| ජේ.ඩබ්.හපුආරච්චි මයා | - සාමාජික | 2013/07/29 |

**2013.09.17 වැනිදින පෙ.ව.9.30 ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවති 2013 වර්ෂයට අදාල 02 වැනි විගණන කමිටු රැස්වීම වාර්තාව**

*පැමිණීම :*

| | | | |
|---|---|---|---|
| 01. | පී.ඩබ්.සේනාරත්න මහතා | - | සභාපති |
| 02. | එම්.ජේ.එස්.වීරසිංහ මහතා | - | සාමාජික |
| 03. | එම්.අනෝමා නන්දනී මිය | - | සාමාජික |
| 04. | එම්.ආර්.ආර්.මල්ලව මිය | - | නිරීක්ෂක |
| 05. | වී.නරේන්ද්‍රනාදන් මයා | - | ලේකම් |
| 06. | ශ්‍යාමලී රත්නායක මිය | - | |
| 07. | ජේ.ඩබ්.හපුආරච්චි මයා | | |
| 08. | කුමුදු ධර්මප්‍රිය මයා | | |

*නොපැමිණීම*

| | | |
|---|---|---|
| 01. | සෙනරත් වනිගතුංග මයා | - |

ප්‍රථමයෙන්ම පසුගිය කළමණාකරන කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වූ කරුණු පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**2013.09.17 දින පැවැති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය**

01.

1.i හිමිකම් තහවුරුකර නොමැති ප්‍රකාශකයින්ගේ ලිපිගොනු 115 ක් පවතින බවත් එය නිම වූ වහාම නීති උපදේශක වෙත යොමුකර නිර්දේශ ලබාගෙන ඊළග රැස්වීමට යොමු කිරීමට කටයුතු කරන බව අධ්‍යක්ෂ/තක්සේරු හා චන්දි වාර්තා කරන ලදී.

1.ii චන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටින පුද්ගලයින් 25 දෙනා වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යවා ඇති බවත්, පිළිතුරු ලැබූ පසු ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බව.

1.iii ශුක්තිය භාරගැනීමේ සහතික නොමැති ගොනු 37 ට අදාල තොරතුරු නිශ්චිතව සොයා ගැනීමට අපහසු නිසා අදාල අයිතිකරුවන් විසින් නැවත ඉල්ලීමක් කලහොත් ක්‍රියා කිරීමට හැකි වනසේ අදාල ගොනු වෙනම ලේඛනයක සටහන් කර තාවකාලිකව වසා දැමීමට තීරණය කරන ලදී.

1.v වෙනත් හේතුන්මත පමාවන ලිපිගොනු 26 පිළිබඳ අධ්‍යනය කරගෙන යන බව අධ්‍යක්ෂ/තක්සේරු හා වන්දි පවසයි.

1.vii වන්දි ගෙවීමට අදාලව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පලකිරීමට ඇති ලිපිගොනු 670 පිළිබඳ පසුගිය කමිටු අවස්ථාවේදී තීරණය වූ පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා ලේඛනාගාරයෙන් ලිපිගොනු ලබා ගැනීමේ අපහසුතාවයක් පවතින බවට කරුණු අනාවරණය වූයෙන් ඒ පිළිබඳ ඉහල කළමණාකාරිත්වයට ඉදිරිපත් කර විසඳුමක් ලබාගැනීමට තීරණය විය.

02. වැටි බඳු ගෙවීම අත්‍යාවශ්‍ය බව කමිටුව විසින් තීරණය කරන අතර මෙය ව්‍යවස්ථාපිත නිශ්චිත බැඳීමක් හෙයින් ඒ පිළිබඳව ආයතනය විසින් කටයුතු කර ඉක්මනින් තීරණය කළ යුතු බව කමිටුව විසින් පෙන්වා දෙන ලදී.

03. බදු ලෙජරයක් දැනට සකස් කරමින් පවතින බවත්, ඊලඟ රැස්වීමේදී ප්‍රගතිය වාර්තා කරන බවත්.

04. ප්‍රධාන කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් සොයමින් පවතී.

05. දැනට මෙම කරුණු සභාපතිතුමා වෙත යොමු කර ඇති අතර.ජනාධිපති කාර්යාලය සමග සාකච්ඡා කර මේ පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන බවට.

07. ණයගැතියන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත්කර නැත.

## 2013.09.17 දින සාකච්ඡාවට බඳුන් වූ පත්‍රිකා

**පත්‍රිකා අංක 01**

කොමිෂන් සභා නිලධාරීන්ගේ පාරිතෝෂික මුදල් ගණනය කිරීම.

**තීරණය**

මේ පිළිබඳ දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන අතර , පාරිතෝෂික මුදල් ගෙවීම පිළිබඳ කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ලදුව තීරණයක් ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

(වගකීම - අධ්‍යක්ෂ මුදල් වෙත පවරන ලදී.)

**පත්‍රිකා අංක 02**

ඉඩම් උපරිම සීමා අංශයට අදාල නීතිමය බැඳීම් සඳහා ලේඛනගත තොරතුරු ලබාදීම

**තීරණය**

ව්‍යවස්ථාපිත නිශ්චය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ඉදිරිපත් නොවන අයිතිකරුවන් හඳුනාගෙන ඒ පිළිබඳව කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත්කර එම ගොනු තාවකාලිකව හෝ ස්ථිරව වසා තැබීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කරන ලදී.

**පත්‍රිකා අංක 03**

2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වාර්තාව

**තීරණය**

2014 වර්ෂයට අදාල ඇස්තමේන්තුවේ ආදායම් පිළිබඳව කමිටුවේ දැඩි අවධානය යොමු විය. එහි බදු, ඉඩම් විකිණීම් , අත්කරගැනීම් වලට අදාල ආදායම් කැපී පෙනෙන වෙනසක් ඇති බැවින් එය සමස්ථ ඇස්තමේන්තුවට බලපාන බව , ඒ අනුව එම කරුණු පිළිබඳව දැඩි අවධානය යොමුකර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල අධ්‍යක්ෂවරුන් සමග සාකච්ඡා කර සංශෝධන අවශ්‍ය වන්නේ නම් සංශෝධන සමග අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම නිර්දේශ කරමි.

**වෙනත් කරුණු**

01. විශේෂයෙන්ම ආදායම් ලැබීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් සමග මාසිකව සාකච්ඡා කිරීම අත්‍යාවශ්‍ය බව විගණන කමිටුව නිරීක්ෂණය කරයි.

02. භාණ්ඩාගාර නිලධාරිණිය විසින් අංක පීඑඩී/2/2013 චක්‍රලේඛනයට අවධානය යොමුකරන ලදී.

මීළඟ විගණන හා කළමණාකරන කමිටු රැස්වීම 2013.10.28 දින ප.ව.2.30 ට පැවැත්වීමට තීරනය විය.

| | |
|---|---|
| සභාපති | ලේකම් |
| විගණන හා කළමණාකරණ කමිටුව | විගණන හා කළමණාකරණ කමිටුව |

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| එම්.ඒ.එස්.වීරසිංහ මහතා | - සාමාජික | |
| එම්.ආර්.ආර්. මල්ලව මිය | - නිරීක්ෂක | |
| එම්.අනෝමා නන්දනී මිය | - සාමාජික | |
| සෙනරත් වනිගතුංග මහතා | - | |
| ශ්‍යාමලී රත්නායක මිය | - | |
| ජේ.ඩබ්.හපුආරච්චි මයා | - | |
| කුමුදු ධර්මප්‍රිය මයා | | |

**<u>2013.11-06 වැනිදින ප.ව.2.30 ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවති 2013 වර්ෂයට අදාල 03වැනි විගණන කමිටු රැස්වීම් වාර්තාව</u>**

*පැමිණීම :*

01. පී.ඩබ්.සේනාරත්න මහතා - සභාපති
02. එම්.ඒ.එස්.වීරසිංහ මහතා - සාමාජික
03. එම්.අනෝමා නන්දනී මිය - සාමාජික
04. එම්.ආර්.ආර්.මල්ලව මිය - නිරීක්ෂක
05. වී.නරේන්ද්‍රනාදන් මයා - ලේකම්
06. සෙනරත් වනිගතුංග මයා
07. ශ්‍යාමලී රත්නායක මිය
08. ජේ.ඩබ්.හපුආරච්චි මයා
09. කුමුදු ධර්මප්‍රිය මයා

ප්‍රථමයෙන්ම පසුගිය කළමණාකරන කමිටුවේදී සාකච්ජාවට බදුන් වූ කරුණු පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>2013.06.11 දින පැවැති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය</u>**

01. i. **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම් තහවුරුකර නොමැති කම නිසා වන්දි ගෙවීමට නොහැකිවීම.**

අදාල වාර්තාව අධ්‍යක්ප තක්සේරු හා වන්දි විසින් අද දින ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ගොනු 104 ක් පිළිබඳ විස්තර ලේඛණ ගත කර 2013.11.05 දින නීති උපදේශක වෙත යොමු කර නිර්දේශ ලබාගෙන ඇත. එම නිර්දේශ කමිටුව වෙත ඉදිරිපත්කර ඇත.

ඒ අනුව . නීති උපදේශක විසින් ලබා දී ඇති අවසාන නිර්දේශය එනම්, සති 03 ක් ඇතුලත ඉඩම් හදුනාගෙන අයිතිවාසිකම් කියන කවරෙකු හෝ පිළිබඳව විස්තර වාර්තාවක් එවන ලෙස දැනුම් දෙන මෙන් දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත, අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි වෙත උපදෙස් දෙන ලදී.

ii වන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටීම.

යැවූ ලිපි 25 ට එකම පිළිතුරක්වත් ලැබී නැත. ඒ අතර ලිපි කිහිපයක් ආපසු ලැබී ඇත. එහෙයින් මෙම 25 දෙනා සම්බන්ධයෙන් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්ගෙන් විමසා අනතුරුව තවදුරටත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

iii **භුක්තිය භාරගැනීමේ සහතික නොමැතිවීම.**

දැනට අදාල ලේඛනය සකස් කර අවසන්කර ඇති අතර. එම ගොනු තාවකාලිකව අක්‍රිය ගොනු බවට පත් කිරීම සඳහා කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී.

iv **ප්‍රකාශකයින් වෙත යවන ලද වන්දි ප්‍රදාන ලිපියට අනුමැතිය දී නොඑවීම හා වවුචර් පත් අත්සන් කර භාරනොදීම**

අවශ්‍ය නැත

v **වෙනත් හේතු - ලිපිගොනු සංඛ්‍යාව 26**

තවදුරටත් මේ පිළිබඳ ක්‍රියා කරගෙන යන බවත්, නිම වූ වහාම ප්‍රකාශ කරන බවත් අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි වාර්තා කරයි.

vi **ගැසට් නිවේදන පලකොට වන්දි තීරණය කිරීම සඳහා වැඩ කරමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව 200**

දැනට ක්‍රියාකරමින් පවතී.

vii **වන්දි ගෙවීමට අදාලව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව 670**

දැනට ක්‍රියාකරමින් පවතී

02. **වැටි බද්ද ලියාපදිංචි කිරීම හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ජා කිරීම**

මේ පිළිබඳව 2013.10.28 දින අධ්‍යක්ෂ ජනරාල් . රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති වෙත ලිපියක් යවා ඇති අතර. පිළිතුරු ද බලාපොරොත්තුව සිටී. පසුව ප්‍රගතිය වාර්තා කරන බව දන්වන ලදී.

03. දිස්ත්‍රික් කාර්යාල මගින් ලැබෙන විවිධ ආදායම් වැඩි දියුණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම

මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කර ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් යෝජනාවක් ඊළඟ කමිටු රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ලේකම්, අධ්‍යක්ෂ/කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන , අධ්‍යක්ෂ/උපරිම සීමා වෙත උපදෙස් දෙන ලදී.

04. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා මසකට රු. 330000/- ගෙවල් කුලී ගෙවීමට සිදුවී ඇති අතර අලුත් ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ සාකච්ඡා කිරීම.

ඉඩමක් සොයමින් පවතී.

05. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු 307 ක ප්‍රමාණයක් අනුමතකර එවා ඇති අතර ඉතිරි පිරිස අනුමත කර ගැනීමට සාකච්ඡා කළ යුතු බව තීරණය විය. කළමනාකරන සේවා අංක 30 අනුව සේවකයින් සියලූ දෙනා අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සිදුකර වැටුප් සකස් කිරීමට කටයුතු කර ඇත.

දැනට කටයුතු කරමින් පවතී.

06. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංචිතයේ ඇති වාහන හා දිස්ත්‍රික් කාර්යාල වලට ආදායම් වැඩිකර ගැනීමසඳහා ලබාදුන් වාහන වෙනුවෙන් නඩත්තුවට අධික මුදලක් වැය වන බවත්, පසුගිය වකවානුවේ සිදු වූ වාහන අනතුරු පිළිබඳවත් වාහන ගාල් කිරීම වාහන පුද්ගලික පාවිච්චිය සම්බන්ධව සාකච්ඡා කිරීම.

මේ පිළිබඳ තවදුරටත් සොයා බලා ඊළඟ කමිටු වාරයට අධ්‍යක්ෂ/කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන වෙත උපදෙස් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් වාහන නඩත්තු පිළිබඳ ශිල්පීය දැනුම ඇති රාජ්‍ය නිලධාරියෙකු වෙත යොමුකර නිර්දේශ ලබා ගැනීමට ඇති හැකියාව සොයා බලා නිර්දේශ හෝ කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ/කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන වෙත දන්වන ලදී.

07. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ණයගැතියන් පිළිබඳ රජයේ ආයතන හා පෞද්ගලික ආයතන සම්බන්ධයෙන් ගතයුතු නීතිමය පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

ලේඛනයක් සකසමින් පවතී.

08. වෙනත් කරුණු

අදාල කරුණ පිලිබඳව අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ සැලසුම් දෙපාර්තමේන්තුව 2013.10.01 දින ලිපියක් යොමුකර ඇත. නමුත් එම ලිපිය අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු බව පෙන්වා දෙන ලදී.(අධ්‍යක්ෂ/මුදල්)

i තවදුරටත් මෙම ලිපියෙන් ඉල්ලා ඇත්තේ අදාල කාර්ය සඳහා අනුමැතියක් හෙයින් , එසේ මුදල් ආයෝජනය කල අවශ්‍යතාවය දක්වා එක් එක් අයෝජන සඳහා වෙන වෙනම ලබා ගැනීම සඳහා උපදෙස් දෙන ලදී.

2013.11.06 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ තීරණ

01. දිස්ත්‍රික් කාර්යාල විගණනය කිරීම

දැනටමත් මේ පිලිබඳ අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර , එය ක්‍රියාත්මක වීම පිලිබඳ ප්‍රශ්න ඇති බව පෙනී යයි. මේ පිලිබඳව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකට උපදෙස් දෙන ලදී. ඉන් අනතුරුව ඊළග කමිටුවේ සලකා බැලීම සඳහා

02. ඉලක්කගත ආදායම් සෙවීම

මේ අවස්ථාවේදී අධ්‍යක්ෂ/ආදායම් විසින් වාර්තාවක් ඉදිරිපත් කරමින් සමස්ත බදු ලිපිගොනු 290 ක් ඇති බවත් , එයින් දැනට බදු අය කරගනු ලබන්නේ 202 කින් පමණක් බවත්, 88 කින් දැනට බදු අය නොවන බවත් පෙන්වා දෙන ලදී.

මෙම අවස්ථාවේදී බදු ගිවිසුමේ ඇති අඩුපාඩුකම් ද පෙන්වා දෙන ලදී. ඒ අනුව එම කරුණු ඇතුලත්කර කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත්කර නිර්දේශයන් හා අනුමැතිය ලබා ගැනීමට තීරණය විය.

03. නීති වියදම් අවම කිරීම

නීති නිලධාරි සමග ඉදිරි විගණන හා කළමණාකරන කමිටුවේදී සාකච්ජා කිරීමට තීරණය විය.

04. සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.

මේ පිලිබඳ භාණ්ඩාගාර නියෝජිතවරිය විසින් වෙනත් ආයතනයක සංයුක්ත සැලැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම ආදර්ශ කෘතියක් ඉදිරිපත් කල අතර ඒ අනුව එය අධ්‍යනය කර අවශ්‍ය කරුණු පමණක් ගෙන සකස් කිරීමට අධ්‍යක්ෂ කළමණාකරන හා මානව සම්පත් සංවර්ධන වෙත උපදෙස් දෙන ලදී.

වෙනත් කරුණු:-

- කොමිෂන් සභාවේ ලේකම් විගණන හා කළමණාකරන කමිටුවේ ලේකම් විය යුතු බව භාණ්ඩාගාර නියෝජිතවරිය විසින් පෙන්වා දෙන ලදී.
- ඊළග විගණන හා කළමණාකරන කමිටුවට නීති අංශය, ඔප්පු අංශයේ අධ්‍යක්ෂ අත්‍යාවශ්‍ය බව අවධාරනය කරන ලදී.

මේ අවස්ථාවේදී බඳු ගිවිසුමේ ඇති අඩුපාඩුකම් ද පෙන්වා දෙන ලදී. ඒ අනුව එම කරුණු ඇතුලත්කර කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත්කර නිර්දේශයන් හා අනුමැතිය ලබාගැනීමට තීරණය විය.

මීළග විගණන හා කළමනාකරන කමිටු රැස්වීම 2013.12.19 දින ප.ව.2.30 ට පැවැත්වීමට තීරණය විය.

| | |
|---|---|
| ............................................ | ............................................ |
| සභාපති | ලේකම් |
| විගණන හා කළමණාකරණ කමිටුව | විගණන හා කළමණාකරණ කමිටුව |

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| එම්.ජේ.එස්.වීරසිංහ මහතා | සාමාජික | .............................. |
| එම්.ආර්.ආර්. මල්ලව මිය | නිරීක්ෂක | .............................. |
| එම්.අනෝමා නන්දනී මිය | සාමාජික | .............................. |
| සෙනරත් වනිගතුංග මහතා | | .............................. |
| ශ්‍යාමලී රත්නායක මිය | | .............................. |
| ජේ.ඩබ්.හපුආරච්චි මයා | | .............................. |
| කුමුදු ධර්මප්‍රිය මයා | | .............................. |

6

2013.12.19 වැනිදින ප.ව.2.30 ට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේදී පැවති 2013 වර්ෂයට අදාල 04 වැනි විගණන කමිටු රැස්වීම් වාර්තාව

පැමිණීම :

| | | | |
|---|---|---|---|
| 01. | පී.ඩබ්.සේනාරත්න මහතා | - | සභාපති |
| 02. | එම්.ඒ.එස්.වීරසිංහ මහතා | - | සාමාජික |
| 03. | එම්.අබේපාල නන්දනී මිය | - | සාමාජික |
| 04. | එම්.ආර්.ආර්.මල්ලව මිය | - | නිරීක්ෂක |
| 05. | පී.නරේන්ද්‍රනාදන් මයා | - | ලේකම් |
| 06. | සෙනරත් වනිගතුංග මයා | | |
| 07. | ශ්‍යාමලී රත්නායක මිය | | |
| 08. | ජේ.ඩබ්.හපුආරච්චි මයා | | |
| 09. | කුසුම් [illegible] මිය | | |

ප්‍රථමයෙන්ම පසුගිය කළමණාකරන කමිටුවේදී සාකච්ජාවට බඳුන් වූ කරුණු පිළිබඳ ප්‍රගතිය කමිටු සභාපති විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 2013.06.11 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ ප්‍රගතිය

01. i. **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් ප්‍රකාශකයින්ගේ හිමිකම තහවුරුකර නොමැති කම නිසා වන්දි ගෙවීමට නොහැකිවීම.**

මීට අදාල ලිපිය දැනට සකස්කර ඇති අතර එය ඉතා ඉක්මනින් දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත යවා පිළිතුරු ලබා ගැනීමට අපෙක්ෂිත බව අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි දැණුම් දෙන ලදී.

ii **වන්දි වෙනුවට හුවමාරු ඉඩම් ඉල්ලා සිටීම.**

අදාල පුද්ගලයින් වෙත නැවත ලිපි යවා ඇති අතර ඒ සඳහා දින 30 ක් ඇතුලත පිළිතුරු නොලද හොත් උසාවියේ තැන්පත් කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට තීරණය විය.

iii ඉක්තිය භාරගැනීමේ සහතික නොමැතිවීම.

දැනට කොමිෂන් පත්‍රිකාව සකස් කරමින් පවතී.

iv ප්‍රකාශකයින් වෙත යවන ලද වන්දි ප්‍රදාන ලිපියට අනුමැතිය දී නොඑවීම හා වවුචර් පත් අත්සන් කර භාරනොදීම

අවශ්‍ය නැත

v වෙනත් හේතු - ලිපිගොනු සංඛ්‍යාව 26

මෙම ලිපිගොනු සංඛ්‍යාවට අදාල වැඩි ගොනු ප්‍රමාණයක් වන්දි මුදල් වෙනුවට විකල්ප ඉඩම් ලබාදීම සඳහා ඉඩම් උපරිම සීමා අංශයට යොමුකරන ලද ගොනුවේ දැනට ඉඩම් උපරිම සීමා අංශයෙන් මේ පිළිබඳ විමසා ඇති අතර ඒ සඳහා ඉක්මනින් පිළිතුරු ලබාගෙන ඉදිරි පියවර ලබාගැනීමට කටයුතු කරන බව අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි විසින් උපදෙස් දෙන ලදී.

vi ගැසට් නිවේදන පලකොට වන්දි තීරණය කිරීම සඳහා වැඩ කරමින් පවතින ලිපිගොනු සංඛ්‍යාව 200

මෙම ගොනු සංඛ්‍යාවෙන් නිශ්චිත ගොනු ප්‍රමාණයක් බැගින් රුගෙන නිම කර වරින් වර කොමිෂන් පත්‍රිකා මගින් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ තක්සේරු හා වන්දි උපදෙස් දෙන ලදී.

vii වන්දි ගෙවීමට අදාලව පනතේ 29 වන වගන්තිය යටතේ ගැසට් නිවේදන පල කිරීමට ඇති ලිපිගොනු සංඛ්‍යාව 670

දැනට ක්‍රියාකරමින් පවතී. අධීක්ෂණයක් කොට මෙම කටයුතු නිම කරන ලෙස ලේකම්තුමාට උපදෙස් දෙන ලදී.

02. වැටි බද්ද ලියාපදිංචි කිරීම හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම

නැවත සිහිකැඳවීම් යැවීමට තීරණය විය.

03. දිස්ත්‍රික් කාර්යාල මගින් ලැබෙන විවධ ආදායම් වැඩි දියුණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම

අදාල වාර්තාව අභ්‍යන්තර විගණක විසින් මීලග රැස්වීම් වාරයට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා මසකට රු. 30000/ ගෙවල් කුලී ගෙවීමට සිදුවී ඇති අතර අලුත් ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ සාකච්ඡා කිරීම.

මේ පිලිබඳ තවදුරටත් ක්‍රියා කිරීමට අධ්‍යක්ෂ ජනරාල්තුමිය වෙත පවරන ලදී.

05. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පරිපාටිය සම්බන්ධයෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු 307 ක ප්‍රමාණයක් අනුමතකර එවා ඇති අතර ඉතිරි පිරිස අනුමත කර ගැනීමට සාකච්ඡා කළ යුතු බව තීරණය විය. කළමනාකරන සේවා අංක 30 අනුව සේවකයින් සියලු දෙනා අන්තර්ග්‍රහන ක්‍රියාවලිය සිදුකර ටැටුප් සකස් කිරීමට කටයුතු කර ඇත.

දැනට කටයුතු කරමින් පවතී.

06. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංචිතයේ ඇති වාහන හා දිස්ත්‍රික් කාර්යාල වලට ආදායම් වැඩිකර ගැනීමසඳහා ලබාදුන් වාහන වෙනුවෙන් නඩත්තුවට අධික මුදලක් වැය වන බවත්, පසුගිය වකවානුවේ සිදු වූ වාහන අනතුරු පිලිබඳවත් වාහන ගාල් කිරීම වාහන පුද්ගලික පාවිච්චිය සම්බන්ධව සාකච්ඡා කිරීම.

කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බව අධ්‍යක්ෂ/කළ.හා මා.සම්.සංවර්ධන ප්‍රකාශකරන ලදී.

07. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ණයගැතියන් පිලිබඳ රජයේ ආයතන හා පෞද්ගලික ආයතන සම්බන්ධයෙන් ගතයුතු නීතිමය පියවර සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.

ලේඛනයක් දැනට සකස්කර ඇති බවත් මීළග කමිටු වාරයේදී ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

<u>2013.09.17 දින පැවති විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී</u> සාකච්ඡාවට බඳුන් වූ පත්‍රිකා

01. කොමිෂන් සභා නිලධාරීන්ගේ පාරිතෝෂිත මුදල් ගණනය කිරීම

\-

02. ඉඩම් උපරිම සීමා අංශයට අදාල නීතිමය බැඳීම් සඳහා ලේඛනගත තොරතුරු ලබාදීම.

අධ්‍යක්ෂ/ඉඩම් උපරිම සීමා විමසා කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී.

03. 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වාර්තාව

\-

දැනට දිස්ත්‍රික් කාර්යාල 08 ක කටයුතු කර ඇති බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් දැණුම් දෙන ලදී. එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවිය යුතු බව ද දැණුම් දෙන ලදී.

<u>2013.11.06 දින පැවති විගණන හා කළමණාකරන කමිටුවේ තීරණ</u>

01. දිස්ත්‍රික් කාර්යාල විගණනය කිරීම.

දැනට දිස්ති5ක් කාර්යාල 08 ක කටයුතු කර ඇති බව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් දැණුම් දෙන ලද. එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත යැවිය යුතු බව ද දැණුම් දෙන ලදී.

**02. ඉලක්කගත ආදායම් සෙවීම**

මෙම කරුණු අධ්‍යක්ෂ/ආදායම් වෙත යොමුකර මීළඟ වාර්තාව ලේකම්තුමා වෙත යොමුකරන ලෙස උපදෙස් දෙන ලදී.

**03. නීති වියදම් අවම කිරීම**

මෙම කරුණ පිළිබඳව වැ.බ. නීති අධ්‍යක්ෂතුමා විසින් දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන ලදී. තවදුරටත් කරුණු ඉදිරිපත් කිරීමට මීලග කමිටුවට යොමුකරන ලෙසද උපදෙස් දෙන ලදී.

04. සංයුක්ත සැළැස්ම හා ක්‍රියාත්මක සැලැස්ම සැකසීම.

<u>2013.12.19 දින පැවති විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී සාකච්ඡාවට බදුන් වූ පත්‍රිකා</u>

**01. 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව සාකච්ජා කිරීම.**

මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ජා කර ඇතත් ආයතනික ව්‍යුහය තවදුරටත් ක්‍රමවත් කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ඒ ඒ අංශ වෙත ලබාදීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්තුමිය වෙත උපදෙස් දෙන ලදී.

ඒ අනුව එසේ දැණුවත් කර ගත්තා ලද තීරණ පිළිබඳ කොමිෂන් පත්‍රිකාවක් සකස්කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්තුමිය වෙත උපදෙස් දෙන ලදී.

වෙනත් කරුණු :

භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 55 ට අනුව විගණන හා කලමණාකරන කමිටුව පත් කිරීමේදී කමිටුවේ කාර්යභාරය පිළිබඳව නිශ්චිතව කොමිෂමට දැක්විය යුතු බව ලේකම්තුමාට දන්වන ලදී.

සභාපති

විගණන හා කලමණාකරණ කමිටුව

ලේකම්

විගණන හා කලමණාකරණ කමිටුව

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| එම්.ජ්.එස්.වීරසිංහ මහතා | සාමාජික | |
| එම්.ආර්.ආර්. මල්ලව මිය | නිරීක්ෂක | |
| එම්.අනෝමා නන්දනී මිය | සාමාජික | |
| ආචාර්ය එච්.එම්.එස්.ජයතුංග මිය | | |
| ටී.නරේන්ද්‍රනාදන් මයා | | |
| ශ්‍යාමලී රත්නායක මිය | | |
| කුසුම් හේරත් මිය | | |